ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ ජනවාරි 25 ඉරිදා 149 වෙළුම 34 කලාප සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජූනි 07

ඥානාර්ථ ප්‍රදීපය

POPE FRANCIS Sri Lanka 2015

# ශ්‍රී ලංකාවේ අන්තර් ආගමික සුහදතාවය මගේ සිත පැහැර ගත්තා

## අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් ගුවන් යානයේ දී පවසයි

ශිරාන් මෛත්‍රී විසිනි

**ශ්‍රී ලංකාවේ විවිධ ආගමිකයන් සිය ආගමික විශ්වාසයන්, ඇදහිලි, පිළිවෙත් අනුගමනය කරමින් සෙසු ආගම් වලට සහ ඒ ඒ ආගමිකයන්ටත්, ආගමික විශ්වාසයන්ටත්, පිළිවෙත් වලටත් ගරු කරමින් කටයුතු කරන අන්දම මගේ සිත පැහැර ගත්තා. මඩු සිද්ධස්ථානයේ දී මා දුටු එක් දෙයක් ගැන මා මීට පෙර කිසි දවසක කල්පනා කළේ නැහැ. කතෝලිකයන් සමග සෙසු ආගමිකයන් වන හින්දු, මුස්ලිම්, බුදුනු ජන කොටස් එහි යමින් ස්වකීය අවශ්‍යතා වෙනුවෙන් එකට යදිමින් දේව වරප්‍රසාද ලබා ගැනීමට සමත් වීම ආගමික සමගියට මෙන්ම සංහිඳියාවටත් කදිම සලකුණක් යැයි අති උත්තම ප්‍රැන්සිස් සසුනිසුරාණෝ කටුනායක සිට මැනිලා නුවර බලා ගුවනින් ගමන් කරන අතරවාරයේ දී යානයේ සිටි මාධ්‍යවේදියකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් පැවසීය.**

ඉකුත් 15 වැනිදා ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් A340 ගුවන් යානයකින් මැනිලා නුවර බලා යන අතරවාරයේ දී ශුද්ධෝත්තම පියතුමා මාධ්‍යවේදීන් සමග පැවැත් වූ පුවත්පත් සාකච්ඡාවේ දී මේ බැව් පළ කළේ ය. සුදුතුම් පියතුමා ශ්‍රී ලංකාවෙන් සමුගෙන යන්නට මොහොතකට පෙර එතුමන්ගේ ටුවිටර් ගිණුමේ ඉංග්‍රීසි, සිංහල සහ දමිළ භාෂාවලින් මෙසේ ලියැවී තිබිණ. “දෙවියන් වහන්සේගේ ආශිර්වාදයත්, ආරක්ෂාවත් ශ්‍රී ලංකාවට ලැබේවා!”

15 පිටුවට

## රාජකාරී කටයුතු බාර ගැනීමේ උත්සවය අගරදගුරු මැදුරු ශ්‍රවණාගාරයේ දී

මොරිස් නානායක්කාර විසිනි

ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ධුරයේ නිල වශයෙන් රාජකාරි කටයුතු භාර ගැනීමේ උත්සවය 2015 ජනවාරි මස 26 වන සඳුදා පෙ.ව. 10.00 ට කොළඹ අගරදගුරු මැඳුරු ශ්‍රවණාගාරයේ දී අගරදගුරු කාදිනල් හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් අනෙකුත් රදගුරු හිමිපාණන්, ගරු අනුනායක හිමිපාණන්, ගරු පියවරුන්, පැවිදි සොයුරියන් ඇතුළු මහජන නියෝජිතයින් තානාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට තීරණය කරන ලදි. සියලුම ගරු පූජාප්‍රසාදින් වහන්සේට, සහෝදරතුමන්ට හා ගරු පැවිදි සොයුරියන්ට ද මෙම අවස්ථාවට සහභාගි වන ලෙස ද ගෞරවයෙන් ආරාධනා කර සිටී.

**සුදුතුම් පියාණන් ගාලුමුවදොර පිටියේ පැවැත්වූ දිව්‍ය පූජා යාගය 25 ඉරිදා (අද) දහවල් 1.00 සිට ප.ව. 3.00 දක්වා ජාතික රූපවාහිනියෙන් නැවත විකාශය වන බව වැඩසටහන් සම්පාදක රංජුල සේනාධීර මහතා ප්‍රදීපයට පැවසීය.**

## අගරදගුරු කාදිනල් හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබා ගනිමින්...



මොරිස් නානායක්කාර විසිනි

නව රජයේ මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍ය ජෝන් ඒ. ඊ. අමරතුංග මහතා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් බැහැදුටුවේය.

කොළඹ අගරදගුරු මැදුරේ විශේෂ අමුත්තන් පිළිගැනීමේ ශාලාවේ දී මෙම හමුවීම සිදු වූ අතර හයසින්ත් අමරතුංග මහත්මිය ද මෙම ව්‍යවස්ථාවට සහභාගි වූවාය. පැයකට ආසන්න කාලයක් පුරා මෙම හමුව පැවති අතර අප රටේ සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ ඉතා වැදගත් වූ කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් අදහස් හුවමාරු කර ගන්නා ලදි.

## කිතුනු එකමුතු සතිය 2015

**කිතුනු එකමුතු සතිය මුල්කොට කතෝලික සභාව හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය ඒකාබද්ධව පවත්වන යැදුම් මෙහෙය වැල්ලවත්ත මුවර් විදියේ මෙතෝදිස්ත දේවස්ථානයේ දී 25 ඉරිදා (අද) සවස 5.00 ට සිදුවන බව ගරු සංජීව මෙන්ඩිස් පියතුමාගේ හා එබනේසර් ජෝශප් දේවගැතිතුමාගේ අත්සනින් යුත් නිවේදනයෙන් පවසා සිටී.**

## මරිය හමුදා කොඩි සතිය

**ලංකා අප ස්වාමිදුගේ කොම්ට්සියම් සභාවේ නව අවුරුදු වැඩසටහන යටතේ ජනවාරි 24 සෙනසුරාදා සිට පෙබරවාරි 01 ඉරිදා දක්වා කොඩි සතියක් පැවැත්වීමට තීරණය කර ඇති බැවින් සියළු මරිය භටයින් භට එකී කොඩි අලෙවි කිරීමට මීසම් සේවක පියතුමන්ගේ කාරුණික අවසරය ලබා දෙන මෙන් කොම්ට්සියම් සභාවේ ලේකම් බෙනී ජයමාන්න සහෝදරයා ඉල්ලා සිටී.**

Verbum Television ප්‍රථම කතෝලික රූපවාහිනී නාලිකාව

ජනවාරි 30 දින සවස 4.30 සිට සජීවීව PEO TV සහ Dialog TV තුළින් ඔබ වෙත ගෙන එනු ලබයි.

Verbum Television

# ලෝකයේ වැඩිම ජනතාවකගේ ආධ්‍යාත්මික නායකයා මෙරටට පිළිගන්නට අපටත් අයිතියක් තියෙනවා

**ශුද්ධෝත්තම පාප්වහන්සේ කියන්නේ ලෝකයේ වැඩි කොටසකගේ ආධ්‍යාත්මික නායකයා කතෝලිකයන් වන අප සැමගේ ආධ්‍යාත්මික එඬේරා උන්වහන්සේව මෙරටට පිළිගන්නට අපට අයිතියක් තියෙනවා. යැයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

අගරදගු රු හිමි එසේ ප්‍රාකශ කළේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්ථමේන්තුවේ මුද්දර කාර්යාංශය විසින් 2014 නත්තල සැමරීමට තැපැල් මුද්දර යුගලය හා මුල් දින කවරය නිකුත් කිරීම වෙනුවෙන් මීගමුව ශාන්ත මරියා දේවස්ථානයේ පැවති උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගිවෙමිනි.

හිටපු තැපැල් අමාත්‍ය ජීවන් කුමාරතුංග මහතා නත්තල් තැපැල් මුද්දර යුගලය සමග මුල් දින කවරය අගරදගුරු හිමිපාණන්ට පිරිනැමූ අතර හිටපු වැඩබලන ධීවර අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතාද අගවිනිසුරු මෝහන් පීරිස් මහතාද මේ අවස්ථාවට එක්වූහ. මේ උත්සවයට උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා ඇතුළු පියවරුද පැවිදි සොහොයුරියන්ද තැපැල් පති රෝහණ අබේරත්න මුද්දර කාර්යාංශයේ අධ්‍යක්ෂ ටී. ශ්‍රීධරන් යන මහත්වරුද එක්වූහ.



**මීගමුවේ රේමන් අපෝන්සු**

# වෙන්නප්පුව ශු. ජුසේ වාස් මුනි මංගල්‍යය ජනවාරි 30 ද

ශුද්ධවරයට ඔසවනු ලැබූ ශු. ජුසේ වාස් මුනිතුමන් නමින් මෙරට පිහිටුවා තිබෙන එකම විද්‍යාලය වන වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලයේ වාර්ෂික මංගල්‍යය ජනවාරි 30 පෙ.ව. 8.00 ට හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

මෙතෙක් ජෝශප් වාස් විද්‍යාලය නමින් හැඳින්වූ මෙහි නම සාන්ත ජෝශප් වාස් විද්‍යාලය ලෙස නම් කිරීමටද නියමිතය. වාර්ෂික මංගල්‍යයට සමගාමීව ලුණුවිල සහ මාරවිල රජයේ රෝහල්වල ප්‍රතිකාර ගනු ලබන දිළිඳු රෝගීන්ට වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දීමක්ද සිදු කැරේ. වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලයේ විදුහල්පති ගරු ප්‍රියංජීව ගුණරත්න පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් සියලු කටයුතු සංවිධානය කරයි.

**ප්‍රියන්ත පීටර්ස්**



**කටුවපිටිය මීසමේ සාන්ත වින්සෙන්තිද පාවුලා සමිතිය මගින් මීසම් සේවක ගරු ශ්‍රී ලාල් පොන්සේකා පියතුමාගේ ප්‍රධානත්වයෙන් දිළිඳු පවුල් 50 කට වියළි ආහාර පාර්සල් පරිත්‍යාග කරන ලදි.**

**සේයා - ඇග්නස් සියඹලාපිටිය**

# පවුල් වසර තුළ දේව සේවයට පවුලකින් එක් දරුවකු කැප කරන්න

මහනුවර ජාතික දෙව්සත්හලේ දර්ශන පීඨයේ ආචාර්ය ගරු සිරිල් ජෝශප් පියතුමාගේ පූජකවරයේ පනස් වසර සමරමින්, පැවැති ස්වර්ණ ජයන්ති දිව්‍ය පූජාව හංවැල්ල මීසම් පූජක පුතුන්ගේ සහ බැතිමතුන්ගේ සහභාගිත්වයෙන්, නිරිපොල කානික්ක දේව මාතා දේවස්ථානයේදී පැවැත්වුනි.

දිව්‍ය පූජාවේ දේශනය කළ සාන්ත පීතර විදුහලේ ආචාර්ය ගරු ක්‍රිස්පින් ලියෝ පියතුමා ඉල්ලා සිටියේ පවුල් වසර තුළ පවුලකින් දරුවකු දේව සේවයට කැපකරන ලෙසයි.

මේ උත්සවය හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස්, සහයක ගරු රෝෂාන් චමින්ද පියවරුන්ගේ මගපෙන්වීමෙන් නිරිපොල සභාව විසින් සංවිධානය කර තිබුණි.

**ඇන්තනි හෙට්ටිආරච්චි**



**හලාවත පදවියේ දිව්‍ය හෘදය සංසදයේ උල්හිටියාව මීසමේ කඩවත දේවස්ථානයේ නව සමාජිකයින් පිරිස ලාංඡන ලබා ගැනීමෙන් පසුව මීසම් සහයක ගරු ඇන්ටන් නිරෝෂන් ගුරුසිංහ පියතුමා සහ පදවි ආත්මික අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් පියතුමා සමග ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු.**

**ශාලිකා රොෂානි**

# බෝලවත්ත දිසාවේ දෙව්මැඳුරු කීපයකට එකම දිනයකදී සතුරු උවදුරු

හලාවත පදවියේ බෝලවත්ත දිසාවේ දෙව්මැඳුරු කීපයක ප්‍රතිමාවට හා සත්ප්‍රසාද කූඩුවකටද සන්ක්‍රිස්ති කාමරයකටද හානි සිදුකර ඇත.

නයිනමඩම වික්ෂෝප දේවමාතා දේවස්ථානයේ සාදා තිබූ ගවලෙනේ ජේසු බිළිඳාගේ ප්‍රතිමාව සොරාගෙන ගොස් ඇති අතර, කම්මල දේවස්ථනයේ දිව්‍ය සත්ප්‍රසාද කූඩුවට ගිනි තැබීමට උත්සාහ දරා ඇතත් ආවරණ රෙදිකඩ පමණක් ගිනි ඇවිලී පිළිස්සී ඇත. එහි සන්ක්‍රිස්ති කාමරය තුළ තිබූ අල්මාරි දෙකකට ගිනි තැබීම නිසා එහි තිබූ වටිනා පූජා ඇඳුම් හා පූජා භාණ්ඩ විනාශ වී ඇත. වයික්කාල දේවස්ථානයේ ප්‍රතිමාවක් වෙනත් ස්ථානයක දමා ගොස් තිබී හමුවී ඇත. මෙම සියලු ක්‍රියාවන් එකම දිනයක සිදුකර ඇති බව වාර්තාවේ.

**කේ. නිහාල් ප්‍රනාන්දු**



**රඹුක්කන සා. ඇලෝසියස් මීසම් සංඝය එකමුතුකම පෙරටු කරගෙන විවිධ ප්‍රසංගයක් හා තෑගි බෙදා දීමක් මිසම් සේවක ගරු රොෂාන් තිසේරා පැතුනි පියතුමන්ගේ මූලිකත්වයෙන් සිදුකැරිණ. මෙහිදී ගරු පියතුමා සමග ගැලවීමේ හමුදා කපිතාන් මේජර් ගුණදාස ගිතිකා ගැයුහ. මේ එහි අවස්ථාවකි.**

**අසුන්තා බණ්ඩාර ජයමාන්න**

# ජය පරාජය බෙද හදගන්නට දහම් පාසලෙන් පුහුණුවක්

දහම් ගුරුවරු දහම් පාසලට තම ශ්‍රමය වැය කරන්නේ යමක් බලාපොරොත්තුව නොවේ. ගුණාත්මක දරුවන් බිහිකරන තැනයි දහම් පාසල කියන්නේ. ජීවිතයේ ජීවත්වන මග අප යා යුත- මාර්ගය. ජය පරාජය බෙදාගන්න. මේ සියල්ලට පුහුණුව දෙන්නේ දහම් පාසලෙන් පමණි. බදුල්ල නව මීසම් සේවක ගරු ජූඩ් නිශාන්ත සිල්වා පියතුමා බදුල්ල මීසමේ දහම් පාසල් තිළින ප්‍රදානයේදී පැවසීය.

දූ දරුවන්ගේ නැටුම් ගැයුම්වලින් මේ දිනය අලංකාර විය. ශා. මරියා දහම් පාසලේ දූ දරුවන් 252 ක්ද, දහම් ගුරුවරු 22 ක්ද සිටිති.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**

## ලංකා අප ස්වාමිදු කොම්ට්සියම නව වසරට වැඩ අල්ලයි

2015 උදාවත් සමගම අගරදගුරු ලංකා අපස්වාමිදුගේ මරිය හමුදා කොම්ට්සියම් සභාව ධර්ම විවේකයත් සමගින් වසරේ පළමුවන මාසික රැස්වීම පසුගියදා කොළඹ VI වෙනි පාවුළු මධ්‍යස්ථානයේදී කොම්ට්සියම් සභාවේ ආත්මික අදියුරු සුනිල් වේරගෙ ාඩ ගරු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

මෙදින අගරදගුරු පවුල් සේවා අදියුරු ක්ලොඩ් නෝනිස් ගරු පියතුමා පවුල් වසර හා පැවිදි වසර පාදක කර ගනිමින් ධර්මවිවේක දේශනයක් කළේය.

**බෙනී ජයමාන්න**

# උල්හිටියාවේ 150 ජයන්ති උලෙළ හරසරින් පැවැත්වේ



උල්හිටියාව ශු. ප්‍රැන්සිස් සේවියර් දෙව්මැඳුර ගොඩනංවා වසර 150 ජයන්තිය පසුගියදා පැවැත්වින. ඒ නිමිත්තෙන් වර්ෂයක් පුරා මීසම් ජනතාව සූදානම් කිරීමේ වැඩසටහන් රාශියක් මීසම් සේවක ගරු බෙනට් ශාන්ත සහ සහයක ගරු ඇන්ටන් නිරෝෂන් පියතුමා ඇතුළු සේවක මණ්ඩලය ද එක්ව සංවිධානය කැර තිබිණ.

මහා ධර්ම විවේකය මුල් තැනක් ගත් අතර නිවාසයක් නොමැති පවුලක් සඳහා තනවන ලද ජුබිලි නිවාසය - ජුබිලි මාවත - ජුබිලි දානය - ජුබිලි තොරණ - ජුබිලි නාම පුවරුව - ජුබිලි සඟරාව හා ජුබිලි බිළින්දා ජුබිලි වැඩසටහනට අයත් විය. 150 ජයන්තිය වෙනුවෙන් දෙව්මැඳුර තීන්ත ආලේප කර නව ඉටි පහන් ගෘහයක් ද තනා නිම කෙරින. ජයන්ති මංගල්‍යය සන්ධ්‍යා මෙහෙය අපෝස්තලික තානාපති අති උතුම් පියරේ න්ගුයෙන් වැන්ටොට් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති අතර මංගල දිව්‍ය පූජා මෙහෙය හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත මෙන්ඩිස් හිමිපාණන් ප්‍රමුඛ ගමේ පූජක පුතුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරින.

**ගොඩ්ප්‍රි ගාල්ලගේ**

## දහම් පාසල් ගොඩනැගිල්ලට ආධාර පතා සංදර්ශනයක්

කොරළවැල්ල සාන්ත මයිකල් දෙව්මැඳුරට අයත් දහම් පාසල් පැවැත්වීම සඳහා ඉදිකරගෙන යනු ලබන දහම් පාසල් ගොඩනැගිල්ලේ ඉහල මාලයේ වහලයේ වැඩ කටයුතු වලට ආධාර වශයෙන් හැත්තෑව දශකයේ ප්‍රවීන ගායක ගායිකාවන්ගේ සහභාගිත්වයෙන් සංගීත සංදර්ශනයක් පවත්වන ලදි.

මෙහි විශේෂත්වය කිසිදු අයකිරීමකින් තොරව වාදනය සැපයුවේ මීසමේ තරුණ තරුණියන් වීමයි. මීසම් සේවක ගරු ෂිහාන් ඉන්දික පියතුමාගේ මගපෙන්වීම මත මීසමේ ගොඩනැගිලි කමිටුව සහ තරුණ සමිතිය එකතුව මෙය සංවිධානය කර තිබුණි.

**රොෂාන් පි. ප්‍රනාන්දු**



**නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේදී ප්‍රාදේශිය සභාව විසින් සමගි කැරොල් ප්‍රසංගයක් පවත්වන ලදි. ගරු පියතුමන් පැවිදි සොයුරියන්ද සභා නායකයින්ද එක් එක් සමිති සමාගම්වල සමාජිකයින්ද ඊට සහභාගි වූ අයුරු.**

**ශ්‍රියාංගණී ෆිලීෂියා**



**දුම්මලකොටුව නිර්දෝෂ දේව මාතාවන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගලෝත්සවය නිමිති කරගෙන දළුවෙල හන්දියේ හයවන කොට්ඨාශයේ තරුණ වැඩිහිටි, සහෝදර දායකත්වයෙන් රෙජිෆෝම්, සුදු කොහු උපයෝගි කරගෙන හතරවන වරටත් ඉදිකළ තොරණයි මේ.**

**ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**

ආරම්භය : 1866 ජුනි 07

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා



හෘද සාක්ෂියට ඉඩදීම




ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා

# පුරවැසි කුලකයක පොදු ගුණාකාරය

මෙවර පැවති ජනාධිපතිවරණයේ පොදු වේදිකාව සකස් කළේ පොදු ජනතාවය. සියලු තීරණ තුළ පොදු තීරණය ගැනීමේ අවැසිතාවය පෙන්නුම් කළේ පොදු ජනතාවය. තීරණාත්මක මොහොතක තීරණාත්මක පොදු අරමුණකට පොදු මනස රැගෙන ගියේ පොදු ජනතාවය. ඒ අනුව පොදු වගකීමක් තුළ පොදු බවට පත්ව පොදු සටන් පාඨය නිර්මාණය කළේත් පොදු ජනතාවය.

ඒ අනුව යමින් ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම, නීතියේ පාලනය හා යහපාලනය පවත්වා ගෙන යෑම, දූෂණය හා අල්ලස පිටු දැකීම, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරීම, මිලිටරිකරණයෙන් රට මුදා ගැනීම යනාදිය ජනාධිපතිවරණයේ දේශපාලන වේදිකාවට රැගෙන යාමට කටයුතු කළේ පොදු ජනතා හඬ ශබ්දයයි. බහුතරයක් වූ මධ්‍යම පංතික ජනතාවගේ බුද්ධිමත් වූ ආධ්‍යාත්මික සංවේදිතාවයයි. ආගමික නායකත්වයේ විවිධ කොටස් අතර මෙන්ම ප්‍රබුද්ධ විද්වත් කතිකාවන් හරහාද, එලෙසම එකමුතු කළ බුද්ධිමතුන්ගේ විචාර ශීලි කථා මණ්ඩප හරහාද ශ්‍රී ලාංකේය ජන සමාජයක් ගොඩනඟා ගත හැක්කේ කෙසේද යන්න කථා කළේ අද ඊයේ නොවේ. එහිදි දේශපාලන යාන්ත්‍රණයෙන් ඔබ්බට ගිය ජනසම්මතවාදි වේදිකාවකට ගොඩවන්නට කැඳවූ දැත් අතර විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, බුද්ධිමත් කලාකරුවන්. සමාජ ක්‍රියාධරයින් මෙන්ම මාධ්‍ය තලයේ තරුණ ජවය හා බැඳුනු හඬ ශබ්දයද එකසේ ප්‍රබල විය. බලාධිකාරයක් තුළ පොදු ජනතාවක් නිවහල්ව ගොඩ නොනැගෙන බවට පෙන්නුම් කළ සාධක ප්‍රබලවම සමාජයේ ස්ථාවරව ගොඩනැගෙන්නට විය. මෙය දුටුවෝ සමාජයේ බුද්ධිමතුන්ම වූහ. ඒ පුරවැසි හඬට කන්දුන් දේශපාලන ව්‍යුහයක් වේද. එය බලාත්මක කළ යුතු බවට හතරවටින්ම නැගෙන හඬද බලවත් විය. ජාතිවාදයේ අඳුරු සෙවනැලි නොව, ආගමික මතවාදයන් හි අධිපතිවාදය නොව නමුත් එකට බැඳෙන සවිමත් ජන සමාජයකින් පොදු අවැසිතාවය සොයා එය පණ ගන්වා ලීම අපේ කාලයේම ප්‍රබල සලකුණක් බඳු විය. එහිදි සමාජය දැනුම්වත් කිරීම පිළිබඳව පොදු පුරවැසි කුලක වලින්ම එළියට පැන ක්‍රියාත්මක වීම දේශපාලන පක්‍ෂ දිනවීම හෝ පරාජය කිරීමක් නොවන බවද පොදු ජනතාව අවබෝධ කොට ගෙන තිබීමද මහත්ම අස්වැසිල්ලකි. දේශපාලන මතවාදයන් වුව ශක්තිමත් විය යුත්තේ පොදු ජන න්‍යාය පත්‍රයක අත්‍යවශ්‍ය සාධකයන් කාලයේ සලකුණු සේ හඳුනාගැනීමක් තුළින්මයි. එහිදි වෛරය වපුරන අතීත සලකුණක් නොව මෙත් වඩවන වත්මන් සලකුණක අරුණාලෝකයක් ගැන පිබිදුනු මනසකින් සිතන්නට පොදු ජනතාව එක්තැන් වූයේත් කිසිදු ලාභ ප්‍රයෝජනයක් ගැන, අපේක්‍ෂාවක්ද නොමැතිව බව ඔප්පු කොට ඇත්තේය. ඒ අනුව ශිෂ්‍යයන්, කලාකරුවන්, මාධ්‍යවේදීන්, වෘත්තිය සමිති සමාජිකයින්, වෘත්තිකයන්, විද්වතුන් මෙන්ම සමාජ ක්‍රියාධරයින්ද ස්වෙච්චාවෙන් එකමුතු වීම පොදු අරමුණක් වෙනුවෙන්ම බව පෙන්නුම් කොට හමාරය. දේශපාලනයේ පටු හැඟීම් වලින් නොව ඊට එහා ගිය පුරවැසි කුලකයක පොදු ගුණාකාරයක් දැන් හුවා දක්වා හමාරයි. එයට පුළුල් ජාතික, ආගමික හා දේශපාලනික සම්මුතිවාදයක් රටට අවශ්‍ය බව පෙන්නුම් කර ඇති නිසා ඒ පොදු ගුණාකාරය සොයා තවත් දුර ගමනක් යන්නට විවිධ තලයන් තුළ පොදු වැසියා බලවත් කිරීම තවදුරටත් කළ යුතු බව අවධාරණය කරමු.

එලෙසම නීතියේ ආධිපත්‍ය සුරකිමින් විධායකයේ බලතල ව්‍යවස්ථාදායකය තුළට සුමටව ගමන් කරවීමට සලසවා අධිකරණය ස්වාධීන කරවීමට යෝජිත කොමිෂන් සභා මගින් විධිමත් ක්‍රමවේදයක් බිහිකරන්නට පත්කළ යාන්ත්‍රණය බලවත් වේ නම් එයද පොදු ජන හඬ අවදි කරවන ප්‍රබල ක්‍රියාකාරීත්වයක් වෙනු නොඅනුමානයි. පොදු ජන මතය වන්නේ රටක ජනතාව බුද්ධිමතුන් සේ සලකන රාජ්‍ය යාන්ත්‍රණයක් තුළ මුහු වී කටයුතු කිරීමයි. එහිදි මධ්‍යම පාන්තික පුරවැසි කුලකය අඩු තක්සේරුවට ලක්කරන කුමන හෝ යාන්ත්‍රණයක්, චින්තනයක්, න්‍යාය ධර්මයක් වේද එකී පැවැත්මන්හි බලාත්මක බව ලඝු කරවීමට පුරවැසි විඥානය කෙලෙසින් හෝ කටයුතු කරන බවත්, ජන සම්මතවාදයට පිටින් කටයුතු කරන කවුරුන් හෝ අවබෝධ කරගත යුතු වේ. එම නිසා සාධු ජන රාව තුළින්. ජනතා මණ්ඩප හරහා ජනතා ආධිපත්‍යයක කාහල හඬ නංවන ජනසම්මතවාදය පිටු දකින්නට කවරෙක් හෝ ක්‍රියා කරනවා නම් එකී පුද්ගලයින්, පක්‍ෂ ක්‍රියාකාරින්, චින්තන නිර්මාපකයින්, අවශ්‍යයෙන්ම දත යුතු වන්නේ රටක පුරවැසි කුලකයේ පොදු ගුණාකාරය සවිමත් න්‍යෂ්ටියක් බවට පත්වීම කිසිදු බලපෑමකින් යටපත් කළ නොහැකි බවයි.

(අත්සන)

# මියයතැයි පුන පුනා වෛද්‍යවරුන් කියද්දීත් මව හා දරුවාගේ දිවි රැකදුන් සාන්ත ජුසේවාස් මුනිතුමා

**වන්දනීය ජුසේවාස් තුමා භාග්‍යවරයට ඔසොවන්නට හේතුවූ ජීවමාන සාක්‍ෂිය, ප්‍රාතිහාර්ය වූ ගරු කොස්මේ ජෝශප් වාස් කොස්ටා පියතුමාගේ උපත හා බැඳි විස්මිත සිදුවීම් ජාලය දිව්‍යමය මැදිහත්කම පිළිබඳව, සාන්ත ජුසේවාස් මුනිඳුන් පිළිබඳව බැතිය වඩන්නටත් මහෝපකාරීවේ.**

ගරු කොස්මේ කොස්ටා පියතුමා ගෝව වැසියකු වන අතර එතුමන්ගේ මව වූ කුවිටීරියා ඩි නොරොන්හා කොස්ටා මහත්මිය ප්‍රසූත කළ පළමු දරුවා උපත ලබා පැය හයකට පසු මිය ගියේය. නියමිත කාලයට පෙර උපත ලද මේ මරණයෙන් පසු ඒ කාන්තාව නැවත වරක් පිළිසිඳ ගත්තාය. දැරියක ප්‍රසූත කළ ඒ මව බරපතල ලෙස නොනවත්වා ලේ ගලායෑමේ අවස්ථාවකට මුහුණ පෑ නමුත් බරපතල තත්ත්වයෙන් රෝහල් ගතවී ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු සුවපත් වූවාය.

ඉන්පසු තෙවතාවක් කුවිටීරියා ඩි නොරොන්හා කොස්ටා නම් මේ මාතාව ගැබ් ගත්තද තෙවරම ගබ්සා විය. මේ නිසාම ඇය බලවත් වේදනාවට පත්වූයේ පිරිමි දරුවකු ගැන ඇය සිහින මවමින් සිටි නිසාය. මේ අතර ඇයගේ ඥාති සොයුරියකගේ පුතකු පූජකවරය ලබා සිටි අතර ඒ පියතුමා සෙන්කෝලේ සේවයකරද්දී එහි ජනතාව ජුසේ වාස් පියතුමාගේ මධ්‍යස්ථකමින් පිහිටාධාර ලබන ආකාරය දැක, ඒ ගැන සිය නැන්දණියට කීවාය. ඒ අනුව කුවිටීරියා ඩි නොරොන්හා කොස්ටා මහත්මියගේ සිතට මෙය තදින් කා වැදුණාය. ඇය සිය පවුලට පිරිමි දරුවකු ලබාදෙන්නට මැදිහත් වන්නැයි ජුසේ වාස් පියතුමාට නොකඩවා යාච්ඤා කරන්නට පටන් ගත්තාය.

ඇය මෙසේ යාච්ඤා කරන්නට පටන්ගෙන මාසයක් ඉකුත් වීමට පෙර නැවතත් ගැබ් ගත්තාය. දරු ගැබට සිවු මසක් කල් පිරෙද්දී ඒ මාතාවට රුධිරය වහනය වන්නට පටන් ගත් නිසා වහාම රෝහල් ගතකළ අතර වෛද්‍යවරුන් අනතුරු ඇඟවූයේ දරුගැබ ගබ්සාවකට ලක්වන්නට ඉඩ ඇති බවයි. මීට පෙර දරුවන් තිදෙනකුගේ දරු ගැබ් ගබ්සා වූ ආකාරයටම ඉතා නුදුරේදී සිවුවන දරුගැබද ඇයට අහිමි වී යනු ඇතැයි වෛද්‍යවරු අනතුරු ඇඟවූහ.

එහෙත් ඉතා බැතිමත් කතෝලික කාන්තාවකවූ කුවිටීරියා කොස්ටා මහත්මිය දැඩි භක්තියකින් යුතුව හා ඒකායන විශ්වාසයෙන් ජුසේ වාස් පියතුමන්ගේ මැදිහත්කම පතා යාච්ඤා කළාය. විවේක ගන්නා ලෙසට කළ වෛද්‍ය උපදෙස් මැද ඇයව රෝහලින් නිවස කරා යැවුවාය. ඔවුන්ගේ පවුලේ වෛද්‍යවරයාගේ උපදේශය වූයේ වත්තේ ඇවිද්දාට කමක් නැති බවයි. ඔහුගේ උපදේශය පිළිපැදීමට ගොස් කුවිටීරියා මාතාව වෙතින් දෙවන වරටත් රුධිරය වහනය වන්නට විය. වහාම වෙනත් වෛද්‍යවරයකු කැඳවූ අතර ඔහුගේ උපදේශය වූයේ ඇඳෙන් බසින්නේ නැතිව විවේක ගත යුතු බවයි. මේ මාතාවද එසේ සිටිමින් වෛද්‍ය උපදෙස් පිළිපැද්දාය. එසේ වෛද්‍ය උපදෙස් මත ඇඳ විවේකය මැද සිටියදීම තෙවන වරටත් කුවිටීරියා මාතාවට රුධිරය වහනය වන්නට විය. ඇයව වහාම රෝහල් ගත කළ අතර එහිදී ඒරිස් ඩි සා නම් වෛද්‍යවරයා වෙත රැගෙන ගියේය. රෝගියා පරීක්‍ෂා කළ වෛද්‍යවරයා කීවේ දරුවා මෙන්ම දරු ගැබ දරා සිටින මාතාවද මිය යන්නට ඉඩ ඇති බවයි.

මේ අතර ඒ මාතාව සිහිසුන් බවට පත්වූ අතර වෛද්‍ය උපදේශය වූයේ ගබ්සාවකින් මවගේ ජීවිතය බේරා ගැනීමට කටයුතු කළ හැකි බවයි. එහෙත් කුවිටීරියා මාතාවගේ අභිලාෂයන් හා ප්‍රාර්ථනා



මැනවින් දැන හුන් පවුලේ උදවිය එය එකහෙලා ප්‍රතික්‍ෂේප කළහ. එම රාත්‍රිය පුරා ඔවුහු ජුසේ වාස් පියතුමාට මොරගසමින් යාච්ඤා කළ අතර ඇයගේ කුස මත වාස් පිය ඡායාරූපයක් තබා තිබිණ. ඇය පිරිමි දරුවකු ප්‍රසූත කළාය. පසුදා ඇය අවදිවූ අතර ඒ වනවිට රුධිරය වහනය නතර වී තිබිණ.

විශේෂයෙන් දරුවකු කුස පිළිසිඳ ගෙන සිටියදි ඇතිවන රුධිර වහනයන් දරු ගැබට හානි කරනවා පමණක් නොව ඇතැම් විට උපත ලබන දරුවාට විවිධ සංකූලතා මතුවීමේ අවදානමක්ද පවතින බව වෛද්‍ය මතයයි. මේ අනුව එක්වරක් නොව තෙවරක්ම කුවිටීරියා ඩි නොරොන්හා කොස්ටා මහත්මිය දරු ගැබ දරා සිටියදී රුධිරය වහනය වූවත් දරු ගැබ ගබ්සා වූයේවත්, උපත ලද දරුවා මානසික හෝ ශාරීරික සංකූලතා වලින් පෙළුනේ වත් නැත. මේ සියල්ල අවසානයේදී දොස්තර ඒරිස් ඩි සා මහතාගේ අදහස වූයේ මේ මවගේ ජීවිතය ආරක්‍ෂා වීමත්, දරුවා නිරුපද්‍රිතව උපත ලබා කිසිදු සංකූලතාවයකින් තොරව නිරෝගී වීමත් ජුසේවාස් පියතුමාගේ මධ්‍යස්ථකමින් සිදුවූ දෙයක් මිස සාමාන්‍ය තත්ත්වයන් මතනම් සිදුවිය නොහැකි බවයි. අන්ධ, ගොළු, බිහිරි හෝ ආබාධිත, මන්ද මානසික දරුවකු නොවී ගරු කොස්මේ ජෝශප් වාස් කොස්ටා පියතුමා උපත ලද්දේ ප්‍රාතිහාර්යයකිනි.

මේ පිළිබඳව සියලු තොරතුරු වතිකානයේ සාන්තුවරයට එසවීමට සොයා බලන කොමිසම වෙත ඉදිරිපත් කරන ලදුව ඒ ගැන විමසා බලන්නට 1990 දී අදාළ කොමිසම පියවර ගත්තේය. රෝමයේ සහ එංගලන්තයේ වෛද්‍යවරුන් පස් දෙනෙක් මේ පිළිබඳ සොයා බලන්නට පටන් ගත්හ. පුරා වසරකට අධික කාලයක් මේ පිළිබඳව ඉතා සියුම්ව හා විවිධ පැතිකඩ ඔස්සේ විමසා බැලූ මේ වෛද්‍ය මංඩලය මෙය වෛද්‍ය විද්‍යාත්මකව හේතු දැක්විය නොහැකි ප්‍රාතිහාර්යාත්මක සිද්ධියක් බව නිර්දේශ කළේය. මේ නිසාම එවකට ශුද්ධාසනයේ සසුන් පිය ධූරය හෙබවූ අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු හිමි (දැන් සාන්තුවර) වන්දනීය ජුසේවාස් පියතුමා භාග්‍යවරයට එසවීම සඳහා අනුමතිය ලබාදුන්නේය.

වර්ෂ 1938 දී උපත ලද ප්‍රාතිහාර්යයේ දරුවා ලෙස විරුදාවලිය ලත් කොස්මේ තරුණයා 1966 දී පූජකවරය ලැබීය. මේ වනවිට පූජකවරයේ 48 වසර ගෙවන ගරු කොස්මේ ජෝශප් වාස් කොස්ටා පියතුමා ඉකුත්දා පැවැති භාග්‍යවන්ත ජුසේවාස් තුමා සාන්තුවරයට එසවීමේ මහෝත්සවයට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේය. එතුමා දෙවරක් ප්‍රසාද ස්නාපනය ලද අතර සත්මසින් උපත ලද මේ ප්‍රාතිහාර්යයේ දරුවා උපත ලද වහා ප්‍රසාද ස්නාපනය දානය කරන්නට රෝහලේ කතෝලික හෙදියක කටයුතු කළාය. උපතින් තෙමසකට පසු එතුමාව නැවතත් දෙව්මැඳුරේ දී බෞතිස්ම ස්නාපනය කළේය. 1995 දී වන්දනීය ජුසේවාස් පියතුමා භාග්‍යවරයට එසවීමේ අවස්ථාවටද සහභාගි වූ එතුමා පූජකවරය සඳහා අවසර පතද්දී පවුලේ එකම පිරිමි දරුවා පූජකවරයකු වීම ගැන පවුලේ සියලු දෙනා විරුද්ධ වෙද්දී ඒ මව ඔහුට ඒ සඳහා අනුබල දුන්නේය. 76 හැවිරිදි ගරු කොස්මේ ජෝශප් වාස් කොස්ටා පියතුමා කියන්නේ 'සාන්ත ජුසේ වාස් මුනිඳුන් සිය මවගේ ඒකායන විශ්වාසයට මැදිහත් වෙමින් දුන් දරු තිළිණය හා මවගේ ජීවිතය යන දෙකම රැක දෙන්නට තරම් බලවත් වූ බවයි.

**ශිරාන් මෛත්‍රී**



# මුතුන් මිත්තන්ගෙන් ලද ස්වර්ණමය දායාදය වූ දේව විශ්වාසය මතු පරපුරට උරුම කර දෙන්න

මුතුන් - මිත්තන්ගෙන් ඔබට ලැබුණු ස්වර්ණමය දායාදය දේව විශ්වාසයයි. එය දිවි හිමියෙන් ආරක්ෂාකර ඔබගේ මතු පරම්පරාවටත් උරුම කරදීම පරම යුතුකම යැයි තඹරවිල නිර්දෝෂ දේව මාතා වහන්සේගේ දෙව්මැඳුරේ 175 ජුබිලි මංගල්‍යයේ ප්‍රධාන දේශනය පවත්වමින් හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ පැවසූහ.

2015 වසරට හලාවත පදවිය ආරම්භ කර වසර 75 ක් පිරේ. ප්‍රදේශයේ කිතුනු පුරාණය වසර 400 කටත් වැඩිය.

සන්ධ්‍යා මෙහෙය රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලිටස් චන්ද්‍රසිරි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර ජුබිලි මංගලෝත්සවය සඳහා අභිනව මීසම් ගෘහයක්, නව භාවනා කුටියක් ඉටිපන්දම් දල්වන එලිමහන් දේවස්ථානයක් හා දෙව්මැඳුර ඉදිරිපිට ස්ථාපිත නිර්දෝෂ මාතා ප්‍රතිමාව ආසිරි ගැන්වීමද සිදුවුනු අතර මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් සහායක ගරු නුවන් එමල්ක පියතුමන් ඇතුලු ජුබිලි කමිටුව හා තඹරවිල සංඝයේ සැදැහැවතුන්ගේ කැපවීම හා සහයෝගය නොමඳව ලැබිණ.

**ඩබ්ලිව් හෙක්ටර් ප්‍රනාන්දු**



අංගොඩ සාන්ත සෙබස්තියන් මුනි දෙව්මැඳුරේ දහම් පාසල් දරු දැරියනට, ගුරුවර ගුරුවරියනට මෙතෙක් පැවැති අඩුපාඩුවක් සපුරාලමින් සුනිල් විමලවීර, දමයන්ති විමරවීර යුවලගේ ධන පරිත්‍යාග යෙන් වැලිවිට මීසම් සේවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමාගේ නිවැරදි මඟපෙන්වීම යටතේ ඉදිවූ නව දෙමහල් දහම් පාසල් ගොඩනැගිල්ල පසුගියදා ආසිරි ගන්වා විවෘත කරන ලදි.

සටහන - එම්. ජෝ. පාරිස්; සේයා - පවිත්‍රා පිරිස්



ගරු හැඳලගේ දොන් සමන් චින්තක ගරු ඇන්ටන් නුවන් තාරක මිහිදුකුල සූරිය තේවාචාර්ය තුමන්ට පූජක වරම් ප්‍රදානය කිරීම අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ මූලිකත්වයෙන් මීගමුව දොන් බොස්කෝ ආයතනයේ ක්‍රිස්තියානින්ගේ පිහිටාධාර මෑණියන්ගේ සිද්ධස්ථානයේදී පැවැත්විනි. එම මංගල අවස්ථාවට අතිගරු නිහාල් ලියනගේ, සැ.නි. උප ප්‍රාන්ත ප්‍රාදේශාධිපති ගරු ඩික්ෂන් ප්‍රනාන්දු සැ.නි. උප ප්‍රාන්ත උප ප්‍රාදේශාධිපති පියතුමන් ද සහභාගි විය.

සටහන - ඒ. ඩී. සුනිල්
සේයා - සම්පත් සුවාරිස්

## කිතුනු අපගේ අපවිත්‍ර ලිපිගොනුව මරියතුම් සතුව

කිතුනු අප සැමගේ අපවිත්‍ර ජීවිත ලිපිගොනුව පවිත්‍ර බවේ ප්‍රතිමූර්තිය බඳු මරියතුම් සතුව ඇති බවත්, ආත්මික ක්‍රියාවන් හා සැබෑ මනස්ථාපය තුළ පාපොච්චාරණයක් සිදු කර අපගේ ලිපිගොනුව පවිත්‍ර කරගන්නැයි ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා කම්කරු මහලේකම් කාර්යාලයේ දේව මෙහෙයක් පවත්වමින් පැවසීය.

රාජ්‍ය හා පුද්ගලික ආයතනයන් හි සේවය කරන කිතුනුවන් එක්ව ගොඩනැගුනු විවිධ කිතුනු සංගම් ඒකරාශි කරමින් කොළඹ අගරදගුරු පදවි සදහම් සජීවක මෙහෙවර විසින් අරඹා ඇති ආගමික දේශන මාලාවට සමගාමීව මෙය පැවත්විනි. කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ කිතුනු සේවකයින් එක්ව සැදුනු 'කිතුනු හවුල' මෙය සංවිධානය කර තිබුණි.

**චින්තක ද මැල්**

## ගුරුගල්ල මීසමේ මංගල්ලයේදී ආගමික සුහදතාව නැංවේ

ගුරුගල්ල ශුද්ධ වූ ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ වාර්ෂික මංගල නුවාන සමයේදී කුඩාගම මීසම් සේවක ගරු ජීවන් පීරිස් පියතුමන් විසින් විශේෂ අධ්‍යාත්මික සූදානමේ යෑදුම් මෙහෙයක් සිදුකරන ලද අතර ප්‍රැන්සිස්කාන නිකායේ ගරු ක්‍රිස්ටස් පියතුමන් විසින් නුවාන සමයේ දේශන මෙහෙයවනු ලැබුණි.

සන්ධ්‍යා මෙහෙය දෙහිඹිවිට මීසම් සේවක ගරු පියල් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර පෙරහර වීදි සංචාරය කරන අවස්ථාවේ ඇපලපිටිය ශ්‍රී ජයසුමනාරාමයේ විහාරාධිපති පූජ්‍ය ගල්ලෑල්ලේ ධම්මරතන හිමියන් බෞද්ධ සැදැහැවතුන් සමග ශුද්ධ වූ ප්‍රැන්සිස් සේවියර් මුනිඳු ප්‍රතිමාවට මල් කළඹක් එක් කිරීමත්, බෞද්ධ සැදැහැවතුන් සහභාගීත්වයෙන් බිම දන්සලක් සංවිධානය කිරීමත්, නුවාන සමයේ අසල්වැසි විහාරස්ථානවල ස්වාමීන් වහන්සේට මීසම් ගෘහයේ සාංඝික දානයක් පිරිනැමීමත් සුවිශේෂී අවස්ථාවන් විය.

මංගල කටයුතු ගරු ටෝනි හපුආරච්චි පියතුමන් ප්‍රමුඛ මීසම් ධර්මසේවා සභාව හා මීසම් සංඝය විසින් සංවිධානය කරනු ලැබුණි.

**පී. ජී. ඊෂානි ප්‍රියංගිකා පෙරේරා**



කොළඹ අගරදගුරු පදවියට අයත් මදුරන්කුලියේ පිහිටි පාලවිචෝල වතුයායේ වර්ෂ අවසාන දිව්‍ය පූජාව කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. මෙම වැඩසටහන සඳහා අගරදගුරු පදවියේ භාණ්ඩාගාරික අතිගරු මර්ල්ශාන්ති, උප භාණ්ඩාගාරික ගරු ගිහාන් රිඩ්ලි, රත්නපුර පදවියේ අනුනායක අතිගරු ඩේමියන් ප්‍රනාන්දු, මේරියස් මදුරාවල මහතාද සහභාගි වූහ. වතු පරිපාලන බාරව කටයුතු කරන ගරු වික්ටර් ජයමාන්න පියතුමා සහභාගි වූ සැමට තුති පිදීය.

රුවන් ජනක ප්‍රනාන්දු

## ඔබේ කාලයෙන් බිඳක් නැතිබැරි මිනිසුන් වෙනුවෙන් කැපකරන්න

දයාවේ සේවාවක් කිරීමට අපට කාලයක් නැතැයි කියන්නේ නම්, නෙදර්ලන්ත මානව දයාවේ ආධාරය ඇතිව අප ප්‍රදේශයේ තරුණ සංචිතය ජනගතවී ගොඩනැගු සන්තෝෂාදයා සේවාපදනම සමස්ත කිතුනුවන්ට මහා අභියෝගයක් හා ආදර්ශයක් වන්නේ යැයි දුන්ගාල්පිටිය කැපුන්ගොඩ සන්තෝෂා දයා සේවා පදනමේ වාර්ෂික උත්සව සභාව අමතා කැපුන්ගොඩ මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමා ප්‍රකාශ කළේය.

සන්තෝෂා පදනම තුළ පුනරුත්ථාපනය වන මන්ද මානසික හා ආබාධිත දරුවන්ගේ හා නොමිලේ අධ්‍යාපනය ලබාදෙන දරු දැරියන්ගේ විවිධ ප්‍රසංගය හා නත්තල බෙදා හදා ගැනීමේ උත්සවය පසුගියදා සන්තෝෂා පදනම් ආයතනයේ ප්‍රජා ශාලාවේදී පැවැත්විණ.

**ජෝ. සංගපාලආරච්චි**

# 150 වසර සමරන දලුගම ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් දෙව්මැඳුර

කැලණියේ දලුගම ශු. ප්‍රැන්සිස් සාලෙස් දෙව්මැඳුරට වසර 150 ක් පිරීමේ ජයන්ති මංගල්‍යය ජනවාරි 25 ඉරුදින (අද) ට යෙදී ඇත.

දලුගම ග්‍රාමයට සැතපුම් හතරක් පමණ එපිට බියන්විල පිහිටි කුඩා පොල් අතු පැලක් කිතුනු සැදැහැතියන් විසින් ඒ දිනවල වැඳුම් පොළක් හැටියට භාවිත කරන ලදී. මේ වන්දනා කුටිය ලන්දේසීන් විසින් විනාශකරන ලදී. පාළුවට හැර දමා තිබු ඉඩම් කැබැල්ලේ කුඩා දෙව්මැඳුරක් තිබූ බවට සලකුණක් හෝ නොවීය. එක් දිනක් කුඹුරේ ගොයම් කපන තම පියා වෙත ඇඹුල රැගෙන මෙම හුදකලා වතුයාය මැදින් ගමන් කරනදැරියක හදිසියේ පය ලිස්සාගොස් බිම ඇද වැටුණාය. ඒ සමගම ඇය අතින් ගිලිහුණු මැටි භාජනද බිඳී කෑමද සී සී කඩ විසිරුණි. තම පියාට දිවා ආහාරය ගෙනයන්නේ කෙසේදැයි සිතමින් බියට පත්වී සිටි දැරිය නොදැනුවත්වම තද නින්දකට වැටුණාය. 'දරුවා අවදිවෙයන් නුඹේ පියාට මේ කෑම පිඟන් ගිහින් දීපන්' තමා අමතන කිසිවකුගේ කට හඬින් අවදිවූ දැරිය වටපිට බැලුවාය. එකෙණෙහි ඇගේ නෙත ගැටුණේ නොබිඳී නොහිරී සුරක්ෂිතව තිබූ ආහාර බඳුන්ය. වහා නැගිට පිඟන් අතට ගත් දැරිය කුඹුර දෙසට යෑමට පියමැන්නාය. ඊට නුදුරින් වූයේ පාළු ළිඳකි. දඟකාර දැරිය ළිඳටද එබිකම් කළාය. දිළිසෙන යමක් ළිං පතුලේ තිබෙනු ඇය දුටුවේ එවිටයි. වහා පය ඉක්මන්කර තම පියා වෙත ගිය මෙම ගැහැනු දරුවා අතර මග දී ඇයට සිදුවූදේත් ළිං පතුලේ තමා දුටුදේත් තම පියාට සැළකළාය. සැනෙකින් ක්‍රියාත්මක වූ එම පියා කුඹුරේ වැඩ කරමින් සිටි තවත් කීපදෙනෙකු සමග තම දුවනිය පැවසු ළිඳ වෙත පැමිණියහ. ළිඳ පතුලේ ඇත්තටම දිලිසෙන යමක් ඇති බැව් ඔව්හු දුටහ. තවත් ප්‍රමාද නොවූ ගොවිහු මහත් ආයාසයකින් පසු දිලිසුණු භාණ්ඩය ගොඩට ගත්හ. එය ප්‍රතිමාවකි. මෙම ඓශ්වර්යමත් ප්‍රතිමාව දැකීමෙන් සතුටට පත් ගොවීහු තරමක උස අට්ටාලයක් සාදා ප්‍රතිමාව එහි තබා අව්වැසි වලින් ප්‍රතිමාව සුරක්ෂිත කරනු වස් කුඩා පොල් අතු පැලක්ද ඉදිකළහ. මෙම සුරුවම ශුද්ධ වූ ප්‍රැන්සිස් සාලෙස් මුනිවරයාට අයත් වූවක් බව ඔවුන් දැනගත්තේ ඉන් පසුවයි.

මෙම සිද්ධිය කටින් කට ගොස් ක්‍රිස්තියානි බැතිමතුන්ගේ වැඳුම් පොළක් බවට එය පත්වූයේ වැඩි කලක් යෑමට පෙරයි. මෙහි පැමිණි රෝගීහු ක්ෂණික සුවය ලදහ. දලුගම පොල්ගහ කමත ගමේ විසූ පැස්කුවෙල් විදන්රාළගේ බිරිඳගේ උගුරේ හිරවු මාලු කටුව නිසා මෙම ප්‍රතිමාවට බාර වී ආපසු එන ගමනේදීම සුවවීම නිසා ඉන්පසු අවට ගම්වාසින් කීපදෙනෙකුද ළිඳෙන් මතුවු සුරුවම වෙත යෑමට පුරුදු වූහ.

එක් දවසක් යථෝක්ථ ගම්පති යුවල මෙම දෙව්



පියසක කරා පැමිණෙත් දී එය ගිනිබත් වෙමින් තිබුණි. එදා එම ගමනට විදාන රාළගේ පුතාද සහභාගි විය. ගිනි ඇවිළෙන පොල් අතු පැලට ඇතුළු වූ එම තරුණයා විසින් ඓශ්වර්යමත් ප්‍රතිමාව බේරාගන්නා ලදී. මෙම සිද්ධියෙන් පසු ශුද්ධ වූ ප්‍රතිමාව පොල්ගහකමත ගමේ සියඹලාවත්ත නම් ඉඩමක ඉදිකරන ලද කුඩා වැඳුම් කුටියක තැන්පත් කළෝය. කාලයාගේ ඇවෑමෙන් මෙම බලගතු ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් ප්‍රතිමාව අද මෙම දේවස්ථානය ඉදිකොට ඇති ස්ථානයට ගෙනැවිත් ඇත. වර්ෂ 1865 දී ගොඩනගන ලද එම දෙව්මැඳුර අද දලුගම ශු. ප්‍රැන්සිස් සාලෙස් දෙව් මැඳුර වේ.

දලුගම ශු. ප්‍රැන්සිස් සාලෙස් මුනි මීසම ගැන මෙ සටහන තබත්දී මෙම මීසම තුළින් බිහිකරන ලද රදගුරු හිමි වරුන් සය දෙනකුගේ අමරණීය මතකයද අප ඉදිරියේ මැවේ. අද විශ්‍රාමිකව පසුවන අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරු හිමි එවකට දලුගම මීසමට අයත් වූ අතර අතිඋතුම් දොන් සිල්වෙස්තර් හිමිපාණෝ දෙව්සත්හලට ඇතුළුවීමට පෙර නේවාසිකව සිටියේ දලුගම පනාරුක් නිවසෙහිය. අතිඅතුම් රේමන් පිරිස්, හැරල්ඩ් ඇන්තනී පෙරේරා, එම්මානුවෙල් ප්‍රනාන්දු සහ මැක්ස්වෙල් සිල්වා යන රදගුරුතුමන්ලා දලුගම මීසම තුළින් පන්නරය ලැබූ පියවරුන්ය.

**දලුගම මොරිස් බොල්ලෑගල**

## යහපත් දරු පරපුරක් තුළින් උතුම් සමාජයක් බිහිකරමු

මව්පියන් වශයෙන් කුඩා අවධියේ සිට දරුවන් දහමට හුරු කරවීම අපගේ යුතුකමය. දහමට සාහිත්‍යයට හුරුවන දරුවා තුළින් ගලා එන්නේ යහපත් සිතුවිලි සමුදායකි. අනාගත දරු පරපුර තුළින් උගත්, යහපත්, සමාජයක් බිහිකිරීමට නම්, මව්පියන්ගේ කැපවීම අතිශයෙන් වැදගත් වනු ඇතැයි කලාසූරී සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතා පැවසීය.

එතුමා එසේ පැවසුවේ, දියලගොඩ සාන්ත සෙබස්තියන් දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදාන උලෙළේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වෙමිනි. මීසම් සේවක, ගරු දිනේෂ් තරංග කීර්තිසිංහ පියතුමන්ගේ මූලිකත්වයෙන් දහම් ගුරුවර, ගුරුවරියන් විසින් මෙය සංවිධානය කරන ලදී.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## පන්නිපිටිය දහම් පාසල් දිනය

පන්නිපිටිය මීසමේ දහම් දිනය සහ දහම් පාසල් ත්‍යාග ප්‍රදානය කෝට්ටේ කලාපයේ ධර්මෝපදේශ අධ්‍යක්ෂ සහ නුගේගොඩ මීසම් සේවක ගරු අනුර සිල්වෙස්ටර් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මීසම් සේවක පියවරුන් සමග දහම් පාසල් ගුරු කමිටුව එක්ව සංවිධානය කළ මෙම අවස්ථාවට දෙව්මැඳුරු හයේ දරුවන් ඉදිරිපත් කළ නර්තන, ගායනා හා නාට්‍ය අංගයන්ද ඇතුලත්ව තිබිණ.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**



නිට්ටඹුව සා. අන්තෝනි දෙව්මැඳුර භූමියේ ඉදිවු අඩි 13 උස සා. අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාව ධර්මදූත කලාපීය නාහිමි අතිගරු සෑම් ක්වින්ටස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් නිට්ටඹුව විද්‍යානන්ද පරිවේනාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය ගලපිටමඩ ඉන්ද්‍රානන්ද හිමිපාණන්ගේ අනුශාසනා මැද නිරාවරණය කෙරුනි. මීසම් සේවක ගරු ඉන්ද්‍රා රත්නසිරි හා සහයක ගරු වසන්ත ප්‍රසන්න ප්‍රනාන්දු පියවරු මෙය සංවිධානය කළහ.

සටහන - ඇන්ටනි මොරගොඩ; සේයා - සම්පත් ඩයස්

දේව වචනයෙන් හික්මීම

ධර්ම සංග්‍රහය

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා

## ජුසේ වාස් මගෙන් පිබිදෙන කන්දෙවත්ත

## ශුද්ධවූ ජුසේ වාස් මුනි දේවස්ථානය



අපේ රටෙහි දහම් ප්‍රදීපය දල්වාලීමටත් දහම් ආලෝකයේ පහන් සිළුව නොනිවී රැක ගන්නටත්, කැප වූ වැයවූ දහම් විරුවන් අතර වඩාත් දීප්තියෙන් බැබළෙන ආලෝකයාණෝ නිසැකව අප ශුද්ධවූ ජුසේ වාස් මුනිඳාණෝ ම ය.

එතුමාණන්ගේ සුවිශේෂී අපෝස්තලික සේවාව ආරම්භ කරමින් එතුමන් ඕලන්ද ප්‍රදේශයේ බැහැදකින ලද ප්‍රථම නගරය වූයේ ගුරුබැවිල ප්‍රදේශයයි. මෙය වර්තමානයේ හංවැල්ල ලෙස හඳුන්වයි. ජුසේ වාස් මුනිතුමන් ගුරුබැවිල ප්‍රදේශයේ ධර්මදූත කටයුතුවල යෙදීමේදී ලන්දේසීන්ගේ පීඩා වලින් මිදීමට මානියන්ගම රජමහා විහාරයේ නවාතැන් ගත් බවත් එතුමා භාවිත කළ කුඩා ඇඳ වර්තමානයේ එම රජ මහා විහාරයේ පවතින බව අපගේ විශ්වාසයයි. මෙම ගුරුබැවිල ධර්මදූත චාරිකාවේ එතුමාණන්ගේ ගමන් මඟ තුළ කන්දෙවත්ත ප්‍රදේශයද එතුමන්ගේ පා පහසින් පෝෂණය වූ බව ජනප්‍රවාදයේ පැවසේ. මෙකල මේ ප්‍රදේශයේ පෘතුගීසින්ගෙන් පැවත ආ කතෝලිකයන්ද, ස්වදේශික කතෝලිකයන් ද සිටි බවට ඉතිහාසය සාක්ෂි දරයි.

කොළඹ පදවියට අයත් කැලණි මිටියාවතේ ගුරුබැවිල දිසාවේ වග මීසම් පවුලට අයත්, ජුසේ වාස් මුනිතුමාට කැප කළ කන්දෙවත්ත දේවස්ථානය ගැමි පරිසරයකින් හෙබි අතිශයින් සුන්දර වටපිටාවක පිහිටා ඇත. ඉතාමත් නිසංසල රමණීය පරිසරයක පිහිටා ඇති කන්දෙවත්ත සභාවේ පවුල් ප්‍රමාණය 20 කි. මෙම පවුල්වල යටගියාව වසර 400 කට ආසන්නය. ඔවුහු පාරම්පරික කිතුනු ගතිපැවතුම් හා සිරිත් විරිත් අනුව චාම් ජීවිතයක් ගෙවති.

කන්දෙවත්තේ දේවස්ථානයක් ඉදිකිරීම සඳහා අක්කර 1/2 ක පමණ ඉඩමක් පරිත්‍යාග කර ඇත්තේ ක්‍රි.ව. 1800 පමණ, එහි විසූ ගජසිංහ ආරච්චිලාගේ පොරලෙන්චි මුහුප්පු මහත්මා විසිනි. වර්ෂ 1930 සිට 1960 දක්වා ගෙපැලක කතෝලික සැදැහැවත්තු ආගමික වතාවත් සිදු කරන ලදි. ගරු ලියෝපෝල්ඩ් ස්මිත් පියතුමාගේ කාලයේදීත්, ගරු ජයලත් බලගල්ල පියතුමාගේ කාලයේ දීත් මෙම දේවස්ථානයේ විවිධ අදියරයන්හි ඉදිකිරීම් සිදු කර ඇති අතර එවකදී භාග්‍යවන්ත ජුසේ වාස් මුනිතුමන්ට කැප කරන ලද මධ්‍යස්ථානයක් ලෙස පැවතුනි. මෙම දෙව්මැඳුර වර්ෂ 1995 ජනවාරි 20 දින ජුසේ වාස් පියතුමන් භාග්‍යවරයට එසැවීමෙන් පසුව එවකට මීසම් සේවක ගරු සුසිත් සිල්වා පියතුමාගේ මඟ පෙන්වීම යටතේ නවීකරණය කර, එම වසරේම ජූලි මස 12 වෙනි දින දැනට කුරුණෑගල රදගුරු තැන්පත් අතිගරු හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් විසින් මෙම දෙව්මැඳුර භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන්ට කැප කර ආසිරි ගන්වන ලදි. "භාග්‍යවර වන්දනීය ජුසේවාස් තුමාගේ ශුද්ධවරය පතා යැදුම්" නමැති පොත් පිංචේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවේ භාග්‍යවත් ජුසේවාස් මුනිතුමන්ට කැප කරන ලද දෙවන දෙව්මැඳුර ලෙස මෙම හංවැල්ල වග මීසමට අයත් කන්දෙවත්ත දේවස්ථානය සැලකේ.

මෙම දේවස්ථානයෙන් පිහිට අයැද සිටින සැමට භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන්ගේ මැදහත්කමින් දෙවි පියාණන්ගෙන් ලැබී ඇති වරප්‍රසාද අපමණයි. නොයෙකුත් උවදුරු හා රෝගාබාධයන් මෙන්ම දරුඵල ලබා ගැනීමටත් මෙම ස්ථානයේ ජනතාව බාර හාර වෙති. අන්‍යාගමිකයන් පවා දෙවි පියාණන්ගේ ප්‍රේමයේ අත්දැකීම, සහනය, සුවය, ජුසේ වාස් මුනිතුමන් මඟින් ලබා ගත හැකි ස්ථානයක් ලෙස කන්දෙවත්ත භාග්‍යවන්ත ජුසේ වාස් මුනිතුමන්ගේ දේවස්ථානය ප්‍රසිද්ධියක් උසුලයි. ශුද්ධවූ ජුසේ වාස් මුනිතුමන් අප දේශයේ කතෝලිකයන් උදෙසා අනේක විධ කම්කටොළු මැද මරණය උරුම කරගෙන හිස් පතුලෙන් පියමං කළේ "ජීවත්ව සිටියදි කිසිවක් නොකළේ නම් මරණ මොහොතේදීත් එය කළ නොහැකි බව" ආදර්ශ පාඨය තේමා කර ගනිමිනි.

2015 පෙබරවාරි 01 දින පෙ.ව. 8.00 ට අප දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පැවැත්වෙන අතර ශුද්ධවරයට එසැවීමෙන් පසු ජුසේ වාස් මුනිතුමන්ගේ මැදහත්කම තුළ දෙවි පියාණන්ගේ ආසිරි බහුලව ලැබෙන එම මංගල්‍යය දිව්‍ය යාගයට පැමිණෙන ලෙස ඔබට ද ආරාධනා කරමු.

කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා ප්‍රධාන මාර්ගයේ පැමිණෙන ඔබට බොරළුගොඩින් දකුණට විහිදෙන මාවල්ගම මාර්ගය ඔස්සේ කිලෝමීටර් 02 ක් පමණ දුර ගොස් වම්පසට හැරෙන මාවතේ ගිය විට මෙම දෙව්මැඳුර හමුවේ. දුෂ්කර ගම් පියසක කුඩා දෙව්මැඳුරක් වුවද ගුරුබැවිලට මහත් අභිමානයක් ගෙන දෙමින් ජුසේ වාස් මුනිතුමන්ගේ අනුහස් ඇති ශුද්ධවූ ස්ථානයක් ලෙස අප දෙව්මැඳුර බොහෝ සැදැහැවතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වී ඇත.

කැලෑ මැදින් දෙපා වැරෙන් ගියේ දුර ගමන්
දුගී වෙසින් සැදී ගතින් දරා ඇඩි ගිමන්
කුසට අහර පවා - නැතිව දවස ගෙවා
එදා දෙසූ දහම් අමා රසේ බසී ගලා

**✍ වග මීසම් සේවක පියතුමන්
සමඟ කන්දෙවත්ත ජනතාව**

# ශුද්ධවූ සභා ඉගැන්වීම් තුළ කැපවූ ජීවිතය

2013 වසරේදී රෝමයෙහි පවත්වන ලද අග්‍ර ශ්‍රේෂ්ඨවරුන්ගේ 82 වන සම්මේලනයෙහිදී ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කළ පරිදි 2014 ආගමන කාලයෙහි පළමුවන ඉරුදින කැපවූ ජීවිතය වෙනුවෙන් වෙන් කරන ලද වසර ආරම්භ වූ අතර 2016 පෙබරවාරි 02 වන දින එනම් ලෝක කැපවූ ජීවිත



දිනයේ දී එය නිම වීමට නියමිතය. **මෙම ලිපිය මඟින් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේදී සහ ශු. දෙවන ජුවාම් පාවුළු මුනිඳුන්ගේ "කැපවූ ජීවිතය" නමැති අනුශාසනා පත්‍රයෙහි අඩංගු සමහර ඉගැන්වීම් ඉදිරිපත් කිරීමට අදහස් කරමි.**

ශත වර්ෂ ගණනාවක් පැරණි ස්ථිර කිරීම් මඟින් (විනය සහ මර්දනාව) ශු. සභාව තුළ අද පවත්නා නව ආලෝකයන්ට සහය විය නොහැකිය යන්න දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙහිදී ඉතාමත් පැහැදිලි විය. කැපවූ ජීවිතය යනුවෙන් අදහස් කරන ලද්දේ යමෙක් ප්‍රසිද්ධියේම සම්පූර්ණත්වය ලැබීමට උත්සාහ දරන ලද "සම්පූර්ණත්වයේ ජීවිත තත්ත්වයක් නිසාය. "ජාතින්ගේ ආලෝකය" නම් වූ සභා ව්‍යවස්ථාව ප්‍රසිද්ධියට පත් කිරීමෙන් පසුව මෙම අදහස් තහවුරු කිරීම ගැටලු සහගත විය. දේව වචනය සහ සභාවේ ජීවමාන සම්ප්‍රදායයන් තුළින් කැපවූ ජීවිතය පිළිබඳ නව අරුතක්, නව අභිප්‍රේරණයක් නව ජ්වලිත බවක් සොයන්නට සිදුවිය.

**සභා ලියවිලි තුළ කැපවූ ජීවිතය :**

කැපවූ ජීවිතය පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා ලියවිලි කිහිපයක් සඳහන් කිරීමට කැමැත්තෙමි.

1. කැපවූ ජීවිතය කාලානුරූපී කිරීම පිළිබඳ නියෝගය (Perfectae Caritatis)
2. ජාතින්ගේ ආලෝකය (ජා.ආ) (Lumen Gentium) අංක 43-47
3. රාජගුරුප්‍රසාදි තුමන්ගේ එඬේරිය කාර්ය පිළිබඳ නියෝගය. (Christus Dominus) අංක 33 - 38
4. ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව (Sacrosanctum Coucilium) අංක 80, 98, 101
5. ශු. සභාවේ ධර්ම දූතික ක්‍රියාකාරිත්වය පිළිබඳ නියෝගය (ad Gentes) අංක 10, 40

"කැපවූ ජීවිතය පිළිබඳව දේව ධාර්මිකව කතා කරන ලද පළමුවන පොදු මන්ත්‍රණ සභාව එය වේ. පෙර පැවති මන්ත්‍රණ සභාවන් කැපවූ ජීවිතය පිළිබඳව කතා කරන ලද්දේ විනය සහ මර්දනය ආශ්‍රයෙනි. "ජාතින්ගේ ආලෝකය" මඟින් කැපවූ ජීවිතය සභාව තුළ ගිවිසුමක් යයි පෙන්වා දෙයි. එය සභා සංයුතියේ කොටසක් බව මම නිර්භයව පවසමි. කැපවූ ජීවිතය සභාවේ පදනම් ව්‍යුහය මත වූ අලංකාර සැරසිල්ලකට වැඩි යමක් යයි කතා කිරීමට විරුද්ධවූ යම් යම් පුද්ගලයින් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව තුළ වී යයි මම සිතමි. එහෙයින් සභාව යම් ආධ්‍යාත්මික දේ නැතිවී යාම සිදුවන සභාවකි." (කැපවූ ජීවිතය සඳහා වූ නිකායයන් සහ අපෝස්තලික ජීවිතය සඳහා වූ සමිති පිළිබඳ මණ්ඩලයේ ලේකම් ධුරය දරන ලද ජෝශප් ටොබින් අගරදගුරු තුමා දි. ගැ. නි. )

**අනුගාමිකත්වය සහ ශුද්ධවන්තභාවය සඳහා වූ පොදු කැඳවීම :-**

සුවිශේෂක සම්පූර්ණත්වය සඳහා වූ ක්‍රිස්තියානි පොදු කැඳවීම පිළිබඳව කතා කිරීමේදී දෙවන වතිකාන මන්ත්‍රණ සභාව අනුගාමිකත්වයේ කේන්ද්‍රීය අරුත කෙරෙහි යොමු විය. ඒ මඟින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අඩිපාරෙහි ගමන් ගන්නා ලෙස සියල්ලන්ට අනුශාසනා කරන ලදි. (ජා.ආ. 40) පීඩා විඳින කුරුසියේ මාර්ගය තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කිරීමට සූදානම්ව සිටීමේ අවශ්‍යතාව එයින් නැවතත් සිහිපත් කරයි. ශු. පාවුළු තුමාගේ ඉගැන්වීම් අනුව ප්‍රසාද ස්නාපනය ලත් සියල්ලෝම ශුද්ධවන්ත භාවයට (ශුද්ධවන්ත බව සඳහා වූ විශ්වීය කැඳවීම) කැඳවනු ලබති. "දෙවියන් වහන්සේගේ කැමැත්ත ඔබ ශුද්ධවන්ත වීමයි" (1 තෙස. 4:3) මේ අනුව කැප වූ ජීවිතය සහ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කිරීමටත් අනුව යාමටත් උත්සාහ දරන ප්‍රසාද ස්නාපනය ලද අනෙකුත් පුද්ගලයින්ගේ ජීවිත අතරත් ගුණාත්මක වෙනසක් නොමැත. ෆ්‍රැන්සිස් ජේ. මෙලෝනි පියතුමාට

> **A**
>
> **කැප වූ ජීවිතයෙහි දිවැසිවර ස්වරූපය ක්‍රිස්තුන් වහන්සේගේ දිවැසිවර කාර්යයෙහි පංගුකාර වීමේ විශේෂ ස්වරූපයක් දරයි.**

අනුව කැප වූ ජීවිතය කාලානුරූපී කිරීම පිළිබඳ නියෝගයෙහි පළමුවන අංකයෙහි සඳහන් වන "වඩාත්" නමැති වචනය මඟින් කැපවූවන් සහ අන්‍යයන් අතර සංසන්දනයක් ඇතැයි අදහස් කළා විය හැකිය. මෙයින් සභා පියවරුන්ගේ අදහසක් පිළිබිඹු නොවූවත් අනතුරක් ඇත. එනම් කැපවූ ජීවිතය සහ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීමට සහ අනුගාමී වීමට ප්‍රයත්න දරන ප්‍රසාද ස්නාපනය ලැබූ පුද්ගලයින් අතර ගුණාත්මක වෙනසක් ඇතැයි වටහාගත හැකි වීමට ඉඩ තිබීමයි. ශු. සභාව පිළිබඳ ව්‍යවස්ථාව පැහැදිලිවම මෙම අනතුර ඉවත් කරයි (අංක 40).

අනුගාමිකත්වය සහ සියලුම ක්‍රිස්තියානින් ශුද්ධවන්ත බවට කැඳවනු ලැබීම යන්නෙහි කේන්ද්‍රීය අරුත පිළිබඳව කථා කිරීමේදී මන්ත්‍රණ සභාව, ජේසු සමිඳුන් විසින් සිය අනුගාමිකයින් වෙත ඉදිරිපත් කරන ලද සුවිශේෂීය අනුශාසනා ගණනාවක් පිළිබඳව කථා කරයි. මේවා අනුගාමිකත්වය ඇතුළත් වන සහ නීතිය පිළිබඳ අවම, වචනාර්ථ අදහසට ඔබ්බෙහි වන ප්‍රකාශනයන් ය. මන්ත්‍රණ සභාවට අනුව ඒවා විවිධ කරිස්මාවන්ට සම්බන්ධ වෙයි. (ජා.ආ. 41, 1 කොරි 12. රෝම 12) පොදු අනුගාමිකත්වයට සාපේක්ෂව, පැවතීමේ ස්වරූප හුදෙක් මාර්ග පමණි. කැපවූවන් යනු සුවිශේෂය මඟින් ඉදිරිපත් කරන ලද ක්‍රිස්තියානි අනුගාමිකත්වයේ පරමාදර්ශය අභ්‍යන්තර ගත කර ගැනීමට සොයන්නන් ය. ඔවුන්ට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයින් වීමට අවශ්‍යයය.

සුවිශේෂක අනුශාසනාවන් ප්‍රසිද්ධියේ උච්චාරණය කිරීමෙන් ඇරඹෙන ජීවිත තත්ත්වය සභාවේ ධූරවලි ව්‍යුහයට ඇතුළු නොවෙමින් එහි ජීවිතයට සහ ශුද්ධවන්තභාවයට නිසැකයෙන්ම ඇතුළත් වෙයි. (ජා.ආ. 44). කැපවූ පුද්ගලයින් සභාව තුළ ප්‍රසිද්ධියේ සුවිශේෂක අනුශාසනාවන් උච්චාරණය කරන්නේ දෙවියන් වහන්සේට ජ්වලිතව ප්‍රේම කිරීමෙන් සහ හද පත්ලෙන් වන්දනා කිරීමෙන් තමන් වළකාලන බාධාවන්ගෙන් නිදහස් වීමට සහ දෙවියන් වහන්සේගේ සේවය සඳහා වඩා පූර්ණ මාර්ගයකින් තමන් කැපකිරීමටත් ය. සුවිශේෂක අනුශාසනා මඟින් ඒවා පිළිපදින්නන් ශු. සභාවට සහ එහි අභිරහසට විශේෂ ලෙස සම්බන්ධ කරයි. ඔවුහු ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍යය පිහිටුවමින් ද එය ශක්තිමත් කරමින් ද විවිධ ප්‍රදේශයන්හි එය පතළ කරති. ඔවුහු ශු. සභාවේ පරිධියෙහි සේවය කරන ධර්මදූතවරුය. විවිධ නිකායන්හි පැහැදිලි විශේෂ ලක්ෂණ ශු. සභාව තුළ ආරක්ෂා කර පෝෂණය කරති.

**කැපවූ ජීවිතයෙහි දිවැසිවර ස්වරූපය**

ජේසුස් ක්‍රිස්තුස් තුමන්ගේ දිවැසිවර සවිඥානය සහ දිවැසිවර ක්‍රියා සුවිශේෂයෙහි අන්තර්ගත වේ. කැපවූ පුරුෂයින් සහ ස්ත්‍රීන් ජේසුස් ක්‍රිස්තුස් තුමන්ගේ අනුගාමිකයින් ලෙස සිය ප්‍රසාද ස්නාපනීය සහ පැවිදි කැපවීම තුළ ගැබ් වී ඇති මෙම දිවැසිවර පරිමාව පිළිබඳව වැටහීමෙන් සිටිති. ඔව්හු නිහඬ පීඩිත ජනතාවගේ හඬ බවට පත්වීම අරඹා ඇත.

ශු. දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා "කැපවූ ජීවිතය" නමැති අපෝස්තලික අනුශාසනයෙහි මෙසේ පවසා ඇත. කැප වූ ජීවිතයෙහි දිවැසිවර ස්වරූපය ක්‍රිස්තුන් වහන්සේගේ දිවැසිවර කාර්යයෙහි පංගුකාර වීමේ විශේෂ ස්වරූපයක් දරයි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව විසින් කැප වූ ජීවිතය තුළ පිළිගන්නා සලකුණු වටිනාකම, ක්‍රිස්තියානි ජීවිතය තුළ දෙවියන් වහන්සේ සහ සුවිශේෂක සත්‍යතාවයන් සතු ප්‍රමුඛතාවයට දිවැසිවර සාක්ෂි දැරීම තුළින් ප්‍රකාශ වෙයි. උන්වහන්සේ තව දුරටත් මෙසේ පවසයි. සභා ඉතිහාසය තුළ ශුද්ධාත්මයාණන්ගේ විශේෂ දීමනා මඟින් දෙවියන් වහන්සේගේ නාමයෙන් සැමටම, සභා එඬේරුන්ට පවා කතා කරමින් නියම දිවැසිවර දූත සේවාවක් ඉටු කරන ලද කැපවූ පුරුෂයින් සහ ස්ත්‍රීන් ජීවත් වූහ යනුවෙනි. (කැ.ජී. 84). දෙවියන් වහන්සේගේ වැඩ සිටීමේ සලකුණු නැතිව ගොස් තිබෙන වර්තමාන ලෝකයට කැපවූ පුද්ගලයින්ගේ සිත් කාවදින සුළු දිවැසිවර සාක්ෂි දැරීම අවශ්‍ය බව උන්වහන්සේ පෙන්වා දෙයි (කැ.ජී. 85).

**✍ ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු
නි.ම.නි. පියතුමා**

ඥානාර්ථ ප්‍රදීපය

දෙවියන් හා බැතිබර සංවාද

## ජන වන්දනාව

ක්‍රිස්තු වර්ෂ 2015
ජනවාරි 25 ඉරිදා

# දැහැමි දිවියෙන් දෙවිඳුන්ට නතු වෙමු




## සාමාන්‍ය සමයේ තුන්වන ඉරිදා

පළමු කියවීම : ජෝනා 3:1-5,10
දෙවන කියවීම : 1 කොරින්ති 7:29-31
සුවිශේෂය : මාක් 1:14-20

පළමු කියවීම තුළ දෙවියන් වහන්සේ ජෝනා දිවැසිවරයා නිනීවය නම් ශ්‍රේෂ්ඨ නගරයට පිටත් කර හරියි. දිනක ගමනකින් නගරය මැදට පැමිණෙන ජෝනා නිනීවය පිළිබඳ සමිඳුන්ගේ විනිශ්චය ප්‍රකාශ කරයි. නිනීවය නම් යහපත් බලවත් ශ්‍රේෂ්ඨ යැයි අප පෙන්වන අපගේම ස්වභාවයයි. නමුත් එහි හදවතට පැමිණෙන පණිවුඩය මනස්ථාපනය වීමටය. ස්වාමින් වහන්සේගේ පණිවුඩයෙන් බැහැපත් වූ නිනීවයේ වැසියන් මනස්ථාපනය වූහ. එවිට දෙවියන් වහන්සේ ඔවුහු පිළිබඳ තම සිත වෙනස් කර ගැනීමට තරම් කරුණාවන්ත වූ සේක.

දෙවන කියවීම තුළ ශු. පාවුළු තුමන් දෙවියන් වහන්සේගේ නැවත පැමිණීම ඉතා ආසන්න බවත් අන් කිසිවක් කෙරෙහි නොව දෙවියන්



වහන්සේගේ පැමිණීමට අවධානය යොමු කර ලෞකිකත්වයෙන් මිදීමට ආරාධනා කරයි.

ශුද්ධවූ සුවිශේෂය තුළින් ස්වාමින් වහන්සේ ගලීලයේ සිදුකරන දේශනාව දක්වයි. එනම් මනස්ථාපනය වන්න දේව රාජ්‍යය ඉතා ආසන්නය යන්නයි. මෙහිදී විජාතිකයන්ගේ ගලීලය ලෙස නම් කර තිබුණ පාපි බවේ හා පහත් බවේ සංකේතයක් වූ නගරයට මනස්ථාපනයේ අවැසිතාව පෙන්වා දෙයි. අද පළමු කියවීම තුළ හා සුවිශේෂය තුළ නගර දෙකක් දක්වයි. ඒ නිනීවය හා ගලීලයයි. ශ්‍රේෂ්ඨ නිනීවයටත් පහත් ගලීලයටත් කාල දෙකකදී පැමිණෙන්නේ එකම පණිවුඩයයි. එනම් මනස්ථාපනය වන්න. පසුතැවෙන්න හා කාලය කෙටියි දේව රාජ්‍යය ආසන්නය යන්නයි. මෙයින් අපට පැහැදිලි වන්නේ ලෝකය කෙලෙස අපව හඳුනාගත්ත ද ශ්‍රේෂ්ඨ හෝ පව්කරුවන් ලෙස නම් කළ ද මේ දෙආකාර පුද්ගලයන්ගේ අභ්‍යන්තරයට උන්වහන්සේ දෙන්නේ එකම පණිවුඩයයි.

ජෙරමියා 17:10 පෙන්වා දෙන පරිදි " සමිඳුන් වන මම මිනිසාගේ සිත සෝදිසිකර බලමි" එයින් අපට පැහැදිලි වන්නේ අපගේ හදවතේ ස්වභාවය අප කුමක් මවා පෑවත් උන්වහන්සේ දන්නා බවයි. උන්වහන්සේ ඉදිරියේ සියල්ල වැස්මක් නැතිව පවතියි. උන්වහන්සේට අපගේ ස්වභාවය විනිවිදව දැකිය හැකිය. අද අපට හදවත විමසන්නට ආරාධනා කරන උන්වහන්සේ තෙහෙලි ගීය තුළ අප කෙලෙස උන්වහන්සේට නතු වී උන්වහන්සේගේ මඟ පෙන්වීම මත රැඳී සිටිය යුතු ද යන්න පෙන්වා දෙයි.

**ගරු චන්දිම කාරියවසම් සහෝදරතුමා**
ගොන්සාල්වෙස් සිංහල ආයතනය
ජාතික දෙව්සත්හල

## සොඳුරු වහලා

රුදුරු නිම්නය මැදින්
ඝනඳුරේ මග හොයන්
කොහේදෝ සිට පැමිණි
අනේ මේ වහලා....

ලක් දෙරණ කුළුණින්
එකලු කරනට සිතා
මොහොතකුදු පසු නොබා
පැමිණියෙකි ඔහු නම්

රුදුරු ඝනඳුර අවි අමෝරා
නැගෑ සිටියදි කුහුලින්
කුරුස කොන්තය දරා
යෝධ ශක්තියෙන් එඩි පෑ
මේ කෙසඟ වහලා....

බිය සැක නොදත්තේ සේ යැ
සටනට පිවිසියේ
සුබ පෙම් හසුන ජේසුගේ
දෙන්න එක එක දනට
ඔවුනගේ හදවත් ඉරා.....

මඟට බට ඔහුට නම්
ලන්දේසි හට පිරිස්
කූඹියන් සේ මැ වී....
　　　නපුරු සීපා සත්තු
　　　පෙම් බසින් හීලෑ වී
මතු වැ ආ විෂ උලින්
හිස් දෙපා හෑරී....
　　　දුන්නු වේදනා ගොන්න
　　　හදට සුවයක් මැ වී....
ජේසුගේ කුරුසියට
බර දිදී වැහැරී
　　　ගියද ඔහු මිනිසෙක් යැ
　　　දේව ගතියෙන් පිරී.....

වියළි හදවත් තෙමා
පෙම් ඉසුරු බෙදා දී
සැදූ ලක් කිතුනුවා
ඔහු රජෙක් කැරැ වී....

සුනිල් බිම් මතැ සතප්වා
ලක් කිතුනු ජනතාව
කදිමයි නැගිය සැටි
සුදු පුදසුන මතට

අති සුන්දර ලෙසින්
ව..හ..ලා... ජුසේ වාස්!

**නිමල් ආර්. ජේ.**

# ඒකම විශ්වාසයේ රැඳී සිටින්න

මාගේ රැකියාවේ සිදු වූ වෙනසක් පිළිබඳවයි. මා මෙසේ පවසන්නේ. එසේ සිදුවූයේ, මම විශ්වාසයේ රැඳී සිටිමින් කන්නලව් කරමින් දෙවි සමිඳුන්ට යාච්ඤා කළ නිසයි. අවු. 6 කට ආසන්න කාලයක් මම නොකඩවා යාච්ඤා කළෙමි. තවද ජේසු සමිඳුන්ට මා ප්‍රශංසා කරමින් ස්තුති වේවායි කියමි.

මම රැකියාව කරන ආයතනයේ කිසිම වරදක් නොකළ මාව, පිළිගැනීමේ නිලධාරිනියක් හැටියට කවුන්ටරයට මාරු කරන ලදි. මා අවු. 5 කට ආසන්න කාලයක් තුළ එහි දිගටම වැඩ කරන ලදි. එහිදී නොයෙකුත් සිත් වේදනාවල් වලින් පීඩිතව, මානසිකව සිත දුකින් වැඩ කරගෙන ගියෙමි. එහෙත් මම නොකඩවා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට යාච්ඤා කළෙමි. මට වූ මේ අසාධාරණය මම ජේසු සමිඳුන්ට පැවසුවෙමි. මම උන්වහන්සේව තරයේම විශ්වාස කළෙමි. එතුමාට මගේ දුක සැමදා පැවසුවෙමි.

මා නොයෙකුත් මාරු වීම් ඉල්ලා ආයතනයේ ප්‍රධානියාගෙන් විමසුවද එය ඉටුවූයේ නැත. පසුව මම ඒ සියල්ල දේව හස්තයට භාර කළෙමි. නමුත් මම දෙවිඳුන් කෙරෙහි ඇති විශ්වාසය මඳක්වත් අඩු නොකළෙමි. නොකඩවාම යාච්ඤා කළෙමි. අවු. 6 ක් ආසන්න වීමට දින 10 ට කලින් මට හදිසියේම වෙනත් අංශයකට මාරුවීමක් ලැබුණි. නමුත් කවුන්ටරයේ පුරප්පාඩු ඇති වූ විට වැඩ බලන නිලධාරිණියක ලෙස මා යා යුතුවයි එය ලැබුනේ. එතන නිලධාරින් නිවාඩු යනවිට සැමවිටම මම කවුන්ටරයේ වැඩ කිරීමට නියමිතව තිබුණි. මෙලෙස වැඩ කරමින් යන අතරතුර අංශ භාර ප්‍රධාන නිලධාරිනිය මා හට පැවසුවේ නැවතත් මාව කවුන්ටරයටම දමන බවයි. එදින මම ඉතාමත් සිත් වේදනාවකින් ඇවෙමින් කාර්යාලයෙන් පිට වී කොම්පඤ්ඤ වීදියේ පිහිටි බිළිඳු ජේසු දේවස්ථානයට ගොස් මේ අසාධාරණය පිළිබඳව පවසා යාච්ඤා කළෙමි. මගේ විශ්වාසය කොයිතරම් ගැඹුරුද කීවොත් මගේ හදවත එයින්ද සැලුනේ නැත. ඉන්පසු මාස 11 ට පසුව හදිසියේම පණිවුඩයක් ලැබුණේ එම කවුන්ටරයට අලුතින් නිලධාරිණියක් බඳවා ගන්නා බවයි. මාව මුලුමනින්ම එම කවුන්ටරයෙන් මුදා හරින ලදි.




මා හට සැනසීමක් දුන් මගේ දෙවි සමිඳුනට සදා ස්තුති ප්‍රශංසා වේවා. ඔබවහන්සේට මා සදා ණයගැති වෙමියි මම පවසමි. මගේ මුළු ජීවිත කාලය තුළම අමතක නොවන මේ සිදුවීම තුළ මම සැමදාම මගේ මුළු හදවතින්ම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට තුති පුදමි.

ඔබත්, ඔබගේ දිවිය තුළ ඇතිවන ප්‍රශ්න දෙවිපියාණන්ට බාර දෙන්න. කොපමණ කලක් ගියත්, විශ්වාසය අත් නොහැර ජේසු සමිඳුන්ට නොකඩවා යදින්න. උන්වහන්සේ අප අත් නොහැර අප ආරක්ෂා කරන සේක. මා හට මගේ විශ්වාසයේ බලය පෙන්වන දෙවිපියාණන් වහන්සේට ස්තුති ප්‍රශංසා වේවා.

**බර්නඩීන්**
වැලිවේරිය

# අපගේ රජාණෝ ක්‍රිස්තු රජාණෝ ම යි

දිනක් මා රෝහලට ඇතුළත් කෙරිණි. මාගේ ගර්භාෂයේ සුළු ශල්‍යකර්මයක් කිරීමට යොමු වී තිබුණි. සියලු කාන්තාවන්ගේ මුත්‍රා, ලේ, පෙෂර් සැම දෙයක්ම පරීක්ෂණයට ලක් කරලයි ඔපරේෂන් කාමරයට රැගෙන යන්නේ. එහි යාමට පෙර මාගේ සියලුම දේවල් පරීක්ෂණය කර හමාරයි. මටත් වාට්ටු හෙදියටත් අමතක වුනු යම් දෙයක් තිබෙන්නට ඇත. එය සාතන්ගෙ පරික්ෂාව විය හැකිය.

කාන්තාවන් සියළු දෙනාම සුදු ඇඳගෙන ඔපරේෂන් කාමරයේ පුටුවල නොම්මර පිළිවෙලට අසුන්ගෙන සිටියහ. සැම දෙයකටම පෙර මාගේ යැදුම මම එම මොහොතේ මතකයට නගා ගතිමි.

ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි යාච්ඤාවයි. එපමණයි මා මිමිණුවේ. මාගේ වාට්ටු බාර හෙදිය හනික දුව විත් මාගේ නම ආමන්ත්‍රණය කරමින් පැමිණියේ මා තව සුළු වෙලාවයි ශල්‍යකර්මයට යාමට සිටියේ. ඇය පැමිණි විගස නැවත වාට්ටුවට ගෙන ගොස් පැවසුවේ "අනේ.. ඔයාගේ ලේ මදිද ශක්තිමත් කියලා පරික්ෂණයක් කරන්න තියෙනවා. දහවල් 12.00 ඔපරේෂන් එකට ඔයාව දාන්න බැහැ. සවස 2.30 ට යවන්න ඕනේ කීවා. ලේ පරික්ෂණයෙන් නිගමනය වූයේ මාගේ ශරීරයට ලේ එකක් දීමයි.

ලේ පයින්ට් 01 ක් මට දෙන ලදි. ඒ වන විට මාගේ ශරීරයෙන් හුගක් ලේ වහනය වූ බැවිනි. බලන්න දෙවියන් වහන්සේ තුළ අපි ඉන්නවා නම් අපගේ මරණය පවා උන්වහන්සේට වැළැක්වීමට පුළුවනි. මා වගේ විශ්වාසයෙන් ඉන්න. අන් දෙවි දේවතාවෝ අදහන්නට යන්න එපා. රූප වන්දනාව අත් හරින්න. ඒවා මිත්‍යා මත. තමාගෙ යහපත් සිතුවිලි තමාව සුවපත් කරනවා. විශ්වාසය ඇති කරගන්න. තමන් අයිති දේවස්ථානයට යන්න. යාච්ඤා කරන්න. සිතේ බරක් පටවාගෙන මුදල් වියදම් කරගෙන අන් දේවස්ථාන වලට ගොස් වඳින්න යන්න එපා. අපගේ ලොකුම රජාණෝ ක්‍රිස්තු රජාණෝ ම යි.

**ශිරානි ජෝශප් වැන්ඩස්ලෝට්**
හිඟුරක්ගොඩ

## ජපමාල අභිරහස්

**සොම්නස් අභිරහස**

| | |
|---|---|
| මංගලම් කීමේ රහස කීකරුකම සහ බැහැපත්කම ඇති | කරවන්ටයි |
| එළිසබෙත් තුමිය බැහැදැකීමේ රහස පරහට දයාව ඇති | කරවන්ටයි |
| බිළිඳු උත්පත්තියේ රහස සිත්හි දිළිඳු බවින් සතුටුව දවස් | ගෙවන්නටයි |
| දේව මාළිගයේ පුද කිරීමේ රහස අප ආත්ම දේව දර්ශනයට ඔප්පු | කරන්නටයි |
| දේව මාළිගයේ තනිව සිට සම්බ වීමේ රහස පාපයෙන් දේව දර්ශනය මුලාසි | නොවෙන්නටයි |

**දොම්නස් අභිරහස**

| | |
|---|---|
| මල් උයනේ දුක් විඳීමේ රහස අප ඉල්ලීම් දේව කැමැත්ත අනුව ඔප්පු | කරන්නටයි |
| ගල් කණුවේ කස පහර විඳීමේ රහස අප පව් වලට ලැබෙන අච්චු | ඉවසීමටයි |
| කටු ඔටුන්න පැළඳවීමේ රහස මෙලොව ඇති මාන්නයට ආශා | නොවෙන්නටයි |
| කුරුසිය උසුලාගෙන යෑමේ රහස පව් බරින් අපට යෙදෙන කොයි දුකත් | උසුලන්නටයි |
| කුරුසියෙහි උකුත් වීමේ රහස මෙලොව සැප නැස්පැත්ති බව සිහි | ගන්වන්නටයි |

**මෝක්ෂ අභිරහස**

| | |
|---|---|
| උත්ථාන වීමේ රහස වූයේ අප හට සදාතන ජීවනය ලැබ | දෙන්නටයි |
| ස්වර්ගාරෝහණ වීමේ රහස අපටත් පරලෝක මාර්ගය අත්නොහැර | පවතින්ටයි |
| ශුද්ධාත්ම වැඩම කිරීමේ රහස ස්ප්‍රීතු සාන්තු ප්‍රසාද අප හට ලබා | ගැනීමටයි |
| ස්වර්ගාරෝපණය වීමේ රහස ශරීර පිටින් පරලොවට යන්නට වරම් ලබා | දෙන්නටයි |
| ස්වර්ග රාජ්‍යයෙහි ඔටුනු පැළඳවීමේ රහස අන්තිමේදී මෝක්ෂය ලබා | ගැනීමටයි |

**ආලෝකයේ අභිරහස**

| | |
|---|---|
| බෞතිස්ම ස්නාපනයේ රහස අප කෙරෙහි පියාණන්ගේ ප්‍රසන්න භාවය | ඇසීමටයි |
| විවාහ මංගලෝත්සවයේ රහස මරිය තුමියගේ මැදිහත්වීම අත් | දැකීමටයි |
| දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමේ රහස දේව රාජ්‍යය උරුම කරගන්නට වරම් ලබා | දෙන්නටයි |
| දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීමේ රහස ජේසු සමිඳු සමඟ ජීවත් වීමට වරම් | ලබා ගන්නටයි |

**නිර්මලා රත්නායක,** සා. පීතර විදුහල, කොළඹ 04



# නිමල මව් තොමෝ

කරුණා පාලා අප සනසාලා
පිහිටක් වූ අම්මේ
සෙනෙහස පාලා අප සැම සුරැකූ
පෙම්බර දෙව් අම්මේ
මඟ පෙන්වාලා අත හිත දීලා
අප සැනසූ අම්මේ
මංගල සිරියෙන් මඟ සරසාලා
ඔබ පිළිගමු අම්මේ
ජීවිත ගමනේ බර ගෙන යන්නට
දිරි දුන් දෙව් මව්නේ
කරුණා ගුණයෙන් අප පුරවන්නට
මැදිහත් වූ අම්මේ
ආදරයෙන් රැකවරණය ලැබ දුන්
දෙව් මව් කුමරියනේ
මෙවරත් ඔබගේ මංගල දිනයේ
තුති පුදනෙමු අම්මේ

**එවරෙස්ටා ප්‍රනාන්දු**
උතුරු පයාගල

පාඨකයින්ගේ ප්‍රතිචාරය

# ජනතා හඬ

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා

# මන්නාරම් රදගුරු හිමි ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ආශිර්වාද කිරීම අවමානයට ලක් කිරීම සම්බන්ධවයි



**කතුතුමනි,**

ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා මන්නාරම් රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණන් බැහැදුටු මොහොතේ හිසට අත තබා ආශිර්වාදය දානය කර තිබිණි.

එම අවස්ථාව අපහාසාත්මක අන්දමින් විවේචනයට ලක් කරමින් එදා ආණ්ඩු පක්ෂයේ විමල් වීරවංශ මහතා මාධ්‍ය ආයතන කිහිපයකින් (ජාතික රූපවාහිනී නාලිකාව, ස්වාධීන නාලිකාව, දෙරණ නාලිකාව) එම ආශිර්වාද කිරීම රදගුරුතුමන් මෛත්‍රීපාල මහතාගේ හිස අතගෑමෙන් එතුමාට අන් තිබේදැයි පරීක්ෂා කිරීමක් කළ බව ප්‍රචාරය කරන ලදී. එය ඔහුගේ අනුවණකම හා හිතේ ඇති ඊර්ෂ්‍යාව මෙන්ම දේශපාලනික වෛරයේ ප්‍රතිඵලයක් බව කිව හැක. ඔහු කළ මේ ක්‍රියාව හා අපහාස කිරීම කිතුනු බැතිමතුන් වශයෙන් බලවත් අප්‍රසාදය පළ කරමින් එය තරයේ හෙළා දකිමු.

**එම්. කේ. පෙරේරා**
සිංහාරමුල්ල

# ජුසේතුමාට දාව සමිඳාණන් වහන්සේ උපන්නේද?

**කතුතුමනි,**

පසුගිය සති අන්ත ශ්‍රී ලංකාදීප පුවත් පතක 'නත්තලේ අරුත' මැයෙන් ගරු බෙනඩික් ජෝශප් පියතුමා විසින් ඉදිරිපත් කළ අදහස් වලට වැරදි අවබෝධයකින් යුතුව ලිපියක් සකස් කරන අසුන්තා එදිරිසූරිය එහි ජේසුස් වහන්සේගේ උපත මෙලෙස සඳහන් කරයි.

'ජුසේතුමාටයි, මරියතුමියටයි දාව මෙලොව උපත ලද සාමයේ බිළිඳා ලෝකයේම සුවිශේෂී අයකු විය.' මෙය ජේසුස්වහන්සේගේ උපත පිළිබඳව ශු. බයිබලයේ සඳහන් ආකාරයට සම්පූර්ණයෙන් වැරදි සහගත ලෙස ලියන ලද වාක්‍යයක් බව පැහැදිලිය.

එමනිසා ජේසුස් වහන්සේගේ උපත ශු. බයිබලයේ සඳහන් පරිදි පහත සඳහන් ලෙසින් නිවැරදි විය යුතුය. 'ජාකොබ්ට දාව මරිය තුමියගේ පුරුෂයාවූ ජෝසෙප්ද උපන්නේය. මරිය තුමියගෙන් ක්‍රිස්තුස් නම්වූ ජේසුස් වහන්සේ උපන් සේක.' (මතෙව් 1:16) "දාවිත්ගේ පුත් ජෝසෙප් ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට බිය නොවන්න. මන්ද ඇය ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි' (මතෙව් 1:20).

**කේ. නිහාල් ප්‍රනාන්දු**
බෝලවත්ත

# සාන්ත නිකුලස් තුමන්ට නින්දා කළ දෙරණ වැඩසටහන

**කතුතුමනි,**

නත්තලට පෙර ඉරුදින 21 සහ 25 නත්තල් දින දෙරණ නාලිකාවෙන් විකාශනය වූ 'දෙරණ චැම්පියන් ස්ටාර්ස්' වැඩසටහන කතෝලික ආගම මහත් පහත් ලෙස අවමානයට පත් කළ වැඩසටහනක් බව එය නිශ්පාදකවරුන් වෙත දන්වා සිටිමු. එහි නත්තල් සීයා වශයෙන් දෙදෙනෙක් රඟපෑවේ නින්දා සහගත ලෙසය. නත්තල් සීයා කවුරුදැයි මෙම නිෂ්පාදකයන් නොදන්නවා විය හැක. මෙම ජනමාධ්‍ය රූප රාමුව මේ ආකාරයෙන් සරසා ඇත්තේ එබැවිනි.

නත්තල් සීයා යනු සාන්ත නිකුලස් මුනිතුමන්ය. උන්වහන්සේ රදගුරු තුමෙකි. එම තනතුරට ආවේනික නිල ඇඳුම වන රතු ලෝගුවක්, බස්තමක් දිගු තොප්පියක් යොදා ගෙන ඇත. කතෝලික බැතිමතුන් විසින් පිදෙන ශුද්ධවරයෙකි. මෙම වැඩසටහන එම සාන්තුවරයා සම්බන්ධයෙන් ගරහන අසංවර අත්දැකීමක් බවට පත්කිරිම කනගාටුවට කරුණකි. සිත් කම්පා කරවන්නකි. මෙම වැඩසටහනේ නත්තල් සීයා වශයෙන් රඟ දැක් වූ දෙදෙනා මහත් බඩක් ඇතිව ඇඳුම් විලාසයන් පැළඳ ගනිමින් විකාර පුද්ගලයකු ලෙස කාන්තාවන් සමග නැටුම් විලාසයක් දැක්වීමෙන් ද, මහත් අවමානයක් උන්වහන්සේට දක්වා ඇත.

සාන්ත නිකුලස් මුනිතුමා දුගී අසරණයන් හා දරුවන් වෙත රහසිගතව රාත්‍රියේ දී ත්‍යාග දීම වූ හෙයින් එම ක්‍රියාදාමය සංකේතවත් කරමින් මල්ලක් කරේ එල්ලා ගැනීම මනුෂ්‍යයන් විසින් පිළිබිඹු කළා මිස උන්වහන්සේගේ සැබෑ ජීවිතයේ දී එවැන්නක් වූයේ නැත. එහෙත් මෙම වැඩසටහනේ දී මෙම අර්ථය සම්පූර්ණයෙන් කනපිට හරවමින් රඟපාන්නන්ගේ කද මල්ලක් එල්ලාගෙන රඟ දැක් වූයේ නැටුම් නටන්නන් වෙතය. ඔවුන්ට තෑගි දීමටය. මෙය ද සාන්තුවරයා වෙත දක්වන්නා වූ නින්දා අපහාස ක්‍රියාවකි. මෙය කතෝලික බැතිමතුන්ගේ හද කම්පා කරවන්නකි. කමාව ඇයද යුතු කරුණකි. එපමණක් නොව ඉදිරිපත් කළ ගීත නත්තල් සමයට නොහොබින ගීතයන්ය. ආගමික සම්බන්ධතාවයකින් යුත් වැඩ සටහන් එලෙසින් ඉදිරියෙ දී ඉදිරිපත් නොකරන ලෙසට අපි කාරුණිකව දෙරණ වැඩසටහන් නිෂ්පාදකයන්ගෙන් ඉල්ලා සිටිමු.

**මෙල්වින් ද කොස්තා**
පල්ලන්සේන

# දේව අභිමතයට යටවු කේන්දරය සහ සුබ නැකත



**කතුතුමනි,**

ශ්‍රී ලංකාවේ සත්වන ජනපතිවරණය පසුගියදා නිමාවූයේ හිටපු ජනපතිවරයාගේ ප්‍රබලම ප්‍රතිවාදියාවූ මෛත්‍රීපාල සිරිසේන මහතාට පහසු ජයක් අත්කර දෙමින්ය. මේ අනුව පසුගිය ජනවාරි මස 09 වන දින පස්වරුවේ ඉතාමත්ම චාම්, එහෙත් අභිමානවත් ලෙස එතුමා ශ්‍රී ලංකාවේ 6 වන ජනාධිපතිවරයා ලෙස දිව්රුම් දුන්නේ සිය අග්‍රාමාත්‍ය වරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතාව පත්කරග නිමින්ය.

රාජකීය ජ්‍යොතිර්වේදීන්, පේන කියන්නන්, නක්ෂත්‍රකරුවන්, දෛවඥයින් හා කේන්දර, සුබහෝරා පිළිබඳව දැඩි විශ්වාසයකින් පසුවූ හිටපු ජනාධිපතිවරයා සිය ධූරකාලය අවසන් වන්නට තවත් වසර දෙකක් ඉතිරිව තිබියදී සිය රාජකීය දෛවඥයා විසින් සාදා දුන් කීර්තිමත්ම දිනයට/ නැකතට රැවටී වැඩි ප්‍රතිඵල පතා ඉක්මන් ජනපතිවරණයක් පවත්වා දැඩි පරාජයකට මුහුණදෙමින් පසුගිය 9 වන දින සවස් යාමයේ එතෙක් තමා භුක්ති විඳගෙන ආ මුල් පුරවැසි භූමිකාවට සහ සියළුම වරප්‍රසාදයනට ආයුබෝවන් කියා හිස් අතින්ම ගම්බිම් බලා පිටව ගියේ අනපේක්ෂිතවය. (ඇතැම් විට තම හිතවත් රාජකීය දෛවඥයා ජනප්‍රියම නැකත සාදා දුන්නේ විපක්ෂයේ අපේක්ෂකයාට ජය ලබා දෙන්ට යන්නද සැකයකි.)

තවත් ජ්‍යොතිෂවේදියකු එක්තරා රූපවාහිනී සාකච්ඡාවකදී පුන පුනා කියා සිටියේ අනිවර්යයෙන්ම මහින්ද රාජපක්ෂ මහතා නක්ෂත්‍රයට අනුව විශිෂ්ට ජයක් ලබන බවත්, එසේ නොවුන හොත් අදාල නාලිකාව ඉදිරියේදී සිරුරට ගිනිතබා ගන්නා බවත්ය. කෙසේ වුවද මිථ්‍යා විශ්වාසයන් පසු පස හඹා යමින්, සුබ හෝරා, සෙනසුරු අපල, රාහු කාල, ග්‍රහදෝෂ වැනි විවිධ මායාවන් පසු පස හඹාගොස් සිය ධනය, කාලය, ශ්‍රමය කැපකොට දෛවඥයින්, කේන්ද්‍ර බලන්නන්, නක්ෂත්‍ර කරුවන්, පේන කරුවන් පසු පස හඹා යන සැමටම කදිම ප්‍රසිද්ධ පාඩමක් ප්‍රසිද්ධියේම වටහා දෙමින් නක්ෂත්‍ර කරුවන් කුනු බක්කියටම වැටුනේ එදා දෙවියන් වහන්සේ මවන ලද ලෝකයේ ගෙවීයන සැම හෝරාවක්ම, මිනිත්තුවක්ම, තත්පරයක්ම සුබ මොහොතක්, සුබ හෝරාවක් බැව් තවදුරටත් පසක්කර දෙමින්ය. මිථ්‍යා විශ්වාසයන්ගෙන් බැහැරව සත්‍යය දකින්නට / දෙවියන් වහන්සේව දැකගන්නට පසුගිය ජනපතිවරණය කාටත් කදිම පාඩමකි.

ව්‍යවස්ථාව අනුව, බල ලෝභයෙන් තොරව ඉතිරි දෙවසර සන්සුන්ව සිය මුල් පුරවැසි වගකීම කරටගෙන ජනතාවට හැකි පමණින් සහන ලැබදී රජෙකු මෙන්, විශිෂ්ටයකු ලෙසින් ත්‍රිවිධ හමුදාවේ විශේෂ ගෞරවාචාරයන් සහ ජනතාවගේ ඔල්වරසන් මැද නම්බු පිටින් සිය තනතුරින් ඉසිඹු ලබා ධර්මිෂ්ඨ පාලකයකු ලෙස සිය තනතුරින් සමුගන්නට හිටපු ජනපතිවරයාට තිබූ මහඟු අවස්ථාව දෛවඥයින් විසින් අවසන් කළේ මිථ්‍යා විශ්වාසයන් පසු පස හඹායන සියල්ලන්ගේ දෙසවන් විවරකරමින්ය.

**එම්. ජෝ. පාරිස්**
වැලිවිට

# ජේසු පිහිටයි බැනර් එල්ලන්නේ බයටද?

**කතුතුමනි,**

කතෝලික ප්‍රජාව විසින් තම තමන්ගෙ අවශ්‍යතාවය මත නිවාස, ගොඩනැගිලි ඉදිකිරීමේදී එහි පියස ගැසීමට පෙර හෝ පසුව ක්‍රිස්තුන් වහන්සේගේ රුව සහිතව 'ජේසු පිහිටයි' 'දෙවි පිහිටයි' යන වදන් ලියූ බැනරයක් ඉදිරිපිට සවි කිරීමට මෑතක සිට පෙළඹී ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

සැබෑ වූ ක්‍රිස්තුන් වහන්සේගෙ රුව සහිත බැනරය මෙසේ සවි කිරීමේදී හිරුගෙ රශ්මියට පිච්චෙමින්, වැස්සට තෙමෙමින්, සුළඟට ඒ මේ අත වැනෙමින් කාලයාගේ ඇවෑමෙන් ඉරී පරඬැලක් සේ දැකීම ඉතාම ශෝචනික තත්ත්වයක් ලෙස සනිටුහන් කරන්නෙ හදපිරි වේදනාවකිනි.

ක්‍රිස්තුන් වහන්සේ මුළු මිනිස් සංහතිය පවෙන් මුදා ගැනීමට එදා කුරුසියේ දිවිපිදූ සේක. ලෝකය වෙනුවෙන් එදා තම ජීවිතය පරිත්‍යාග කළත් අද මිනිසුන් තුළ පවතින වැරදි ආකල්ප නිසා උන්වහන්සේගෙ ශාන්ත රුවට හෝ සැනසීමක් නොදීම ඉතාම කණගාටුදායකය.

කතෝලිකයන් සුළු පිරිසක් වෙසෙන අප මව්බිම තුළ අනෙකුත් ආගමිකයන් අතර ක්‍රිස්තුන් වහන්සේට ඉතාම මිලෙච්ඡ ලෙස වැරදි ආකල්ප සිත්හි තබාගෙන හැල්ලුවකට ලක් කිරීම කතෝලිකයන් වූ අපට මදි පුංචි කමක් ඇති නොවන්නේද?

දැන හෝ නොදැන කරන්නාවූ මෙවන් අයහපත් අදෘශමාන ක්‍රියා, නවතාලීම පරම පවිත්‍ර වූ ශාස්තෘන් වහන්සේගේ කතෝලික ධර්මය හැල්ලු නොකර ආරක්ෂා කිරීමට කිතුනුවන්ගෙ යහපත් දායකත්වය මේ සඳහා මහඟු පිටිවහලක් වනු නිසැක බව මාගේ විශ්වාසයයි.

**අනුර ශාන්ත පීරිස්**
හලාවත

# සිඟිති දරුවන්ට අර්ථවත් දේ කියා දෙමු

**කතුතුමනි,**

කුඩා දරුවන්ට හොඳ සිරිත් - විරිත්, යහපත් දේ කියා දීම වැඩිහිටියන් සතු සුවිශේෂී වූ වගකීමකි. එයින් වැදගත් කරුණක් වන කුඩා දරුවකු යමකුට ආමන්ත්‍රණය කිරීමේදී ආශිර්වාද වචන තෙපලීම ඉතා වැදගත්ය.

එහෙත් වර්තමානයේ කිතුනු වැඩිහිටියන්, දෙමාපියන්, පවා නිස්සාර හිස් වචන සිඟිති දරුවනට සිය කිරි කැටි මුවින් තෙපලීමට පුරුදු පුහුණු කර තිබීම කණගාටුවට කරුණකි. එනම් ටටා, බායි, වැනි කිසිදු තේරුමක් වැදගැම්මක් නැති හිස් වචන ඒ අතර විරළය.

පෙර කල වැඩිහිටි, දෙමාපියෝ ජේසු පිහිටයි, දේව මෑණියන්ගේ පිහිටයි යන ආශිර්වාද වටිනා වචන දරුවනට අන් අය ආමන්ත්‍රණය කිරීමට කියා දුන්හ. එනිසා 'ටටා' 'බායි' යන හිස් වචන අතහැර දේව ආශිර්වාදය ලැබෙන ඉහත සඳහන් කළ 'ජේසු පිහිටයි' දේව අම්මාගේ පිහිටයි යන භක්තිමත් වැකි කිතුනු දරුවන්ට ආමන්ත්‍රණය සඳහා පුරුදු පුහුණු කිරීමත් එයම ඔවුන්ගේ ජීවිත වලට ආශිර්වාදයක් වනු ඇත.

**ලූෂන් එඩ්වඩ් පෙරේරා**
ගෝනවල



# කැලණි පුර කිතු අභිමන ලොවට කියූ
# ෆ්‍රැන්සිස් සාලෙස් දෙව් විමන





අභිමානවත් දලුගම ඉපැරණි දෙව්මැඳුර

“කොයි නමින් වුවද දහමට කවුරුත් ප්‍රිය කළහ. සුසිත් සැම දෙන බුදු දහමටත් කිතු දහමටත් ගරු කළහ. මේ පෙදෙස්හි කිතු දහමේ මුල් තැන ගත්තේ දලුගම ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් දෙව්මැඳුරය.” (දලුගම මීසම් පාලනාධිපති ආර්. ඩී. චාල්ස් පියතුමා - 1965)

ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලයේ දලුගම ග්‍රාමයේ සුරැකි මුනිවරයාණන් වශයෙන් හැඳින්වෙන ෆ්‍රැන්සිස් ද සාලෙස් මුනිතුමන් වෙනුවෙන් මෙම දෙව් විමන ගොඩ නැංවූයේ මින් වසර 150 කට පෙර එනම් ක්‍රි.ව. 1865 වර්ෂයේ දී ය. මෙම ඓතිහාසික දෙව්මැඳුර 2015 වර්ෂයේ දුරුතු මස 24 - 25 දෙදින වසර 150 ක ජයන්තිය සමරනුයේ මහත් අභිමානයක් පෙරදැරි කරගනිමිනි. මෙම ජුබිලි මහෝත්සවය ආධ්‍යාත්මික සූදානම පෙරදැරි කරගෙන පැවැත්වීමට මීසම් සේවක ගරු ජූඩ් ශාමන් ප්‍රනාන්දු පියතුමන්ගේ සහ මීසම් සහයක ගරු රෝෂන් ජනක පියතුමන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් සියලු කටයුතු සූදානම් කර ඇත.

සා. ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමන් සාන්තුවර තත්ත්වයට ඔසවනු ලැබුයේ 1665 වර්ෂයේ දීය. එයින් සියවස් දෙකක් ඉක්ම ගිය පසුව 1865 වර්ෂයේ දී දලුගම ග්‍රාමයේ සා. ෆ්‍රැන්සිස් මුනිතුමන් නමින් දෙව්මැඳුරක් ගොඩනගනු ලැබීය. ඒ මුනිවරයාණන් නමින් සිරිලක ඉදි කරන ලද ප්‍රථම දෙව් විමන වශයෙනි.

මෙම දෙව්මැඳුර ගොඩනැංවීමේ කාර්යයේ දි ඉතා කැපවීමකින් යුතුව එම කාර්යයේ නියමුවරුන් වශයෙන් කටයුතු කළ නිර්මල මරිය නිකායික ගරු කන්ජිමනාදන්, ගරු මතායෙස් කයිතානෝ සහ ගරු මාවර් යන පියතුමන් අප සිහිපත් කරනුයේ අති මහත් භක්තියකිනි.

1602 දී ජිනිවාහි අගරදගුරු ධුරයට පත් වූ අප මුනිවරයාණෝ නීති විශාරදයෙක් වූහ. රාජ්‍ය තාන්ත්‍රික කටයුතු පිළිබඳ පුළුල් දැනුමක් පැවති කෘතහස්ත ලේඛකයකු වශයෙන් එතුමන් හැඳින්විය හැකිය. එතුමන් අතින් රචිත ග්‍රන්ථ අද වන විට විශ්ව විද්‍යාල අධ්‍යයන මූලාශ්‍ර බවට පත් වි ඇත. උන්වහන්සේගේ එක් කෘතියක් නිර්මල මරිය නිකායික ඩී. ජේ. ඇන්තනි පියතුමා විසින් ‘ආත්මික සටන’ නමින් සිංහල බසට පරිවර්තනය කර ඇත.

ජිනීවා අගරදගුරු ධුරය හෙබ වූ අප මුනිවරයාණන්ගේ දේවස්ථානය තුළ මීසම් පාලනයේ සහ සහයක මීසම් සේවයේ කටයුතු කළ ගරු පියතුමන් රැසක් රදගුරු ධුරයෙන් පිදුම් ලැබීම අප සාන්ත ප්‍රැන්සිස් සාලෙස් මුනිවරයාණන්ගේ මහිමාන්විත බවට කදිම නිදසුනකි. කුරුණෑගල විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්, එහි වත්මන් රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්, කොළඹ සහයක රදගුරුවරුන් වන අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන් ආදි වූ රදගුරුවරුන් අප මීසමට සැබැවින්ම අභිමානයකි.



දලුගම මීසම සරු දහම් කෙතකි. එය අස්වැද්දීම සඳහා වසර 150 තුළම ගරු පියවරුන් අතින් විවිධ කැපකිරීම් සිදුකර ඇත. එම දහම් කෙත තුළින් කිතුනු සභාවට පිදුනු පූජක පුතුන් ගණන 13 ක් පමණ ද, ගරු පැවිදි සොයුරියන් විශාල පිරිසක් ද විය. ඔවුන් මෙකී දහම් කෙතෙහි නිසි ඵල ලද්දෝ ය.

අතීතයේ දලුගම කේන්ද්‍ර කර ගනිමින් මිහිරිගම දක්වා විශාල බල ප්‍රදේශයක ආගමික මෙහෙවර ඉටු කරන ලද දලුගම මීසම තුළින් සිදු වූ සාසනික හා සමාජීය මෙහෙවර අපමණය. පසු කලෙක දී කිරිමැටියාගාරය, කඩවත, එඬේරමුල්ල, කුරුකුලාව, ඇල්දෙණිය තනි මීසම් බවට පත් වූ අතර පිළපිටිය, කැලණිය, පෑලියගොඩ ආදි ප්‍රදේශ දලුගම මීසමෙන් වෙන් විය. මෑතක් වෙන තුරු අප මීසමට අයත්ව පැවති සපුගස්කන්ද නව මීසමක් ලෙස ගොඩනැගුනේ මාබිම හා මාකොළ දේවස්ථාන ඇසුරිණි.

1923 දී ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමන් ලේඛකයින්ගෙත් මුද්‍රණ ශිල්පින්ගෙත්, පුවත්පත් කලාවේදින්ගෙත් ආරක්ෂක සාන්තුවරයා වශයෙන් ශුද්ධවූ සභාව මඟින් ප්‍රකාශයට පත් කරන ලදි. ක්ෂේත්‍රය තුළ දස්කම් පෑ ඇල්ෆ්‍රඩ් පෙරේරා, ඇනස්ලි ඩයස්, රවින්ද්‍ර රන්දෙනිය, මොරිස් බොල්ලෑගල, වින්සන් රුද්‍රිගු, ජූඩ් ඩෙන්සිල් පතිරාජ ආදී ජනමාධ්‍යවේදීන්, ලේඛකයන්, රංගධරයින්, කවීන් බිහි වූයේ දලුගම මීසම තුළිනි.

චතාරික සමයේ දී ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛප්‍රාප්තිය සැමරීම සඳහා මාබිම කල්වාරි පුදබිම නිර්මාණය කිරීමේ දී ද දලුගම මීසමෙන් සිදුවූ මෙහෙය අප්‍රමාණය. ගරු ලියෝ පෙරේරා හා හෙන්රි ද සිල්වා පියවරුන් මෙහිදී ලබා දුන් මාර්ගෝපදේශකත්වය කෘතවේදිව සිහි කළ යුතුය. සියවස් ජයන්ති සමයේ එවකට මීසම් සේවක ආර්. ඩී. චාල්ස් පියතුමන්ගේ මඟ පෙන්වීම ද 125 වන ජයන්ති සමයේ ගරු හයසින්ත් පෙරේරා පියතුමන්ගේ මඟ පෙන්වීම ද නොඅඩුව ලද බවට අප දේවස්ථානයේ ඉතිහාසය සාක්ෂි දරයි. දෙව්මැඳුර පිළිසකර කිරීමේ කාර්යයේ දී ගරු සිසිල් කුමාර පියතුමන්ගේ සේවය ද පැසසිය යුතුය.

සාන්ත ෆ්‍රැන්සිස් දෙව්මැඳුරේ වත්මන් නියමුවාණන් වශයෙන් කටයුතු කරන ගරු ජූඩ් ශාමන් ප්‍රනාන්දු පියතුමන්ගේ මෙහෙවර ද අපගේ පැසසුමට බඳුන් විය යුතුමය. 150 වන ජයන්තිය වෙනුවෙන් ප්‍රදේශයේ ක්‍රිස්තු භක්තිකයන්ගේ ආධ්‍යාත්මික පෙළගැස්ම උදෙසා ගරු පියවරුන්ගේ මෙහෙයවීමෙන් දින 21 ක ධර්ම විවේකයක් පැවැත්වීමට මීසම් සේවක පියතුමන් කටයුතු සම්පාදනය කළහ. 150 වන සැමරුම ඉතා ගැඹුරු ආධ්‍යාත්මයක් ඇතිව සැමරීමට ද එකී ධර්ම විවේකය ඉවහල් වූ බව අපි විශ්වාස කරමු. දෙව්මැඳුරට පැමිණෙන ඕනෑම අයෙකුගේ සිත් සතන් නිවී සැනහී යන පරිද්දෙන් එහි භෞතික පරිසරය ගොඩනැංවීමට ද ජූඩ් ශාමන් ප්‍රනාන්දු පියතුමන් ගත් මෙහෙය උත්කෘෂ්ට වේ. දේවස්ථානයේ වම්පස වල් බිහි වී තිබූ ප්‍රදේශය කළ එළි කරමින් චතාරික භක්ති අභ්‍යාසයන් සඳහා අලංකාර පාද නමස්කාර භූමියක් ද, ඉටිපන්දම් දැල්වීම සඳහා අලංකෘත ඉටිපන්දම් ගෘහයක් ද ඉදිවූයේ මීසම් සේවක පියතුමන්ගේ පූර්ව සැලැස්මකට අනුවය. මෙතෙක් අප දේවස්ථානයට මහත් අඩුවක්ව පැවති මීසම් ශාලාවක සිහිනය යථාර්ථයක් කරවමින් ඉදි වූ අභිනව ශා. ප්‍රැන්සිස් ජුබිලි ශාලාව එළඹෙන 25 වන ඉරුදින කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සුරතින් විවෘත වීමට නියමිතය. එය සමස්ත දලුගම පුරවරයටම ආශිර්වාදයක් වනවා නොඅනුමානය. එදා සිට අද දක්වා මෙම දේවස්ථානයට අවැසි නායකත්වය හා මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් කටයුතු කළ සියලු පියතුමන්ලා ගෞරවයෙන් සිහිපත් කිරීම කිතුනු අපගේ යුතුකමකි.

දශක පහලොවක අභිමානය අඛණ්ඩව මතු අනාගතයට ද ගෙන යෑමට අවැසි ශුද්ධාත්ම ආශිර්වාදය ලැබේවායි අපි ඉති සිතින් පතමු.

G. D. **සංජුල ජනිත්**
දලුගම

# ලොව සරසන ජේ
# පුංචි

## (ධර්මදූත ළමා ඉරුදින වෙ
## වැඩිහිටියන්ට ඉදිරිපත්

එදා කන්ද උඩ දේශනයේදී ජේසුතුමා තමන්ට ඇහුම්කන් දීමට ආ සෙනඟට කීවේ : "ඔබ පොළවේ ලුණුය...... ඔබ ලෝකයේ ආලෝකයය......" කියාය. (මතෙව් 5/13-14). ඒ සමගම එතුමා අහනවා: "ලුණෙහි ලුණු ගතිය නැති වුවහොත් එයට ලුණු රස කවන්නේ කුමකින්ද?" කියා. (මතෙව් 5/13 ).

එහෙම උනොත් ඒවා ඉවත දමනු ලබන්නට මිස වෙන කිසිවකට සුදුසු නැති බවත් එතුමා අපට මතක් කර දෙනවා. එවගේම එතුමා කියනවා : මිනිස්සු පහනක් දල්වා එය බඳුනක් යට නොව පහන් රුකක් මත තබයි. එවිට එය ගෙදර වැසි සියල්ලන්ට එළිය දෙයි/ කියලා. (මතෙව් 5'15). ඒ එසේමයි...... මෙයින් එතුමා අපට දෙන පණිවුඩය තමා : මිනිසුන් ඔබගේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයෙහි වැඩ වසන ඔබගේ පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස, ඔබගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබලවන්න./ යන්න. (මතෙව් 5'16). මේ සමිඳු ඔවදන වැඩිහිටි අප හැමෝටම මෙන්ම කුඩා දරුවන්ටත් බව අපි සිහියට ගනිමු.

මේ වසරේ ධර්මදූත ළමා ඉරුදිනත්, එවගේම මුළු වසර පුරාවටත් ධර්මදූත තේමාව තමා : ඃලොව සරසන ජේසුගේ මල් වෙමු, පුංචි අපි...../ යන්න. අප ලෝකය, අප ජීවත් වෙන සමාජය රස ගන්වන්නට හා ආලෝකමත් කිරීමට අප හැමට ජේසුතුමාගෙන්ම ආරාධනයක් ඇතුවා සේම, අප ලෝකය, අප සමාජය, ලස්සන කරන්නටත්, සුවඳවත් කරන්නටත්, අප හැමෝටම මෙන්ම, වැඩියෙන්ම





කුඩා දරුවන්ට ඇති කැඳවීම හා වගකීමයි, මේ තේමාවෙන් අපට මතක් කර දෙන්නේ.
ඔව්, අප ජීවත් වෙන පරිසරය, සමාජය හා අප ලෝකය, අද සෑහෙන්ඩ කැත වෙලා, අවලක්ෂණ වෙලා, අපවිත්‍ර වෙලා. නරක වචන, නරක'කැත වැඩ හැම තැනකම. බොරුවයි සමාජයේ රජ කරන්නේ. කුඩා දරුවන්ට පවා ඇසෙන්නට දකින්නට ඇත්තේ මේ කැත වචන හා නරක'වැරදි ක්‍රියාවන්මයි. දූෂණය, වංචාව, පගාව අප සමාජයේ අස්සක් මුල්ලක් නෑර, උස් පහත් භේදයකින් තොරව. කුඩා දරුවන්ට පවා කිසිම බේරුමක්



### ශුද්ධාසනීය ධර්මදූත ළමා සමාජය

1843 ප්‍රංශයේ නැංසි නුවර චාල්ස් ෆොබැන්ද ජැන්සන් රදගුරුතුමන් විසින් මෙම ළමා සංගමය ආරම්භ කරන ලද්දේ, කුඩා දරුවන්ගේ පිරිහී ගිය කිතුනු දිවිය නැවත පෝෂණය කරන්නටත්, කිතු සමිඳුන් ගැඹුරින් හඳුනාගෙන ඒ අනුව දිවි ගෙවන්නටත්. එම කැපවීම තුළින් ලෝකයේ ඕනෑම රටක ළමුන්ගේ අවශ්‍යතාවයන් වෙත දරුවා යොමු කිරිමටත්ය.

### 2014 ධර්මදූත අරමුදලට ඔබ අත දී ඇත්තේ මෙලෙසයි.

| පදවිය | අරමුදල |
|---|---|
| අනුරාධපුරය | 67,660.00 |
| බදුල්ල | 82,650.00 |
| හලාවත | 563,062.00 |
| කොළඹ | 1,725,655.75 |
| ගාල්ල | 88,292.00 |
| යාපනය | 258,492.00 |
| මහනුවර | 295,113.00 |
| කුරුණෑගල | 216,443.00 |
| මන්නාරම | 265,166.00 |
| රත්නපුර | 100,177.00 |
| ත්‍රිකුණාමලය | 90,000.00 |
| මඩකලපුව | 84,622.00 |
| එකතුව | 3,837,332.75 |

# සුගේ මල් වෙමු, අපි...

## නුවෙන් දෙමාපියන්ට හා කෙරෙන පණිවුඩයකි)




නැහැ- ගැලවීමක් නැහැ.

ඒ එසේ නම්, ජේසුගේ මල් යන - අප ලෝකය, ලස්සන කරන්නට, සුවඳවත් කරන්නට අපට දී ඇති මේ පුංචි මල් කැකුළුවන් කුඩා දරුවන් ර බලා ගැනීමට, ඔවුන් ආරක්ෂා කිරීමට, පූජකයන්, පැවිද්දන් හා දෙමව්පියන්, වැඩිහිටියන් හැටියට අපි සැවොම එකතු වෙමු. නරක ආදර්ශ වැරදි ඉගැන්වීම් හා මඟ පෙන්වීම් තුළ අසරණ වී, අයාලේ ගියාට පසු, ඔවුන් සොයා යෑමට අපි ඉඩ සලසා නොගනිමු. දරුවන් රැක බලාගෙන, ජේසු ළඟට ගෙන යෑම අපගේ මූලික අපෝස්තලික කාර්යය බව අපි වටහා ගෙන එසේ ක්‍රියා කරමු. ඒ සඳහා අපට අත් උදව්වක් සේ ඇති ධර්මදූත ළමා සමාජයට අප දරුවන් යොමු කරමු.

එය මීසම් තුළ පණ ගන්වා ක්‍රියාත්මක කරමු. බාලයන් මා වෙතට එන්නට ඉඩ හරින්න, ඔවුන් නොවලක්වන්න....../ යන සමිඳු වදන අපි නිතරම සිහියේ තබා ගනිමු. ලොකු මිනිසුන් සමඟ ලොකු ව්‍යාපෘති වලට සීමා නොවී, මේ පුංචි මල් කැකුළුවන්, කුඩා දරුවන් ගැන වැඩි අවධානයක් යොමු කර, කුඩා කල සිටම ඔවුන්ව අයහපතට ඇද ගැනීමට මාන බලන යක්ෂයාගේ හා උගේ සහචරයන්ගෙන් ඔවුන් බේරා ගනිමු. අසරණ වූ, අනාථ වූ දරුවන් ගැන දෙවිඳාණෝ අපෙන් ප්‍රශ්න කරද්දි, එදා කායින් මෙන් මම මාගේ සහෝදරයාගේ රැකවලාද?/ (උත්පත්ති 4'9) කියා, පිළිතුරු දීමට නොසිට හැම දරුවෙක්ම, මගේය/- අපේය/ යන වගකීමෙන් ක්‍රියා කිරීමට පෙළඹෙමු.

මෙවර ධර්මදූත ළමා ඉරුදින තේමා පණිවුඩය අපි හොඳාකාරවම පසක් කර ගනිමු. අපි සැවොම, දෙවිඳුන්ගෙන්ම අපට ලැබුණු මේ ලෝකය, රසගන්වන්නට ආලෝකමත් කරන්නට, සුවඳවත් කරන්නට හා ලස්සන කරන්නට බැඳී සිටින බව තරයේ සිතට ගනිමු. අප දරුවන්ද ඔවුනගේ කුඩා කාලයේ සිටම මේ සඳහා උසිගන්වමු. යොමු කරමු.

එය ඔවුනගේ වගකීම හා යුතුකම බවත්, ඔවුනට එය කිරීමට පුළුවන් බවත්, ඔවුනට ඒත්තු ගන්වමු. ඒ සඳහා ඔවුනට කළ හැකි පුංචි පුංචි ක්‍රියාකාරකම් අපි කියා දෙමු. දේව වචනයෙන් අපි ඔවුන් පෝෂණය කරමු.
එවිට යක්ෂයාගේ මායම් වලින් බේරීමට ඔවුනට හැකි වේවී. මෙසේ ක්‍රියාකාරීවන අප ගැනත් සමිඳෝ ප්‍රසන්නව අපවද වැඩිමනත් ආශිර්වාද කරාවී. ලොව සරසන ජේසුගේ මල් වෙති, පුංචි දරුවෝ....... ( ඔබ සැමට ජේසු පිහිටයි. ජේසු අම්මාගේ රැකවරණයයි.



**ගරු රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමා**
ධර්මදූත ළමා සමාජ
ජාතික අධ්‍යක්ෂක

**ගරු රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමා,**

**ජාතික අධ්‍යක්ෂක,**
**ශුද්ධාසනීය ධර්මදූත සංගම්,**
**නො. 19, බැල්කම් පෙදෙස, කොළඹ 08.**
**දුරකථන, ෆැක්ස්: 011-2685673**

E-mail - ndpms@sltnet.lk
Website : www.pontificalmissionlk.org

# ළමා අයිතිවාසිකම් සමහරක්

■ **ළමයා පිළිබඳ නිර්වචනය**

අවුරුදු 18ත් පහල සෑම කෙනෙක්ම ළමයකු ලෙස සැලකේ. ඔවුන් හට මෙම ප්‍රඥප්තියේ සඳහන් සියලුම අයිතිවාසිකම් හිමි විය යුතුය.

■ **වෙනසක් නොකිරීම**

ළමුන් කවුරුන් වුවද, කුමන වයසක වුවද, කිසියම් ආබාධයක් සහිත වුවද, කුමන වර්ණයකින් යුක්ත වුවද, කුමන ජාතියකට හෝ ආගමකට අයත් වුවද, කුමන භාෂාවක් කථා කළද ඒ සැමටම මෙම අයිතිවාසිකම් හිමිය.

■ **දෙමව්පිය මාර්ගෝපදේශකත්වය හා ළමයාගේ වර්ධනය**

ළමයාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැලසීමෙහිලා පවුල සතු වගකීමටද, දෙමාපිය අයිතීන් හා වගකීම් වලටද රජය ගරු කළ යුතුය.

■ **පැවැත්ම සහ සංවර්ධනය**

ජීවත් වීමට අයිතියක් ළමුන් සතු බව සියලු දෙනාම පිළිගත යුතුය. ළමයාගේ පැවැත්ම හා සංවර්ධනය සුරක්ෂිත කිරීම රජයේ වගකීම වේ.

■ **අනන්‍යතාවය ආරක්ෂා කිරීම**

ළමයාගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට රජය බැඳී සිටී අනන්‍යතාවය නැති වූ විටෙක අවශ්‍ය ඕනෑම අවස්ථාවක නම ජාතිය හා පවුල් සබඳතා ඉදිරිපත් කර එය යළිත් ස්ථාපනය කිරීමට රජය බැඳී සිටී.

■ **දෙමව්පියන්ගෙන් වෙන් වීම**

ළමුන්ගේ උපරිම යහපත සඳහා පමණක් (එනම් මව්පියන් විසින් ළමුන්ට අකටයුත්තක් කරනවා නම් හෝ නොසලකා හරිනවා මිස) නම් ඔවුන් දෙමාපියන්ගෙන් වෙන් නොකළ යුතුය. දෙමව්පියන් වෙන්ව ජීවිත් වීමට තීරණය කළහොත් ළමයාට ඔවුන්ගෙන් එක් අයෙකු සමඟ ජීවත් වීමට සිදු වනු ඇත. එහෙත් මව සහ පියා සමඟ පහසුවෙන් සම්බන්ධතා පවත්වාගෙන යාමට ළමයාට අයිතියක් ඇත.

■ **ළමුන් පැහැරගෙන යාම**

දෙමව්පියන් හෝ තුන්වන පාර්ශවයක් විසින් ළමුන් පැහැරගෙන යාම හෝ බලහත්කාරයෙන් රඳවා තැබීම වැලැක්වීම හා ළමයා නැවත ලබා ගැනීමට කටයුතු කිරීම රජයේ වගකීමයි.

■ **ළමයාගේ මතය**

කිනම් ආකාරයකින් හෝ ළමයා කෙරෙහි බලපාන තීරණයක් දෙමව්පියන් හෝ වැඩිහිටියන් විසින් ගනු ලබන විටදී තම මතය ප්‍රකාශ කිරීමට ළමයාට අයිතියක් ඇති අතර එම මතය සැලකිල්ලට ගත යුතුය.

■ **නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීම**

යම් යම් තොරතුරු සොයාගෙන ඒවා පිලිබඳව තමන් සිතන දේ කීමට ළමයාට අයිතියක් ඇත. අන් අයගේ අයිතීන්ට හානියක් නෙවෙන ලෙස ඒ අදහස් ප්‍රකාශ කිරීමටද ළමයාට අයිතියක් ඇත.

■ **නිදහසේ සිතීම හා ආගමක් ඇදහීම**

තමන්ට රිසි සේ සිතීමට හා ආගමක් ඇදහීමට ළමුන්ට අයිතියක් ඇත. මෙහිදි දෙමව්පිය මාර්ගෝපදේශකත්වය ලබා දිය යුතු අතර, රටේ පවතින නීතියට අනුකූලව මෙම නිදහස බුක්තිවිඳිය යුතුය.

■ **ඇසුරු කිරීමේ නිදහස**

අනෙක් ළමුන් හමුවී යහළු මිත්‍රකම් ඇති කර ගැනීමට ළමුන්ට අයිතියක් ඇත. අනුන්ගේ අයිතීන්ට බාධා නොවන අයුරින් සමිති සමාගම් පිහිටුවා ගැනීමට ද ඔවුනට අයිතියක් ඇත.

■ **පෞද්ගලිකත්වය රැකගැනීම**

සෑම ළමයෙකුටම පෞද්ගලික ජීවිතයකට අයිතියක් ඇත. තම පෞද්ගලිකත්වය පවුල නිවෙස හා ලිපි ගොනු සම්බන්ධව අන් අයගේ මැදිහත් වීමෙන් තොරව කටයුතු කිරීමට ඔවුන්ට අයිතියක් ඇත.

■ **දෙමව්පිය වගකීම**

මව්පියන් දෙදෙනාම ළමයාගේ වැඩීම හා වර්ධනය පිලිබඳ සමසේ වගකීම් දැරිය යුතුය. ඔවුන් හැම විට ළමයාගේ යහපත උදෙසා ක්‍රියා කළ යුතුය.

■ **අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීම**

අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීමට ළමුන්ට අයිතියක් ඇත. දෙමාපියන්ට හා රැක බලාගන්නන්ට ළමුන්ට හිංසා කිරීමට කිසිම අයිතියක් නැත.

■ **දරුකමට හදා ගැනීම**

ළමයකු දරුකමට හදාගන්නේ නම් එය නීත්‍යානුකූලව හා ළමයාගේ උපරිම යහපතට හේතුවන ලෙස සිදු කළ යුතුය.

■ **සරණාගත ළමයින්**

ආරක්ෂාව පතා ළමයකුට තම නිවස හෝ රට අතහැර යාමට සිදු වේ නම් එවන් සරණාගත ළමුන්ට විශේෂ ආරක්ෂාව ලැබීමට අයිතියක් ඇත.

# සුදුතුම් පිය ගමන් තිරය පිටුපස

ප්‍රථම වර දිවයිනට පා තැබූ සසුනිසුරාණන් වූයේ 6 වැනි පාවුලු ශුද්ධෝත්තම පාප් වහන්සේ ය. එම පා තැබීම සිදු වූයේ ක්‍රි.ව. 1970 දෙසැම්බර් මස 04 වැනි දා ය.

ක්‍රි.ව. 1970 මුළු ආසියාවේ ම රදගුරු හිමිවරු විශේෂ රැස්වීමක් පැවැත්වූහ. මේ සඳහා ආසියාවේ සෑම රටකින් ම නියෝජිත රදගුරු පිරිස් යවන ලදි. මෙයට රතු චීනය හැර අන් සියලු ආසියාතික රටකින් ම නියෝජිතයෝ පැමිණ සිටියහ.

දිවයින නියෝජනය කරනු



**යටගිය දවස**

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**193**

ලැබුවේ අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ප්‍රමුඛ අති උතුම් බී. දියෝගුපිල්ලේ, එල්. ආර්. ඇන්තනි සහ ඔස්වල්ඩ් ගෝමිස් යන රදගුරු හිමිවරුන් විසිනි.

මෙම රැස්වීම පවත්වන ලද්දේ පිලිපීනයේ මැනිලා නුවර පිහිටා ඇති "සන්තෝමා" සරසවිය හෙවත් ආසියාවේ පැරණිතම කතෝලික විශ්ව විද්‍යාල භූමිය තුළ ය.

රැස්වීම සඳහා වැඩම කළ රදගුරු අගරදගුරු ආදි හිමිවරුන්ට ලැගුම් ගැනීම සඳහා ඒ අවට පැවිදි ආරාම මෙන් ම හෝටල් ද පිළියෙළ කැර තිබිණි.

එම වසරේ නොවැම්බර් මස 29 වැනි දා රැස්වීම ආරම්භ විණ. එහෙත් මීට දස දවසකට පමණ පෙර ඉතා විනාශකාරී ඇඩි සුළිං සුළඟක් එහි හමා ගොස් තිබුණේ ය. මෙයින් රැස්වීම හා පාප් වහන්සේ ගේ පැමිණීම සඳහා සූදානම් වීමේ කටයුතු රැසකට බාධා එල්ල විය. විදුලි බලය සැපැයීම පවා ක්‍රියා විරහිත වී තිබිණි.

මේ සියල්ල හැකි කඩිනමින් පිළිසකර කැරගත් ජනතාව පාප් වහන්සේගේ වැඩම කිරීම බලාපොරොත්තුවෙන් උදම් වී සිටියහ. පිලිපීනයේ සම්ප්‍රදාය අනුව ගුවන් තොටුපළ අවට ද එය තුළ ද විශාල භට පිරිසක් ආරක්ෂාව පිණිස යොදා සිටියේ ය.

පාප් වහන්සේ පිළිගැනීම පිණිස ඉදිරි ආසන්නයට ගිය පිරිස අතර එවකට එහි ජනාධිපති ෆර්ඩිනන්ඩ් මාර්කෝස් සහ එම මැතිනි ඉමෙල්ඩා මාර්කෝස්, මැනිලාහි අගරදගුරු තැන්පත් අති උතුම් හයිම කාදිනල් සින් හිමිපාණන් සහ ආසියාවේ රදගුරු පිරිසක් වූහ. කිසිවකු සැක නොකළ පැවිදි වස්ත්‍ර පැළඳගත් පුද්ගලයෙක් ද ඒ මැද රිංගා සිටි බව කිව යුතුයි.

පාප් වහන්සේ පිළිගැනීමත් සමඟම උන්වහන්සේ අවට පැමිණ සිටි කාදිනල් හිමිවරුන් වෙත හැරුණහ. සැණෙකින් අර රහසින් රිංගා සිටි තැනැත්තා කුරුසියක හැඩයට මිට සකසාගෙන තම ඉන පටියේ දවටාගෙන සිටි කිණිස්ස රහසේ එළියට ඇද්දේ ය. කෙසේ හෝ උකුසු ඇසින් බලා සිටියේ ආරක්ෂකයන් නොව මැලේසියාවේ රදගුරුතුමකු වූ ඉංගිරිසි ජාතික ගැල්වින් රදගුරු හිමිපාණන් ය.

බරපතළ සිරුරකින් හෙබි උස මහත එතුමාණෝ විදුලි සැරෙන් මොහු බිමට නෙරපා දැමූහ. මොහු ඇද වැටීමත් සමඟ ඉතා ආසන්නව සිටි කොරියාන ජාතික සෝල්හි අති උතුම් ස්ටීවන් කිම් කාදිනල් හිමිපාණන්ගේ වැලමිට සුළුවෙන් කැපී ගියේ ය.

ඒ මොහොතේ ම ආරක්ෂක භට පිරිස මොහු අත්අඩංගුවට ගත් හ. ගැල්වින් රදගුරු හිමිපාණන් ගේ සුපරික්ෂාකාරී බව සහ එඩිතර බව නොතිබෙන්නට එදා මහත් විපතක් සිදුවන්නට ඉඩ තිබිණි.

සත්‍යය මෙසේ වූවත් පසුදා රජයේ පුවත්පත් පළ කළේ එහි සිටි ජනාධිපති මාර්කෝස්, දක්ෂ කරාටිකරුවකු වූ හෙයින් හෙතෙම සහසිකයාට පහර එල්ල කොට මෙල්ල කළ බවකි.

එම 6 වැනි සුදුතුම් පාප් වහන්සේ දිවයිනට වැඩම කළේ 1970 දෙසැම්බර් 04 වැනි දා ය. ඒ පිලිපීනයෙන් පසුව යි. ලංකාවට වැඩම කළ ප්‍රථම පාප් වහන්සේ වන උන්වහන්සේ පා තැබුවේ අප කටුනායක ගුවන් තොටුපළේ පමණි. එක් පැයක් එහි රැඳී සිටීමට නියමව තිබුණත් එම කාලය පැය තුනක් දක්වා දික්විය. විශාල ජනකායක් එහි රැස් වී දිව්‍ය පූජාවට ද සහභාගි වූහ.

අවසානයේ දී සුළු ප්‍රමාද දෝෂයක් ගැන එවකට ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා වාර්තා කළේ ය. එනම් නොනවත්වා කෙළින්ම රෝමය බලා පියාසර කරන්නට නියමව තිබුණ ගුවන් යානය බහුලව ඉන්ධන පුරවාගෙන තිබිණි. මේවායේ බර හේතුකොට ගෙන උඩ නැංවීම සඳහා ධාවන පථය දිගේ දිගු ප්‍රමාණයක් වේගයෙන් ගමන් කරවන්නට සිදුවිය. දුර ප්‍රමාණය දිගු කරනු වස් මීගමු පාර අසළටම ගුවන් යානය ගෙන ගිය අවස්ථාවේ අහස් තොටුපල අවට සිටි නිලධරයෙක් යානය පිට වී ගියේ යැයි සිතා පැමිණ සිටි විශේෂ අමුත්තන් ගේ වාහන ධාවන පථය හරහා යන්නට අවසර දී ඇත.

වාසනාවට විමසිල්ලෙන් සිටි ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා විගස අවධානය යොමු කොට එය බාධා කරද්දීම පාප් වහන්සේ රැගත් ගුවන් යානය ර්තල වේගයෙන් ඒ හරහා ගමන් ගෙන ඇත. එවෙලේ වාහන ඉදිරියට පැමිණුනේ නම් විශාල අනතුරක් සිදුවන්නට ඉඩ තිබුණි.

**ලබන සතියට...**

**නිර්මාණශීලී කිතුනු දනවි**

## කලා සංග්‍රහය

ක්‍රිස්තු වර්ෂ 2015
ජනවාරි 25 ඉරිදා

# සග ලොව කරා

**කර්තෘ මණ්ඩලය - ගරු ජයලත් බලගල්ල පියතුමා, අසේල දසනායක, ෂෙල්ටන් ප්‍රනාන්දු, ඇන්ජලෝ ලෙවන්ඩෝල්**
**මිළ - රු. 275/=**




සාන්ත ජුසේ වාස් මුනිඳුන්ගේ උපතේ පටන් ශුද්ධවරය දක්වා ජීවන තොරතුරු උන්වහන්සේගේ කැපවූ ජීවන ගමන, විශේෂ සිද්ධීන් මෙන්ම ශුද්ධවරය කරා ගිය ගමනේ විශේෂ සිදුවීම් සමගින් වර්ණ ඡායාරූප 180 ක් මෙහි අඩංගුවේ.

සාන්ත ජුසේ වාස් මුනිඳුන් සාන්තුවරය උදෙසා පැමිණි ගමන් මගේ ඓතිහාසික මතක - සිද්ධීන් මෙන්ම එතුමන්ගේ දිවි ගමන හා සම්බන්ධ ස්ථාන රැසක් ගැන මෙහි තොරතුරු සමගින් ඡායාරූප අඩංගුය.

# මත්ද්‍රව්‍ය උවදුර හා තරුණ පරපුර

**කර්තෘ - ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු**
**මිළ - රු. 130/=**




නූතන තරුණ පරපුරට වින කරන ප්‍රබල සතුරකුවූ මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳව සියලු තොරතුරු අනාවරණය කරමින් ඉතා සරලව, කෙටියෙන් කරුණු ඉදිරිපත් කරන්නට කතුවරිය සමත්වී ඇත. එහි බිහිසුණු බවත්, මත් උවදුරෙන් තරුණ දූ පුතුන් බේරා ගැනීම සඳහා ඒ පිළිබඳ නිරවුල් අවබෝධයක් ඇතිකර එහි ආදීනව පහදා දීමට කතුවරිය සමත්ව ඇත. ඇයට ප්‍රදීප සුපැතුම්!

# නව ජෙරුසලමට යමු ඉතින්

**කර්තෘ - මේරි ඇනස්ටින් මිහිඳුකුල**
**මිළ - රු. 150/=**




කාව්‍ය නිර්මාණ 51 කින් සුසැදි 'නව ජෙරුසලමට යමු ඉතින්' කාව්‍ය නිර්මාණ සංග්‍රහය කතුවරියගේ කුළුදුල් නිර්මාණ සංග්‍රහයයි. දෙවියන් වහන්සේ වෙතින් ලද කාව්‍යකරණය නම් තලෙන්තු පෙරළා උන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කරන්නට කතුවරිය යොදා ගෙන ඇති අන්දම ප්‍රශස්තය. ඉතාමත් ගැඹුරු දෙව් දහමක් සරල, සුමට බස් වහරකින් රසාලිප්ත පදමාලා ඔස්සේ ලොවට ගෙනෙන්නට කිවිඳිය වෑයම් කර ඇත. මේරි ඇනස්ටින් මිහිඳුකුල කිවිඳියට ප්‍රදීප ආචාරය.

# සාම මිහිර

**නොමිලේ බෙදාහරින ජාතික නත්තල් කලාපය**
**සංස්කාරක - ඇන්තනි ජයලත් ප්‍රනාන්දු**

1959 වසරේ සිට අඛණ්ඩව පළවන 'සාම මිහිර' ජාතික නත්තල් කලාපය 56 වන වසරට පා තබමින් පසුගිය නත්තලට සමගාමීව මෙවරද නිකුත් කොට ඇත. නොමිලයේ බෙදා හරින මෙම අගනා නත්තල් කලාපයට 'නත්තල් හසුන' යනුවෙන් මෙලොව පියකු හට උරුම කර දිය හැකි හොඳම දේ වන්නේ ස්වකීය අදහස් වලින්, ගතිපැවතුම් වලින් පිරි, තමන් වැනිම පුත්‍ර රත්නයක් ලොවට දායාද කිරිම බවත්, එවන් පුත්‍රයෙක් සකල ලෝකවාසීන් උදෙසා බිලි පූජාවක් කිරීමට සිදුවන බව දැන දැනම ඔහු මෙලොවට දායාද කරනට තරම් පරිත්‍යාග ශීලීද.... යනුවෙන් වූ ගාලු පදවි රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන්ගේ පණිවුඩයත් සහිතව එළිදක්වා ඇති, ආකර්ශනීය පිටකවරයකින් සමන්විතව එළිදක්වා ඇත. අඩසිය වසක් සපුරන සාම මිහිරට ප්‍රදීපයේ සුබාශිංසන!

**ජෝශප් ජෙරම්**




# උඳුවප් මිහිර

**නොමිලේ බෙදාහරින ජනතා නත්තල් වාර්ෂිකය**
**සංස්කාරකවරු - මැක්ෂිමස් රෝයි පෙරේරා, ශිරාන් මෛත්‍රි**

මැක්සිමස් රෝයි පෙරේරා සහ ශිරාන් මෛත්‍රි ශූරීන්ගේ සංස්කාරකත්වයෙන් වාර්ෂිකව නොමිලේ බෙදා හරින ජනතා නත්තල් වාර්ෂිකය 38 වන වතාවටද ජා-ඇල වික්ෂෝප මාතා දෙව්මැඳුරු ශාලාවේදී ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ ප්‍රධානත්වයෙන් එළිදක්වන ලදි.

කොළඹ අගරදගුරු අතිඋතුම් කාදිනල් මැල්කම් රංජිත් අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ රදගුරුවරුන්ගේ ආසිංශන සහිතව 'සඳලු තලයෙන් බිමට බට 21 වන සියවසේ සැබෑ ක්‍රිස්තුවරයා වන අතිඋතුම් ප්‍රැන්සිස් සුදොතුම් පියතුමාගේ රූප සහිතව දර්ශනීය පිටකවරයකින්ද සමන්විතව මෙවරද ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි පියතුමා ප්‍රමුඛ 16 දෙනෙකුට ප්‍රතිභා ප්‍රණාම සම්මාන පුද දෙමින් විශිෂ්ට මෙහෙවරක් ඉටුකොට ඇත. උඳුවප් මිහිරට ඥානාර්ථ ප්‍රදීපයේ ප්‍රණාමය.




# මිණි උදාන

**සංස්කාරක - ජෝශප් ජයසිරි ප්‍රනාන්දු**

ජෝශප් ජයසිරි ප්‍රනාන්දුගේ සංස්කාරකත්වයෙන් වාර්ෂිකව නත්තලට එළිදකින මිණිඋදාන සඟරාව මෙවර 'දිළිඳුන්ගේ සභාවක් ගොඩනගමු' යන තේමාව ඔස්සේ නිකුත් විය.

අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ විශේෂ පණිවුඩයන් සහ හරබර ලිපි, පද්‍ය රචනා රැසක් සමග අති උතුම් සුදොතුම් පියතුමා, ජුසේවාස් මුනිතුමාගේ සහ ශුද්ධ වූ පවුලේ ඡායාරූප සහිත ආකර්ශනීය පිටකවරයකින් සමන්විතව මෙවර නත්තල් කලාපය එළිදැක්වීම විශේෂත්වයකි.




ෆිලීෂන් අබයකෝන්ගේ

## සුබස 288

# මෙතැන් පටන් සියලූ පරම්පරා

කොළඹ - නුවර පාරේ යන එන්නන්ට කැගලු සාන්ත මරියා දේවස්ථානයේ මොගොප්පුවේ දිග වැකිය කියවිය හැකි වුවත් නොතේරෙන්නේ එය ලතින් නිසාය. මෙය ලූක් 1:48 යි. මෙතැන් පටන් සියලු පරම්පරාවෝ මට භාග්‍යවන්තී යයි කියන්නෝය. මරියතුමියගේ උදාන ගීයේ ශුද්ධ බයිබල සිංහල පරිවර්තනයේ පරපුර හතර වරක් දැකිය හැකිය.

ජනතාව මෙසියස් තුමා දාවිත් රජුගෙන් පැවැතෙන්නෙකැයි සිතූ බැවින් ස්වාමීන්වහන්සේගේ පිහිට පැතුවන්ගේ කටින් පිටවුණේ දාවිත්ගේ පුතුනි ලෙසයි. ලූක් සුවිශේෂයේ මුල් පරිච්ඡේද දෙකේ දාවිත්ගේ සිහසුන, නුවර, වංශය වශයෙන් දාවිත් නාමය පස්වරක් දිස්වේ.

සන්තතිය, සන්තානය, ප්‍රවේණිය, ආවේණිය, පෙළපත, සනුහරය පරම්පරාවල සමාන පදයි. ආවේණික සැබෑ තේරුම පාරම්පරික යනුයි. වංශය, ගෝත්‍රය, කුලය විටක පරම්පරා අර්ථයක් ගනියි. ග්‍රෙගෝර් ජොහාන් මෙන්ඩෙල් පියතුමා ප්‍රවේණි විද්‍යාවේ පියාය. මහාවංශ, චූලවංශ, දීපවංශ, බෝධිවංශ, ධාතු වංශ වශයෙන්ද සූර්ය, මෞර්ය, චන්ද්‍ර, ලම්බකර්ණ වංශ වශයෙන්ද වංශ විශේෂ ගණනාවකි.

මිනිස් දිවි පැවැත්මේ අඛණ්ඩතාව රැකිය යුතු නිසා ශුද්ධ බයිබලය පුරා පරම්පරා කථාය. වංශාවලියේ පළමු පොතේ මුල් පරිච්ඡේද 9 ම වංශකථාය. නවගිවිසුමේ මතෙව් හා ලූක් සුවිශේෂවල ස්වාමීන්වහන්සේගේ වංශාවලි විද්වත් සංවාදවලට භාජනවිණ.

තා සහ ස්ත්‍රිය අතරද තගේ වංශය හා ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තබන්නෙමි (උත්. 3:15). එම්බා පොළොංවංශය, එන්නට තිබෙන උදහසින් පලායන්න. (ලූක් 3:7) කෙසේද සර්පරාජවංශය?

පරම්පරා උරුම පාරම්පරික දේපල, පරම්පරාවේ මිනීවළවල්, පරවේණි භුක්තිය, ආවේණික ලක්ෂණ, පෙළපත් නම්, වංසක්කාර පවුල් පරිදි පරම්පරාව වර්ගවාද, වර්ගභේද ජනනය කරයි. සාහිත්‍යයේ දකින අනංග ශර පරම්පරාව නම් අනංගයාගේ ඊතල පෙළයි.

පරපුර අනුව බලනවිට උන්වහන්සේ දාවිත් රජුගේ පෙළපතෙහි උපන් සේක. එහෙත් ලෝකෝත්තර වශයෙන් මරණයෙන් උත්ථානවීම හේතුකොටගෙන දේවපුත්‍රයාණන් බවට ප්‍රබල සාක්ෂ්‍යයක් වූ සේක. (රෝම 1:3)

# උපත




**සංස්කාරක - ප්‍රියන්ත පීටර්ස්**

නත්තලේ යථාර්ථය සොයා අප ගමන් කළ යුතු බවත්, දෙවියන් වහන්සේගේ උතුම්ම මැවිල්ල ලෙස මිනිසා මවා, සදාතන ජීවිතය උරුමකරදී ප්‍රීතිමත් ජීවිතයක් ගතකිරීමට සුගති උද්‍යානයේ පදිංචි කරවූයේ ඔහුට දක්වන අසීමිත ප්‍රේමය නිසා බවත් සංස්කාරක සටහනින් දක්වමින් 2014 දෙසැම්බර් මස 5 වන වසරට පාතබමින් 'නව ජීවනයකට උපත ලබමු' යන තේමාව යටතේ 'උපත' නත්තල් කලාපය එළිදක්වා ඇත.

හලාවත පදවි එඬේරාණන් වන අතිඋතුම් දෙව්ශ්‍රීත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ නත්තල් පණිවුඩයක් සහ ජේසු බිළිඳුන්ගේ හා වත්මන් සසුන් පියාගේ ඡායාරූප සහිත දර්ශනීය පිටකවරයකින් සමන්විත රසබර ලිපි රැසකින්ද සමන්විතය.

# දෙව්මිණ එළිදකී

හලාවත පදවි ලේඛක හවුලේ ප්‍රයත්නයක් ලෙස 'දෙව්මිණ' නමින් පුවත්පතක් නිකුත් වී තිබේ. ගරු ඩෙසිඩේරියස් ඇෆ් මැදගොඩ පියතුමාගේ ප්‍රධාන සංස්කාරකත්වයෙන් අවින්ද්‍යා ෂෙහානි ප්‍රනාන්දු මෙනවියගේ සහය සංස්කාරකත්වයෙන් මංගල කලාපය හැඩවී ඇත. 'දෙව්මිණ' ට ප්‍රදීප සුපැතුම්!

**මෛත්‍රි**




# පියුම

**නොමිලේ බෙදාහරින ඉපැරැණිම නත්තල් සුපුවත**
**සංස්කාරකවරු - රූපස් ප්‍රැන්සිස් සුසිල් පෝල්**

රූපස් ප්‍රැන්සිස් සහ සුනිල් පෝල් මහත්වරුන්ගේ සංස්කාරකත්වයෙන් ශ්‍රී ලංකාවේ නොමිලයේ බෙදා හරින ඉපැරණිම නත්තල් සුපුවත 'පියුම' 60 වන වතාවටද පසුගිය නත්තල් සමයෙදි එළිදක්වා ඇත්තේ ජේසු උපත දක්වන දර්ශනීය ඡායාරූපයක් සහිතව ආකර්ශනීය පිටකවරයකින් යුතුවය. එසේ පියුම නිර්මාණය ප්‍රවීන මාධ්‍යවේදී එම්. ඇන්තනි ප්‍රදිනන්දිස් මැති තුමාගේ නික්මයාම පිළිබඳව වූ 'පුංචි මිනිසාණෙනි, ඔබ කුඩා පයාගල ග්‍රාමය සිරිලක නත්තල් සඟරා ඉතිහාසයේ ඉහළටම ඔසවා තැබීය. ඉන් අත්කර දුන් අභිමානයටත්, ආඩම්බරයටත් මෙම සුවිශේෂි 'පියුම'




නත්තල් වාර්ෂිකය එතුමාගේ නාමයට ගෞරවයෙන් පිළිගන්වමි. 2015 වසරේදී ද මෙවන් අර්ථවත් 'පියුම්' කුඩා පයාගලින් පිපේවා!

# සසුන් පියා දරුවන් 33 දෙනෙකු බෞතිස්ම කරයි



ප්‍රැන්සිස් සසුන් පියා, අප ස්වාමින් වහන්සේගේ බෞතිස්ම මංගල්‍යය දිනැ, එනම් ජනවාරි මස 11 වැනිදා, දරුවන් 33 දෙනෙක් හට බෞතිස්මයේ ප්‍රසාද නිධානය ලබාදුන් සේක. එම දරුවන් බෞතිස්මය කරනු ලැබුවේ, සිස්ටයින් දෙව් මැඳුරේය.

සසුන් පියා රැස්ව සිටි දරුවන්ගේ දෙමාපියන් අමතමින් මෙලෙසින් ද ප්‍රකාශ කළ සේක. 'බෞතිස්මය ලබන්නා කතෝලික සභාව තුළ සාමාජිකත්වය ලබයි. සභාවෙන් පිට කිතුනුවකුට ඇදැහිල්ලේ ජීවිතයක් නොමැති යයි ඔබේ දරුවන්ට නිරන්තරයෙන් පවසන්න.

සභාවෙන් පිට කිසිවෙකුටත් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ අනුශාසනා කළ නොහැක. මන්දයත් සභාව අපේ අම්මා බැවිනි. තවද සභාව තුළ අප ක්‍රිස්තුස් වහන්සේගේ ආදරය තුළ නිරන්තරයෙන් පැවැතෙන්නෙමු.'

# උතුරු අයර්ලන්තයේ ගබ්සා නීති ලිහිල් කිරීමට සභාව විරුද්ධයි

විවිධ හේතූන් හුවා දක්වමින්, උතුරු අයර්ලන්තයේ ගබ්සා නීති ලිහිල් කිරීමට රජය ප්‍රයත්නයක යෙදී සිටී. උතුරු අයර්ලන්තයේ එමෝන් මාර්ටින් අමාන් අගරදගුරු හිමියෝ, කතෝලික විශේෂඥයන් පිරිසක් සමග යුක්තිය හා සාධාරණත්වය පිළිබඳ ඇමැති, ඩේවිඩ් ෆ්‍රෝර්ඩ් ජනවාරි මස 25 වෙනිදා හමු වූයේ ගබ්සා නීති ලිහිල් කිරීමට එරෙහි කරුණු කාරණා ඉදිරිපත් කිරීමටය.

මෙම කරුණු අළලා උතුරු අයර්ලන්තයේ අගරදගුරු හිමිපාණන් විසින් දැඩි ලෙස අවධාරනය කරනු ලැබුවේ, දරුවා මාරාන්තික ලෙස මව් ගැබේ රෝගිව සිටියත්, ගබ්සාවක් කිරීමට කතොලික සභාව එදා මෙන්මැ අදත් විරුද්ධ වන්නේ, දේව මැවිල්ල වන එම දරුවාගේ ජීවිතය විනාශ කිරීමේ අයිතිය කිසිවෙකුට නොමැති නිසා යයි අවධාරණය කරනු ලැබුවේය. තවද පවසනු ලැබුවේ, සභාවේ තීරණය කිසිදා වෙනසක් සිදු නොවනා බැව් අවධාරණය කිරීමෙනි.




## මධ්‍ය අප්‍රිකා දේශයේ
### සාමය අතරේ ත්‍රස්ත ක්‍රියා ද වේ



මධ්‍ය අප්‍රිකා දේශයේ, මුස්ලිම්වරු හා කිතුනුවන් අත්වැල් බැඳගෙන සාම ගමනක් යාමට විවිධ ක්‍රියාකාරකම් හී නිරතව සිටිති. එහෙත් එම ප්‍රයත්නයන් අතරතුරේ, ත්‍රස්ත ක්‍රියාකාරකම් ද අඩුවක් නොමැතිව සිදුවෙමින් පවති.

ආයුධ සන්නද්ධව ක්‍රියා කරනා විවිධ ත්‍රස්ත කංඩායම් සාම ක්‍රියාකාරිත්වයන්ට එරෙහිව ක්‍රියා කරමින් සිටී. එම ත්‍රස්ත කංඩායම් විශේෂයෙන් කැරෙන කාර්යයන් නම් මත් ද්‍රව්‍යයන් මාර්ගයෙන් බෙදා හැරීමෙන් තමන් වෙත ඇද ගන්නා ත්‍රස්ත පිරිස් එම තරුණ තරුණියන් ත්‍රස්ත ක්‍රියාවන් හී නිරත කරවනු ලැබීමයි. එම තත්ත්වය යටතේ, මධ්‍ය අප්‍රිකා දේශයේ රදගුරු මංඩලය තරුණ තරුණියන් කරා ඇදෙමින් ඔවුන් සාම මගට ගෙන ඒමට මහා ප්‍රයත්නයක යෙදී සිටිත්. ඔවුන් එසේ කරනුයේ, තමන්ගේ ද ජීවිත අනතුරට පාත්‍ර කරගනිමින් බැව් ද වාර්තා වේ.

## දිල්ලි හි තවත් කතෝලික දෙව් මැඳුරකට පිරිසක් පහර දෙති



ජනවාරි මස 15 වෙනිදා, දිල්ලි හී වරම් දනයේ අප ස්වාමිඳුගේ දෙව් මැඳුරකට පහර එල්ල කොට, ඇතැයි වාර්තා වේ.

පසුගිය සති 04 ඇතුළතදී දිල්ලි හී දෙව්මැඳුරු වලට පහර දුන් හතර වැනි අවස්ථාව මෙය වේ. පහර දුන් අයගේ අනන්‍යතාවයන් ආරක්ෂක කැමරා වලින් හෙළි දක්වනු ලැබ ඇත. දෙව් මැඳුර තුළ වූ ප්‍රතිමා කීපයක් ද විනාශ කොට ඇත. මෙතෙක් කිසිදු සැක කරුවකු අත් අඩංගුවට ගෙන නොමැත.

## සවුදිය ඉස්ලාමීය රාජ්‍යය හරස් කොට තාප්පයක් ඉදි කරයි

සවුදි අරාබිය ඉස්ලාමීය රාජ්‍ය මායිම් කොට ආරක්ෂක තාප්පයක් ඉදිකිරීමට පටන් ගෙන ඇත. එම තාප්පය දිගින් සැතපුම් සිය ගණන් යයි ද වාර්තා වේ.

මෙම තාප්පය ගොඩ නැඟීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ද, ජිහාද් ත්‍රස්තයන්ගේ ව්‍යාප්තිය ද, අවි ආයුධ ගෙන යාම ද නවතාලීමට ය. මෙයාකාරයෙන් ආරක්ෂක තාප්පයක් සවුදි අරාබිය විසින් යේමනය මායිමේද ගොඩ නඟා ඇත. තමන්ගේ රට තුළට ඉස්ලාමීය රාජ්‍යය ව්‍යාප්තියට එරෙහිව සවුදි අරාබිය විසින් වෙනත් රටවල් තුළට ඉස්ලාමීය රාජ්‍ය ව්‍යාප්ත කරවීම සඳහා උදව් ලබා දී ඇතැයි ද වාර්තා වේ. එහෙත් තමන්ගේ රට තුළ ඉස්ලාමීය රාජ්‍ය ව්‍යාප්තියට කිසිදු ආකාරයේ අවකාශයක් නොලැබෙනු ඇතැයි ද සවුදි අරාබිය විසින් සනාථ කොට ඇත.



ලොව විහිදුණු කතෝලික හඬ

## විශ්ව සභාව

ක්‍රිස්තු වර්ෂ 2015
ජනවාරි 25 ඉරිදා

### ශුද්ධාසනය, රටවල් 180 ක් සමග තානාපති සබඳතා පවත්වයි

ශුද්ධාසනයේ පුවත් කාර්යාලය විසින් ප්‍රකාශ කරනු ලබන පරිදි, ශුද්ධාසනය රටවල් 180 ක් සමග තානාපති සබඳතා පවත්වනු ලබයි. පලස්තීනය ද ඉන් එකකි.

එම රටවලැ ශුද්ධාසන තානාපති කාර්යාලයන් පවතී. වර්ෂ 2014 දී වතිකානය විසින් කැමරූන්, මෝල්ටා සහ සර්බියා යන දේශයන් සමග ද තානාපති සම්බන්ධතා ආරම්භ කළේය.

### බෲනායි නත්තල් සැරසිලි වලට පවා තහංචි

ආසියා කරයේ රටක් වන බෲනායි නත්තල් සැරසිලි තහනම් කරැත. බෲනායි දේශය හඳුන්වනු ලබන්නේ, ඉස්ලාමීය රටක් වශයෙන් ය.

නත්තල් සීයා, නත්තල් ගස්, නත්තල් ඇඳුම් පැළඳුම්, නත්තල් නිවාස සැරසිලි ආදිය බෲනායි හී මුළුමණින්ම තහනම්ය. එපමණක් ද නොවේ, නත්තල් කාඩ් පත් පවා යැවීම තහනම් ය. බෲනාහී ආගමික අමාත්‍යංශය විසින් විශේෂයෙන් නත්තල් සමයේදී, ඉස්ලාම් බැතිමතුන් වෙත අවුරුද්දක් පාසා දක්වා සිටිනුයේ, නත්තල් මංගල්‍ය ආශ්‍රිත සියලු සැරසිලි හා ප්‍රකාශයන්, ඉස්ලාම් දහමට කිසිසේත් නොගැළපෙන බවයි. එමනිසා, එම පුරුදු වලින් පවුල් මෙන්ම දරුවන් ඈත් කොට තැබිය යුතු යයි බෲනා හී ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යංශය විසින් ජනතාව දැනුම්වත් කරනු ලබයි.

### කොප්ටික් කිතුනුවන් පැහැර ගැනේ



ජනවාරි මස 13 වෙනිදා, ඉස්ලාමීය රාජ්‍ය ත්‍රස්ත පිරිසක්, ලිබියාවේ කොප්ටික් කිතුනුවන් 21 දෙනෙක් පැහැර ගෙන ගොස් ඇත. ඔවුන් විසින්මැ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, තමන් ඉස්ලාමීය රාජ්‍ය ත්‍රස්ත කංඩායමක සාමාජිකයන් බවය.

අල් ඇරාබියා පුවත් සේවය විසින් හෙළි දක්වා ඇති පරිදි, ලිබියාවේ සිර්තේ නම් නගරයේ ජීවත් වූ මෙම කිතුනුවන් පැහැර ගෙන ගොස් ඇත. එම පුවත් සේවය විසින් තව දුරටත් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, කිතුනුවන් කොහේ ජීවත් වූවත්, ඔවුන් දිගින් දිගටම මරා දමනා බවයි. පැහැරගනු ලැබූ කිතුනුවන් මරා දමා ඇත් ද නැතහොත් වද හිංසා මැද සඟවා ගෙන තබා ඇත්දැයි යන්න ඔවුන් විසින් මෙතෙක් අණාවරනය කරනු ලැබ නැත.

විවිධත්වයේ කෝණමානයෙන් බලා

# විශේෂාංග



ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා

# 125 ජයන්තිය සමරන මල්පිටිය සා. සෙබස්තියන් මුනි දෙව්මැඳුර



දැනට කුරුණෑගල රදගුරු පදවි ලේඛන වලට අනුව 1889 ජනවාරි 30 වෙනි දින දේවස්ථානයක් සඳහා ඉඩමක් මඩිතියවලට ආසන්න ප්‍රදේශයකින් මිලදී ගත් අතර එහි කනත්තක් පවා තිබූ බව මුතුන් මිත්තන් පවසති. 1897 සැප්තැම්බර් මස 21 වැනි දින පළමු විවාහ ලියාපදිංචියක් එවකට කුරුණෑගල මීසම් සේවක ගරු තියඩෝර් ලැබුරේ පියතුමා සිදු කළ බවට කොළඹ ආණ්ඩුවේ ඒජන්තවරයාගේ බලපත්‍රයක සනිටුහන් කර ඇත.

මල්පිටිය සා. සෙබස්තියන් මුනි දේවස්ථානය සඳහා ඉඩම් කිහිපයක්ම මිලදී ගත් බවට වාර්තා වේ. දැනට දේවස්ථානය පවතින ගනේගෙදර කිරිමැටියාපිටිය හේන නමැති කුරක්කන් ලාස් දෙකක වපසරියෙන් යුත් ඉඩම රුපියල් 5 කට මාපා මුදියන්සේලාගේ කිරිහාමි විදානේ මහතා නැමැත්තකුගෙන් එවකට යාපනේ රදගුරු අති උතුම් ඇන්ඩෲ මෙලිසන් හිමිපාණන් මිලදී ගෙන ඇත. 1946 දී වැ උඩ විල්ලී හත්පත්තුවේ තිරගන් දහය බටහිර කෝරළේ ඔලුපැලියාව දංගහමුලවත්ත ඉඩමේ කොටස් දෙකක් ද නැවත 1955 සැප්තැම්බර් මස 19 තෙන්නහේන වත්තද එවකට හලාවත රදගුරු අති උතුම් එඩ්මන් පීරිස් හිමිපාණන් මිලදී ගෙන ඇත.

1939 දී හලාවත පදවියක් ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව කුරුණෑගල සහ පොල්ගහවෙල මීසම් යටතේ පාලනය කර ඇත. 1943 දී ගරු මැතිව් ප්‍රනාන්දු පියතුමා දේවස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට කැපවී ක්‍රියාකර ඇති අතර 1950 වසරේදී මීසම් ගෘහ ඉදිකර ඇත. 1986 වසරේදී මල්පිටිය උඩුපිටිය, බුළුපිටිය සහ කොහිලගෙදර දේවස්ථාන එක්කර මීසමක් බවට පත් කර එහි පළමු මීසම් සේවක ලෙස ගරු ජස්ටින් වර්ණකුල පියතුමා පත් විය. මල්පිටිය සා. සෙබස්තියන් දහම් පාසල ස්ථාපිත කිරීමට පියවර ගත් එතුමා පරිවර්තනීය වෙනසක් ඇති කිරීමට වෙහෙස ගෙන තිබුණි. නව දේවස්ථානයක් ඉදිකිරීමට 1990. 12. 23 දින මුල්ගල තබා කටයුතු ඇරඹීය.

නව දේවස්ථානය 1997 පෙබරවාරි 22 දින කුරුණෑගල රදගුරු අති උතුම් රේමන් පීරිස් හිමිපාණන් විසින් ආසිරි ගන්වන ලදි. 2007 වසරේදී ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ සම්ප්‍රාප්තියත් සමඟ මල්පිටිය සා. සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථානයට අති විශාල සැදැහැවතුන් පිරිසක් පැමිණෙන්නට වූහ.

දේවස්ථානය වඩාත් ඉඩකඩ සහිතව ගොඩනගන්නට වත්මන් මීසම් සේවක ගරු මොන්ටි පෙරේරා පියතුමා කැපවී කටයුතු කරයි. ආධ්‍යාත්මික ප්‍රබෝධයක් හා භෞතික සංවර්ධනයක් ඇති කිරීම සඳහා සැමගේ සහයෝගය නොමඳව ලබා ගැනීමට 125 වැනි ජුබිලි මහෝත්සවය පවත්වන්නේ මහත් අභිමානයෙන් යුතුවයි. කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ජනවාරි 25 දින පෙ.ව. 8.30 ට 125 ජුබිලි මහෝත්සව දේව මෙහෙය පැවැත්වේ.

✍ බී. කේ. ටී. රෙජිනෝල්ඩ් සහ ඈන් ප්‍රසංගිකා රොඩ්රිගෝ

# පැලේ කවිය



දේසන සමඟ බාසන නම් — උජාරුය
කල්කිරියෙන් කණපිට වැඩ — දියාරුය
හරිදේ කරන්නට කාටත් — අමාරුය
කට නම් සිංහයා තුත්තිරි — කසේරුය

වැඳ වැඳ පල්ලි පන්සල් කෝවිල් — කුමට
නිවැරදි මඟක යනු එය කිරණකි — රටට
රවටා රටම යන්නට සිතුවොත් — පෙරට
රැවටී රවටන්න පෙරළේ පසු — පසට

නාගෙන අනාගෙන ගහගෙන — මැතිවරණේ
ඉවරයි ඉතින් දැකගත හැකි — අවසානේ
නවතා කයිය සේවය කරනට — ඕනේ
සේවය නොකර වැජඹෙන්නට නම් — බෑනේ

වියදම් කරපු රුපියල් යළි — සොයන්නට
ලද මැති ඇමැතිකම් සිතුවොත් — යොදන්නට
අන්තිම කැතයි සිදුවේ මෙය — කියන්නට
ගල් මුල් වලින් සැලකිය යුතුමයි — උන්ට

රාළ මීගමුවේ

# රජත ජයන්තියට සැරසෙන කිඹුල්විලවත්ත සා. සෙබස්තියන් දේවස්ථානය



කපුගහලන්ද, මොරහේන ග්‍රාමයට අයත් කොළඹ අගරදගුරු වසමේ, ගුරුබැවිල දිසාවට අයත් තරාල මීසමෙන් පාලනය වන්නා වූ දොම්පේ කිඹුල්විලවත්ත සා. සෙබස්තියන් දෙව්මැඳුර වසර 25 ක ඉතිහාසයකට හිමිකම් කියයි.

කිඹුලන්ගෙන් පිරි වැවක් පිහිටීම නිසා මෙම ගම්මානය කිඹුල්විල වත්ත නමින් පැරැන්නෝ හැඳින්වූහ යි මතයක් පවතී. තරාල මීසම් සේවකව සිටි ගරු ජෝන් පියතුමාගේ මැදිහත් වීමෙන් කිඹුල්විල වත්ත ගමේ පළමු දිව්‍ය පූජාව සිදු කර ඇත්තේ ඇම්. ඩී. ජුවන් මහතාගේ මහගෙදරය. පසුව ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වූ දෙල්ගොඩ මුදලාලිගේ කාරුණික අනුග්‍රහයෙන් ලැබුණු ඉඩමක කුඩා පොල් අතු නිවහනක් තැනූ ගම්හු එය තම වැඳුම් පොළ බවට භාවිත කළහ. වසර කිහිපයකින් පසු වැඩි වූ ජනගහනයත් සමඟ පොල් අතු පල්ලිය ප්‍රමාණවත් නොවීම සැදැහැවතුන්ට ඉමහත් හිරිහැරයක් බවට පත් විය. ගමේ සෑහෙන පිරිසකට අව්වට වැස්සට ඔරොත්තු දෙන අන්දමේ ස්ථිර ගොඩනැගිල්ලක් සාදා ගැනීමේ උවමනාව ඇම්. ඩී. ජුවන් අන්නවි මහතා තුළ ඉතා බලවත්ව පැළ පදියම්ව තිබිණි.

සුදුසු ඉඩම් කැබැල්ලක් සොයමින් අවට ගම්වල පවා සැරිසැරූ ජුවන් මහතාට දේවස්ථානයකට සුදුසු තැනක් අවසානයේ දී සොයා ගත හැකි විය. එහෙත් එහි අයිතිකරු බෞද්ධ භික්ෂු නමකි. උන්වහන්සේ නම් එවකට කැලණිය රජමහා විහාරාධිපතිව වැඩ විසූ අති පූජ්‍ය බුද්ධ රක්ඛිත හිමියෝ වූහ. එම කාල සීමාවේදි අලුත් මීසම් පිය නමක් ද තරාලට සම්ප්‍රාප්ත විය. හේ ගරු බර්ට්‍රම් තිරිමාන්න පියතුමා ය. එතුමා තරාලට පැමිණි සැණින් ඉටුකළ පළමු රාජකාරිය වූයේ ජුවන් අන්නවි මහතාගේ උපදෙස් පරිදි අති පූජ්‍ය බුද්ධ රක්ඛිත හිමි හමුවී මොරහේනේ අද දේවස්ථානය තිබෙන ඉඩමෙන් පංගුවක් මිලදී ගැනීමය. අක්කර 3 ක පමණ වූ එම ඉඩම රු. 75,000 ක් විය. ගරු බර්ට්‍රම් තිරිමාන්න පියතුමා පළමුවෙන්ම කළේ ලඳු කැලෑවෙන් වට වූ මොරහේන ඉඩම තුළ කතෝලික පවුල් 4 ක් පදිංචි කරවීමයි. ඒ මුල් පවුල්වල අයගේ දරුවෝ අදටත් මොරහේන දේවස්ථානය අවට වෙසෙති. කැලෑව එළි පෙහෙළි කොට නව දෙව්මැඳුර ඉදිකිරීම සඳහා විශේෂයෙන් ඉදිරිපත් වූයේ මේ පවුල් හතරේ උදවියයි.

හැටේ දශකයේ ඉඩම මිලදී ගත්තද දෙව්මැඳුර ගොඩනැගීමේ කටයුතු ඇරැඹුනේ ගරු ඇන්ටන් පීටර්සන් පියතුමාගේ පැමිණීමත් සමඟ ය. වර්ග අඩි 1250 ක් පමණ කුඩා දෙව්මැඳුරක් සඳහා සැලැස්මක් සූදානම් විය. කොළඹ අගරදගුරු මැඳුරෙන් රු. 90,000 ක මුදලක් පරිත්‍යාග වශයෙන් ලැබීමත් සමඟ අවශ්‍ය බඩු බාහිරාදිය එහි ළඟා විය.

වර්ෂ 1989. 12. 17 වන දින මුල් ගල තබා ගම්හු සිය කැමැත්තෙන්ම දේවස්ථානය ගොඩනැගීම සඳහා ඉදිරිපත් වූහ. ශ්‍රමදානවල යෙදුනහ. "දර්ශනීය" පොල්වත්තේ අයිතිකරු වූ කාර්ලෝ ප්‍රනාන්දු මහතාගෙන් මුල් අවධියේ දී මෙම දෙව්මැඳුර ඉදිකිරීම සඳහා ලද සහයෝගය අදටත් ගම්මු කෘතඥපූර්වකව සිහි කරති. ගරු රීඩ් ෂෙල්ටන් පියතුමන් විසින් ඉදිකරන ලද ප්‍රජා ශාලාව අදටත් මේ සභාවට අගනා මෙහෙයක් ඉටු කරයි. වර්ෂ 2015. 02. 01 වන දින වසර "25 " ක රජත ජයන්තිය සමරන අද වන විට පවුල් 50 ක් මෙහි වාසය කරති.

තරාල මීසම් සේවක ගරු සුමිත් රෝෂන් රොද්‍රිගු පියතුමාගේ මැදිහත්කමින් තරාල, දෙවිඳුගම, කිතුනුගම, පූගොඩ, තිත්තපත්තර, කිඹුල්විල වත්ත සැදැහැවත් ජනතාවගේ බැතිබර දායකත්වයෙන් ඉතා උත්කර්ෂවත් අන්දමින් "රජත ජයන්තිය" සැමරීමට කටයුතු පිළියෙළ වේ.

✍ රුවන් කාන්ත

# වසර 170 සපුරන දියලගොඩ සා. සෙබස්තියන් මුනි දෙව්මැඳුර



කළුතර දිසාවේ පැරැණිතම දෙව්මැඳුර වශයෙන් දියලගොඩ සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරට වසර 170 ක් සපිරේ. දියලගොඩ අක්කරමලය නමින් අදටත් හඳුන්වනු ලබන ගම් පියසේ විසූ තොටගේ බස්තියන් ප්‍රනාන්දු නමැති අය විසින් පරිත්‍යාග කරන ලද දියලගොඩ හුණුකැටිය නම් වූ ඉඩමේ 1708 දී ගරු එම්මානුවෙල් මිරන්ද පියතුමා අත්තිවාරම් දමා වරිච්චි බිත්ති සහිත පොල් අතු සෙවිලි වහලකින් යුත් තාවකාලික කුඩා දෙව්මැඳුරක් ඉදි කළේය.

1845 දී ගරු පේදුරු නොරොඤ්ඤෝ පියතුමන් විසින් එය ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා ලෙස විරුදාවලිය ලත් භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමන් විසින් එම දෙව්මැඳුර ශු. සෙබස්තියන් මුනිඳුන්ට කැප කර, පසුව දිව්‍ය පූජා යාගය ජනවාරි 20 දින පැවැත් වූ බව ඉතිහාසයේ සඳහන් වේ. 1999 දී මග්ගොන මීසමෙන් දියලගොඩ මීසම වෙන් කෙරුණි. වත්මන් මීසම් සේවක ගරු දිනේෂ් තරංග කීර්තිසිංහ පියතුමා මීසම් ජනතාවගේ ආධ්‍යාත්මික ප්‍රබෝධය පිළිබඳවත් මීසම දියුණු කිරීමේ අරමුණින් ක්‍රමවත් වැඩසටහන් දියත් කරන අතර එතුමාගෙන් අප මීසම් ජනතාවට වන සේවාව පැසසිය යුතුය.

✍ ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# පමුණුගම ඇලෙන්එගොඩ සා. සෙබස්තියන් මුනි දෙව්මැඳුර



පමුණුගම මීසමට අයත් ඇලෙන්එගොඩ සා. සෙබස්තියන් මුනි 15 වාර්ෂික මංගල උත්සවය ජනවාරි 25 ඉරුදින පැවැත්වීමට මීසම් සේවක ගරු ආනන්ද විතාන හා සහයක ගරු ෂෙනෝ සිල්වා පියතුමන් ඇතුළු දායක මණ්ඩලය සියල්ල සූදානම් කර ඇත.

1992 වසරේ මීසම් සේවක ලෙස පැමිණි ගරු බෙන්සිරි පෙරේරා පියතුමා මුළු ග්‍රාමය එක් තැන් කර හැමගේ ඇඩි ඇප කැප වීම මත 1995 මාර්තු 4 දින මුල් ගල තබා 1997. 09. 06 දින නව දෙව්මැඳුරේ උළු සෙවිලි කර අවසන් කරන ලදි.

පසුව පැමිණි ගරු රූබන් ලෙස්ලි පියතුමා දෙව්මැඳුරේ ඉතිරි වැඩ කටයුතු සියල්ල ජනතා සහයෙන් අවසන් කර 2000 ජනවාරි 30 එවකට කොළඹ අගරදගුරු අති උතුම් නිකලස් මාකස් හිමිපාණන් අතින් ආසිරි ගන්වා විවෘත කරන ලදි.

✍ ජෝ. සංගපාලආරච්චි

# කළුතර සිරිකුරුස විදුහලට නව පිහිනුම් තටාක සංකීර්ණයක්

කළුතර පුරවරය ඒකාලෝක කරමින්, දහනමවන සියවස අගභාගයේ දී සිරිකුරුස දේවස්ථානයට සමීපව, බ්‍රොහියර් නමැති බර්ගර් ජාතික මහත්මයකු විසින් ඇරැඹූ දැනුම් කේන්ද්‍රස්ථානයක් වූ කළුතර සිරිකුරුස විදුහල, එතැන් පටන් "විනයගරුක අධ්‍යාපනයක්" මුඛ්‍ය පරමාදර්ශය කර ගනිමින් ද, සපයන සේවා නාමාවලියට නවාංග එක් කර ගනිමින් ද, මාතෘ භූමියට මෙන්ම පාර්ශවකරුවන් හට අමිල ප්‍රතිලාභ ළඟා කර දෙමින් ද, දිනෙන් දින මහා වෘක්ෂයක් ලෙස වැඩුනේය.

සිරිකුරුස මාතාව, "පිහිනුම් තටාක සංකීර්ණයකින්" පෝෂණය කොට, ඉදිරි ගමනේ තවත් එක් ස්වර්ණමය මං සලකුණක් පසුකර යාමට සැරසේ. මෙම සත්කාර්යය ආදි සිසුන්ගේ ද ගුරු දෙගුරුන්ගේ ද ශිෂ්‍ය නායකයින් ඇතුලු සියලු සිසුන්ගේ ද සුභ පතන්නන්ගේ ද සාමූහික ප්‍රයත්නයක් වන අතර ආචාර්ය ගරු කැමිලස් ප්‍රනාන්දු අදියුරු පියතුමාගේ කළමනාකාරිත්වය හා සෘජු මඟ පෙන්වීම මත සිදුවන්නකි.

"පිහිනුම් තටාක සංකීර්ණ" ගමන් මඟෙහි සමාරම්භය ලෙස වත්මන් ආදි සිසු නිල මඩුල්ල අදියුරු පියතුමන් හා එක්ව, විදුහලට නව තාක්ෂණයෙන් පිරිපුන් පිහිනුම් තටාකයක අවශ්‍යතාව හඳුනා ගැනීමත් එය ඉදි කිරීමට තීරණය කිරීමත් සැලකිය හැකිය. මෙහිදී ඔවුන්ගේ මුඛ්‍ය පරමාර්ථය ලෙස සිසුන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමත්, ප්‍රවීණ පුහුණුකරුවන්ගේ මඟ පෙන්වීම මත, ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් ශූරයින් බිහි කිරීමත් සඳහන් කළ හැකිය.

කළුතර සිරිකුරුස විදුහල් ඉතිහාසයේ වර්ණවත්ම උළෙළ ලෙස මෙහි සමාරම්භක



අවස්ථාව කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ජනවාරි 30 දින පෙ.ව. 10.00 ට පැවැත්වේ.

✍ මංජුල ගුණවර්ධන





# හේබ්‍රෙව් රංග ප්‍රසංග සම්ප්‍රදායේ ප්‍රේම ගී රංගන කාව්‍යය

ජුදා සමාජයට දෘෂ්‍ය කාව්‍ය කලාව අකැප වූ නිසාත් සමකාලීන ග්‍රීක - රෝම - භාරත ආදී ලොව පුරෝගාමී නාට්‍ය සම්ප්‍රදායන් මේ වන විට ගොඩනැගී නොතිබුණ නිසාත් හෙබ්‍රෙව් කලාකරුවෝ තම ආගමික ව්‍යවස්ථාවට එකඟව නාටකීය ලක්ෂන අඩු නමුත් කාව්‍ය රසය හා දේව ගරු බිය සමග මුසුවූ ප්‍රඥාව උද්දීපනය කරන ස්වාධීන විකල්ප සාහිත ආකෘති නිපදවීමට සමත් වූහ.

මේ සඳහා පෙන්විය හැකි නිදර්ශන දෙකක් බයිබලීය පුස්ථක අතර හමුවේ. ඒ 'සොලමන්ගේ ගී' හෙවත් 'ප්‍රේම ගී' (Canticle of Canticles) සහ 'ජෝබ්ගේ කථාව' යන පොත් දෙකයි. (සාහිත්‍යයට පෙම් බඳින රසිකයින් වේ නම් මෙම පොත් දෙක නොකියවන ඔවුන්ගේ දෙනෙත් කුමටදැයි ප්‍රශ්න කළ යුතුය).

ජුදා ආගමික උත්සව වලදී 'ප්‍රේම ගී' වලට අමතරව රූත්, විලාපගී, එස්තර් සහ ධර්ම දේශකයා යන ග්‍රන්ථයන් ද කියවන ලදී. මෝසස් යුගය තරම් ඈතක සිට උරුමව එන්නාවූ වාචික සාහිත්‍ය සම්ප්‍රදායේ ආශ්වාදය මෙම පොත් ශ්‍රවණය කිරීමෙන් ලැබුණි. (පසුකාලීනව සිනගෝගවල රැස්වී සබත් දිනවලදී පංච පුස්තකය කොටස් වශයෙන් හඬනගා කියැවීමේ චාරිත්‍රයත්, ජුදා විවාහ මංගල උත්සව වලදී පංච පුස්තකයේ පාඨ සමග දිවැසිවරුන්ගේ පොත් වලින් ගත් උපුටා ගැනීමේ සජ්ජායනය කිරීමේ චාරිත්‍රයත් පෙර කී වාචික සාහිත්‍ය සම්ප්‍රදායේම විකාශනයක් ලෙස සැලකිය හැකිය.)

'ප්‍රේම ගී' ක්‍රි. පූ. 538 බැබිලෝනියානු විප්‍රවාසයෙන් ලත් අත්දැකීම් වලට පසුව රචනාවූ කෘතියකි. මෙහි අන්තර්ගතය පිළිබඳ විවරණ රැසකි. ඉන් එක් මතවාදයක් ගැන පුරාණ ගිවිසුම පිළිබඳ මහාචාරිනී ඩියානේ බර්ගන්ට් (Dianne Bergant) මෙසේ විස්තර කර ඇත.

'ප්‍රේම ගී' වල ඓතිහාසික මූලාකෘතිය විය හැක්කේ හැම වසන්ත කාලයකදීම සොබාදහම තුළ සිදුවන පරිසර වෙනස ජනවන්දනාත්මක වේශයෙන් ඉදිරිපත් කිරීමයි. පැරණි මැදපෙරදිග සමාජය තුළ පැතිර තිබූ සශ්‍රීකත්වයට අරක්ගත් දෙවි දේවතාවින්ගේ පුරාණෝක්තිය මෙමගින් හෙළිදරව් කෙරේ. ඒ අනුව පොළොවේ ඵලදාව ලබාදුන් පසු මහා දෙවියා (කානාන් දේශයේ බාල්ය. බැබිලෝනියාවේ දුමුසුය) මිය යන බැවින් සශ්‍රීකත්වයේ මව (පිළිවෙලින් ඉෂ්තාර් සහ අෂ්ටරොත්) වැළපෙන්නීය. ඇය ශීත සෘතුවේ පාළු පොළොවේ වියරුවෙන් ඔහු සොයා ඇවිදින්නීය. අවසානයේදී ඔවුහු හමුවෙති. එකතු වෙති. නැවතත් වසන්තය උදාවේ. ජුදා ජාතිකයින් සිරිත් පරිදි 'ප්‍රේම ගී' පොත වසන්ත කාලයේ උදාවන පාස්කුවේදී ගායනා කිරීමෙන් සනාථවන්නේ ඔවුන් තවමත් පුරාණයේ ප්‍රචලිතව පැවැති කෘෂිකාර්මික උත්සව වල බලපෑමට හසුව සිටි බවයි.

අන්‍ය ජාතික කානාන් ඇදහිලි සිරිත් ජුදා ජාතිකයින්ද අනුකරණයට පෙළඹී සිටි බවට බයිබලයේ බොහෝ තන්හි සාක්ෂි හමුවේ. ජුදා පාස්කු උත්සවය සම්ප්‍රදායික සැමරුම් දෙකක එකතුවක් බව පෙනී යන කරුණකි. පශු ඵලදාව වැඩිකර ගැනීමේ අරමුණින් පැවැත්වූ ඉපැරණි එඬේරෝත්සවය පළමුවැන්නයි. කෘෂි භෝග අස්වැන්න වැඩිකර ගැනීමේ අරමුණින් පැවැත්වූ නුමුහුන් පූප මංගල්‍යය දෙවැන්නයි. ජුදෙව්වරු පෙරකී එඬේරෝත්සවයට තමන්ටම අනන්‍ය වූ ඓතිහාසික අරුතක් ගැබ් කළෝය. එතුමා ඊජිප්තු වහල් බැම්මෙන් හෙබ්‍රෙව් ජනතාව දෙවියන් වහන්සේ විසින් මුදවා ගැනීමේ සිදුවීමයි. කානාන් දේශයේ පදිංචි වූ පසු ඔවුන් එඬේර ජීවිතයෙන් සමුගෙන කෘෂිකාර්මික ජීවිතයක් කරා මාරු වීම සැමරීමේ අරුතක් දෙවැන්නට ගැබ් කළෝය.

සශ්‍රීකත්වය සඳහා කළ පැරණි ජනවන්දනාවල ආ බොහෝ ලක්ෂන 'ප්‍රේම ගී' වලට ඇතුළුවී ඇත. ඒවාහි ආ පරිදිම මෙහිදීත් ගැහැනියට (ෂූලම්තික තරුණියට) ප්‍රමුඛත්වය හිමිවී ඇත. ප්‍රධාන චරිතය වන ඇය පෙම්වතාගෙන් වියෝවූ දෙවඟනක් වැනි රූපශ්‍රීයෙන් අගතැන්පත් වූ අයෙකි. අතරින් පතර කාන්තා පිරිස් සාමූහික ගායනයේ යෙදෙති. කථනයේ යෙදෙන චරිතවල හැඳුනුම් නාමයන් කලාතුරකින් දක්වෙන අතර කථන කොටස් සංවාදවලට වඩා ආත්ම භාෂණයෝය. ඇය විටෙක මනාලියකි. විටෙක සොහොයුරියකි. තවත් විටෙක මවකි. පෙම්වතා රජෙකු ලෙස නිරූපණය වන නමුත් වරින් වර එඬේරෙකු ලෙසද දිස්වේ. මෙම ජනවන්දනා නාටක ශෛලිය ඊශ්‍රායෙලයේ ජුදා නිල ජනවන්දනාවට ඇතුළු නොකළ නමුත් හුදකලා ගැමි කණ්ඩායම් අතර ප්‍රචලිතව පැවතුනි' (The Catholic Study Bible - R. G. 273-274)

මෙසපොතේමියානු සාහිත්‍යය හා පැරණි ගිවිසුම පිළිබඳ විශේෂඥයෙකු වූ ටී. ජේ. මීක් (T. J. Meek 1881-1966) ගේද අදහස් වන්නේ 'ප්‍රේම ගී' නිර්මාණය ඈත අතීතයේ දී මෙසපොතේමියාවේ ප්‍රචලිතව පැවති මහී මව් දෙවඟන හා සූර්ය දිව්‍යරාජයා අතර විවාහය සමරනුවස් පැවැත්වූ ඉපැරණි සම්ප්‍රදායික හෙබ්‍රෙව් ජන වන්දනා රචනා වලින් සංස්කරණය කරගත් සාහිත්‍ය ආකෘතියක් බවයි. ඒ අනුව මෙය මෙසපොතේමියානු ජනතාවගේ පූජනීය විවාහ මංගල සැමරුම් ගී රැගත් නාට්‍ය (Sacred Marriage Drama) ලක්ෂණ අඩංගු නිර්මාණයකි. Frank Delitzsch (1813-1890) අර්ථ නිරූපණය කරන පරිදි මෙය රංගනය හෝ ගායනය සඳහා ලියූ නාට්‍ය පිටපතකි. එහි ජවනිකා 6 ක් සහ දර්ශන 12 ක් තිබේ. ෂූලම්තික තරුණියක වෙත ආකර්ශනය වූ සොලමන් රජුගේ ප්‍රේමය වස්තු බීජය වේ. සොලමන් මේ තරුණිය තම අන්තඃපුරයට රැගෙන යන අතර එහිදී ඔහුගේ රාගය සැබෑ ප්‍රේමයක් බවට පත්වේ. මෙම තරුණිය ගලීලයේ ප්‍රත්‍යන්ත ග්‍රාමයකින් ආ ආගන්තුක ජෙරුසලමේ දුවකි. ඇ නිහතමානීය කථාවේ වීරවරිය වන්නීය.

'ප්‍රේම ගී' වල ප්‍රධාන චරිත තුනක් ඇති බව George Ewald (1803ප-1875) පෙන්වා දෙයි. ඒ ෂූලම්මිතික තරුණිය, සොලමන් රජු හා එඬේර තරුණයාය. ඇය පාරාවෝගේ දියණියකය යන අදහසද ප්‍රතික්ෂේප කරයි. චරිත පිළිබඳ වඩාත් නිවැරදි විවරණය කුමක් හෝ වේවා මෙම වෘත්තාන්තය මගින් නිරූපණය කර ඇත්තේ දෙවියන් වහන්සේ විසින් ස්ථාපිත කළ පාරිශුද්ධ විවාහ සංස්ථාව තුළ මානවයා විඳින පරම පවිත්‍ර රොමැන්තික හා ශෘංගාර අත්දැකීම බව පිළිගැනීම වඩාත් සුදුසු යැයි ආචාර්ය Paul Tanner (20 සියවස) ගේ මතයයි.

මෙයට ප්‍රතිපක්ෂ අදහසක් දරන Kinlaw මෙය නාට්‍යයක් නොවන බව කියයි. චරිත ගණන නිශ්චිත නොවීම, වේදිකා ජවනිකා අංක හා දර්ශනයන් පැහැදිලිව වෙන්කර ගත නොහැකිවීම ආදි කරුණු ඔහු ඊට හේතූන් ලෙස පෙන්වා දෙයි. මේ අතර carr පවසන්නේ පැහැදිලි වෘත්තාන්ත විකාශනයක් මෙහි නැති වුනත් නාට්‍යයට අනිවාර්ය අංග වූ ගැටුමක් (3:1-4) හා ගැටුම නිරාකරනය වීම (5:2-7) යන ලක්ෂණ ගැබ්වී තිබෙන බවයි.

මෙයින් පැහැදිලි වන්නේ 'ප්‍රේම ගී' වනාහි එක් එක් විද්වතුන්ගේ ඇගැයුම්වලට අනුව නාටකීය ලක්ෂන අඩු වැඩි වශයෙන් ගැබ්වී තිබෙන ස්වතන්ත්‍ර නිර්මාණයක් බවයි. මෙම නිර්මාණයේ අනන්‍යතාව තුළින් පැරණි හෙබ්‍රෙව් රංග කලා පිටපත් වල ස්වභාවය පිළිබඳ අදහසක් ලබාගත හැකිවේ. අප මෙහිදී පෙන්වා දිය යුතු වැදගත් කරුණු තුනක් ඇත. එකක් නම් පුරාණ ජන වන්දනා නාට්‍යයේ මහා දේව චරිතය 'ප්‍රේම ගී' වලින් ඉවත්කර තිබීමයි. ඒ වෙනුවට රජෙකු එඬේරෙකු ආදේශ කර තිබීමයි. යාවේ යන දේවතාවිය උච්චාරණය කිරීමට අද පවා බියවන ජුදා ජාතිකයෝ දෙවියන් වහන්සේගේ චරිතය මිනිසාගේ බුද්ධිය නිර්මාණ කෘතියක් තුළින් සමාරෝපණය කිරිමට එදා සිහිනෙකින් වත් නොසිතුවා විය හැකියි. එබැවින් ඔසිරිස්, බාල්, තම්මුස් වැනි මිථ්‍යා දෙවිවරුන් වෙනුවට යාවේ නාමය ආදේශ නොකළෝය. මේ මිත්‍යා දෙවිවරු මිනිසා විසින් හදාගත් දෙවිවරුය. සූර්ය ග්‍රහයාට දේවත්වයක් ආරෝපණය කරමින් දුන් විවිධ පුද්ගල නාමයෝය. එබඳු නාමධාරි දෙවිවරුන් නිරූපිත ජනවන්දනා පිළිවෙත් වලට යාවේ දෙවිඳුන් ආදේශ කළ නොහැකිය. මැවුම්කරු යනු මැවිල්ලක් නොවේය යන්න බයිබලීය දෘෂ්ටිය වන බැවිනි. (උප්පත්ති 1:16) දෙවැනි කරුණ නම් 'ප්‍රේම ගී' වෘත්තාන්ත නාටකයකට වඩා ගීතමය රැගුම් දැක්මකට උචිත වූ ආකෘතියකින් ඉදිරිපත් කිරීමයි. තෙවැනි කාරණය නම් වියෝදුකින් තැවෙන චරිත තුළින් නැගෙන විප්‍රලම්භ ශෘංගාර රසයෙන් ප්‍රණීත වූ මෙම නිර්මාණයෙන් ඕලාරික රතිය උද්දීපනය නොකිරීමට රචකයා වග බලා ගැනීමයි; සදාචාර දැක්මක් (ප්‍රේම ගී 8) ඉදිරිපත් කිරීමයි. දෙවියන් වහන්සේ මනුෂ්‍ය ආත්මය සමග මුසුවීමේ අධ්‍යාත්මික අත්දැකීම ස්ත්‍රී - පුරුෂ ප්‍රේමය ලෙස නිරූපණය කිරීම පෙරදිග ධ්‍යානයෝගී කවීන්ගේ මනාපය වූ බව හින්දු සාහිත්‍යයෙන්ද හෙළි වන කරුණකි. (මහාචාර්ය ඒ. එල්. බෂාම් - 'අසිරිමත් ඉන්දියාව පිටු 390). පෙරදිග මිනිසුන්ගේ ඓතිහාසික විඥාණය තුළ තැන්පත්ව තිබෙන දෙව් මිනිස් ප්‍රේමයේ අධ්‍යාත්ම මාතිකාව පැරණි ගිවිසුමේ පටන් නව ගිවිසුම දක්වා ව්‍යවහාරයේ පැවත ආවේය. හෙබ්‍රෙව් වරුන්ගේද අධ්‍යාත්මය තුළවූ මෙම මාතිකාව ඔවුන්ගේ සාහිත්‍යයෙන් පිළිබිඹු විය. ජේසුස් වහන්සේ තුමූම 'මනාලයකු' ලෙස හඳුන්වා දුන් සේක. (ලූක් 5: 34-35) එමගින් උන්වහන්සේ තම උපමාවෙන් කියැවෙන සෘජු වාච්‍යාර්ථය අභිබවා යන අධ්‍යාත්මික අරුතක් හැඟවීමට උත්සහ කළ බව පෙනේ.

**රංජිත් නිමල් කුරේරා**

# 'පවුල' විනාශයට හේතු

**සහකරුගේ හෝ සහකාරියගේ දුර්වලතාවයක් අධ්‍යාත්මික ඵලබර දිවියෙක වර්ධනය; වැඩීමයි. මෙය විමුක්තියේ සත්‍යයකි. ආරවුල මැද, සාමය උදෙසා අසුන් අරා සිටිනුයේ දෙවියන් වහන්සේයි. දෙවියන් වහන්සේ සමාදානයේ දෙවියන් වහන්සේය. අසමගිය, සමගියට පත්වන විට, එතැන දේව වරප්‍රසාද ඉතා ප්‍රබලව පවතී.**

කිසිදු මිනිසකු, ගැහැනියක සර්ව සම්පූර්ණ අයෙකු නොවේ. ආත්මීය ජීවිතයක් කරා ඇදී යනුයේ මෙවන් අඩුපාඩු සමග බැවින්, එකී දුර්වලතාවයන් හිදී. ඔවුනොවුන් තව තවත් දේව වරප්‍රසාද කරා යොමුවෙති. අවාසනාවකට මෙන්, අද බොහෝ පවුල් අතර අසමාදානයක් පවතීද ඔවුනගේ කඩිනම් පියවර වනුයේ දික්කසාදයයි. විවාහයට ප්‍රථම හමුවීමේදී, ඔවුනොවුන් අතර ලියලා, දළුලා වැඩිවර්ධනය වූ ආදරය, සෙනෙහස, ලෙන්ගතුකම කෙසේ වියැකී ගියාදැයි නොවැටහේ. සෑම දිනකම ආරම්භය අලුත් උදාවක් සේම, සෑම දිනකම විවාහ දිවිය නව ප්‍රේමණීය දිවිපෙවතකට ආරම්භයක් විය යුතුය.

පාපයේ බලවේගයෙන් හිස ඔසවන සමාජය, ශීඝ්‍ර දික්කසාදයකට, ඉතා පහසු මාවත් පෙන්නුම් කරයි. 'උන්වහන්සේ කෙරෙන් සැඟවිය හැකි කිසිවක් මුළු විශ්වයෙම නැත. උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි, සියල්ල වැස්මක් නැතිව විවෘතව තිබේ. අප ගණන් දිය යුත්තේ උන්වහන්සේටය' (හෙබ්‍රෙව් 4:13). පවුල විනාශවී, දරුවන් අතරමංවී මහා වින්නැහියකට පාදකවීමට පෙර, පවුල මුළුමෙන් දෙවියන් වහන්සේ කෙරෙහි නැඹුරුවන්නේ නම්, ප්‍රේමයේ රජාණන්වහන්සේ, පවුලේ ආදරය ආරක්ෂා කරදෙන සේක.

'විවාහකයන්ට මම මෙසේ අණ කරමි....... භාර්යාව ස්වාමිපුරුෂයාගෙන් වෙන්ව නොයේවා. වෙන්ව ගියොත් ඈ තනිව සිටීවා. නැතහොත් ස්වාමි පුරුෂයා හා සමගිවේවා, ස්වාමි පුරුෂයාද සිය භර්යාව දික්කසාද නොකළ යුතුය.' (1 කොරෙන්ති 7:10-11)

එකිනෙකා කෙරෙහි විශ්වාසයද, ඒ මත රඳා පවතින පක්ෂපාතිත්වය පවුලක දියුණුවකට ඉතාම වැදගත් වන්නකි. එකිනෙකා අතර තබා ඇති විශ්වාසය, කුමන අයුරකින් හෝ පළුදු කිරීම, බිඳ දැමීම ඉතා භයානක පාපී ක්‍රියාවකි. විවාහ ගිවිසුමට පටහැනි සියල්ල තුළ සාධාරණීය කිරීමක් අවැසි නැත. විවාහයේ පාරිශුද්ධත්වය, වංචනික අස්වැසිල්ලකින් කිසිසේත් පළුදු නොකළ යුතුමය. තම භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට නොදැනී, යමෙක් අන් ස්ත්‍රියක් හෝ පිරිමියකු සමග ලිංගික ඇසුරෙහි යෙදීම බරපතල වරදකි. විවාහ යුවළකගේ ශරීරයත්, එකිනෙකා උදෙසා පිදෙන පුදසුනක් සේ විය යුතුය.

"සිය බිරිඳ දික්කසාද කොට, අන් ස්ත්‍රියක පවාගන්නා කවරෙක් වුවද, කාමමිථ්‍යාචාරය කරයි. පුරුෂයකු විසින් දික්කසාද කරන ලද ස්ත්‍රියක පාවා ගන්නා ද කාමමිථ්‍යාචාරය කරයි." (ශු. ලූක් 16:18)

අනියම් සබඳතා පැවතීම, විවාහය හා පවුලේ උතුම්කම විනාශයට ඇද දමන පාපයන්ය. මෙවන් හැසිරීමක්, සෑම ආකාරයෙන්ම පාපයට නැඹුරුවකි. මේ හේතුවෙන් අඹු සැමියන්ගේ දික්කසාදයට බිලිපඬුරුවනුයේ අසරණ වූ දූ - දරුවන්ය. විවිධ සමාජ අපචාරයන්ට දුශ්ශීලයන්ට ගොදුරුවූ දරුවන්ගේ ශෝචනීය කතා පුවත වනුයේ, සිය මාපියන් වෙන්වී, වෙනත් අනියම් ඇසුරෙහි දිවි ගෙවන බවය. මා-පියන් හැර ගිය දරුවන්ගේ ලයෙන් නික්මෙන, නොතිත් ගලා යන සෑම සුසුමකටම, කඳුලකටම, එකී දෙමාපියන් ගණන්දිය යුතුය. අයුතු කම්සැප, සම්බන්ධතා මත රැඳුන දෙමාපියන් සමාජය ඉදිරියේත්, දෙවියන් ඉදිරියේත් විනිශ්දයට පමුණුවනු ලබන්නේමය. අඹුසැමි ප්‍රේමයේ ඵලය හා සම්පතවූ දරුවන්, මෙලෙස සමාජය තුළ නන්නත්තාර වන්නේ නම්, විනාශයේ පූජනීය බව කෙළසා ගත් දෙමාපියන් හට දිය හැක්කේ කුමනා කාරයේ දඬුවමක්ද?

### ඔබේ නිවස තුළ ස්වර්ගීය සතුට

'පවුල' දේව පවුලේ අසිරියට ලඟාවීමට ඇති බාධා, දුෂ්කරතා, අයහපත මොනවාදැයි හඳුනාග ැනීම ඉතා වැදගත්ය. පවුලේ බැඳීමට, සමගියට, එකමුතුකමට බාධාවන යම් යම් දෑ නිවසින් බැහැර කිරීම හෝ යම් පාලනයකට නතු කිරීම ඉතාම වැදගත් වන්නකි. නිදසුනක් ලෙස. නිවසක සාලයේ ඇති රූපවාහිනියේ, සියලුම වැඩසටහන් පවුලේ එකිනෙකා නැරඹීමට ලොල්වීම භයානක බාධාවකි. කෙටි වැඩසටහනක්, එකට එක්ව නරඹා. ඉතිරි කාලය පවුලේ සමාජිකයන්, එකිනෙකා සමග සුහද සාකච්ඡාවකට යොදා ගත යුතුමය. එකට හිඳ යාච්ඤා කිරීම, බයිබලීය වැකියක් කියවා අදහස් බෙදා ගැනීම. ජපමාලය උච්චාරණය කිරීම, සැමදෙනාටම පහසු ආකාරයට කාලයක් වෙන්කර ගැනීම වටී. පවුල එකට එකතුවී යම් ක්‍රීඩාවක යෙදීම. යම් සිදුවීමක් පිළිබඳ අදහස් විමසීම, පවුලේ ආර්ථිකය පිළිබඳ කතා කිරීම ආදී පවුලේ විවිධ අවශ්‍යතාවන් පිළිබඳව කතාබහ කිරීම කළ යුතු වන්නේය. එවිට නොදැනීම, පවුල එකිනෙකා කෙරෙහි තව තවත් සංවේදී වන්නාසේම කිසිදු කොන්දේසියකින් තොරව එකිනෙකා කෙරෙහි ඇප කැපවීමට ඉදිරිපත්වන්නේය. දෙමාපියන් හා දරුවන් අතර බැඳීම, ආදරය, විශ්වාසය වඩ වඩාත් තීව්‍ර වන්නේ එවිටය.

පවුලක යහපැවැත්මට උපකාරීවන යෝජනා කිහිපයක් මෙලෙස ඉදිරිපත් කරමි.

### සිදුවූ හෝ සිදුවන අත්වැරදීම් ගැන සිතන්න

තම තමා පෞද්ගලිකව හෘදසාක්ෂිය සෝදිසියක යෙදෙන්න. එහිදී දේව වරප්‍රසාදය මගින් අනාවරණය කරගන්න, තම අඩුපාඩු, වැරදිවල ගැඹුර, අයහපත මැනවින් සිතන්න. ඉන් වැලකී සිටීමට ගතහැකි සෑම ක්‍රියාදාමයක යෙදෙන්න

### පවුල විනාශ කරන සතුරන් හඳුනාගන්න

කොතරම් අපහසු වූවත්, එවන් සතුරන් මැඩපවත්වාගන්නට වෑයම් කරන්න අන් අයගේ උපකාරය ලබාගන්න.

### සැමදිනකම එක්ව යාච්ඤා කරන්න

පවුලේ ප්‍රීතිය, සමගිය හා බැඳීම වැඩිවර්ධනය වනුයේ එවිටය. දේව වරම්, උපකාර නිරතුරු එවන් පවුලක් සමග රැඳී පවතී.

### එකිනෙකා අගයන්න

තම සහකරු හෝ සහකාරිය හෝ දරුවන් විසින් කළ යම් යම් දේවල් අගයන්න. ඔවුනට ස්තුති කරන්න. ඔවුන් පසසන්න.

### නම්‍යශීලිවන්න

පවුලේ දියුණුවට තීරණ ගැනීමේදී අන් අයට සවන් දෙන්න. පොදු මතයට හිස නමන්න.

### සමාව දෙන්න

සමාව දීම තුළ මහා ප්‍රබල ක්‍රියාවන් සිදුවිය හැක. සෑමවිට සමාව දීමට හා සමාව ඉල්ලීමට ප්‍රථමයා වන්න.

### අදහස් හුවමාරුව හා නිසි සන්නිවේදනය

රළු පරුෂ නොවී, සෞම්‍ය ලීලාවෙන් අදහස් හුවමාරුව පවුලේ එකමුතුකමට, ප්‍රීතියට තෝතැන්නක් වේ.

### වගකීම් දැරීම

පවුලේ පැවැත්මට හා දියුණුවට යම් යම් වගකීම්, නිසි ලෙස ඉටුකරන්න. වගකීම් සමගියෙන් **බෙදාහදා ගන්න.**

පවුලේ යහ පැවැත්මට, එකිනෙකාට කළ හැකි දේ බොහෝය. කෙසේ වෙතත් පවුල් වර්ෂය ලෙස, සභාව කැපකළ මේ කාලයේදී, 'පවුල' යන කුඩා ඒකකය රැකගැනීමට එකිනෙකා උත්සාහ ගනිමු.

**ගරු මාරි අයේෂා පැව්දි සොයුරිය**
යහපත් එඬේරා නිකාය

දසත ආලෝකය විහිදුවමින්

දැල්වෙන පහන්

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා

# 83 වන වියට පා තැබූ නිකුලස් මාකස් හිමිපාණෝ



ශ්‍රී ගමු පුරවරයට ආසන්න මුන්නක්කරය නම් වූ ග්‍රාමයක් විය. මෙම ග්‍රාමයේ වැඩි වශයෙන් පදිංචිව සිටියේ කිතුනු බැතිමතුන්ය. ඒ අතර එක්තරා දැහැමි පවුලක් වූ කුලකුලසූරිය විල්ෆ්‍රඩ් සෙවරිනස් ප්‍රනාන්දු හා කුලකුලසූරිය මේරි මාග්‍රට් ප්‍රනාන්දු යන යුවලට දරුවන් අට දෙනෙක් විය. නිකුලස් මාකස් නම් වූ මෙම පවුලේ දෙවන දරුවා උපත ලැබුවේ 1932 වර්ෂයේ දෙසැම්බර් 06 වන දිනය. එම ග්‍රාමයේ දේවස්ථානයේ මුනිවරයා නිකුලස් මුනිවරයාය.

එම මුනිවරයාගේ මංගල්‍ය දින මෙලොව එළිය දුටු බැවින් දෙමව්පියන් විසින් මෙම දරුවාට නිකුලස් යන නාමය තබන ලදි. මෙම නිකුලස් දරුවාගේ පියා එම ප්‍රදේශයේ ප්‍රකට ව්‍යාපාරිකයෙකි. එමෙන්ම ඔහු දක්ෂ ඔරු තනන්නකු හැටියට ප්‍රදේශය තුළ කීර්ති නාමයක් දැරීය. දරුවන් අට දෙනෙකුගේ පවුලක් පවත්වාගෙන යමින් ඉමහත් ආර්ථික අරගල වලටද මුහුණ දෙමින් තම ජීවන රටාව ගොඩනගා ගත් මෙම මව්පිය යුවල තම දරුවන් දැහැමි ආගමික පසුබිමක් වෙත යොමු කිරීමට ද කිසිවිටක අමතක නොකළේය.

මෙම නිකුලස් මාකස් දරුවා තම මූලික අධ්‍යාපනය ලැබුවේ මුන්නක්කරය රෝමානු කතෝලික දෙමළ විදුහලෙනි. මෙම දරුවාගේ නිවස පිහිටා තිබුණේ දේවස්ථානය අසල දකුණු පසය. යම් යම් ආගමික කටයුතු සඳහා ලැදියාවක් දැක්වූවත් කුඩා කාලයේදී හෙතෙම අධ්‍යාපනයට නම් එතරම් නැඹුරු වූ බවක් දක්නට නොමැත. වයස අවුරුදු 10 පමණ වූ කාලයේදී මෙම දරුවා මීගමුවේ සා. මරියා විද්‍යාලයට ඇතුල් වීමට හේතුකාරක වූයේ ආගමික තරග විභාග වල දී ප්‍රථම ස්ථානය දිනා ගන්නට තරම් වූ දක්ෂයකු වූ නිසාය.

12 වන වියේදි පමණ මෙම දරුවාගේ සිත පැවිදි දිවියක් පිළිබඳ මුමුණන්නට විය. හෙතෙම පැවිදි දිවියට පිවිසීම පිණිස කරුණු කාරණා සොයා බැලීමට කටයුතු කළේ දෙමව්පියන් සමග නොවේ. මෙම දරුවා එවකට මීසම්පතිව සිටි ගරු සෙබස්තියන් ප්‍රනාන්දු පියතුමන් හමු වී පූජකවරය සඳහා යොමු වීමට අවශ්‍ය පසුබිම සකසා ගත්තේය. මෙතුමාගේ ආශාව මුදුන්පත් වෙමින් 1945 ජනවාරි 15 වන දින නිකුලස් මාකස් දරුවා බොරැල්ල සා. ඇලෝසියස් දෙව්සත්හලට ඇතුළු විය. එතුමා පූජකවරය ලැබුවේ රෝමයේ දීය. ඒ 1959 වර්ෂයේ දෙසැම්බර් 20 වන දින දීය. 1960 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි පසු නිකුලස් මාකස් පියතුමා ශා. පීතර විදුහලේ කථිකාචාර්යවරයකු ලෙස සේවය කළේය. අනතුරුව දෙව්සත්හලේ භාණ්ඩාගාරික ධූරයත් ඉන් අනතුරුව සා. ඇලෝසියස් දෙව්සත්හලේ අධ්‍යක්ෂ ලෙසත් කටයුතු කළේය. එතුමා කොළඹ පදවියේ අගරදගුරු හැටියට පත්වුයේ 1977 වසරේ මාර්තු 30 වන දින දීය. උන්වහන්සේ මෙම පදවියට ඔසවනු ලැබුවේ අම්පිටිය දෙව්සත්හලේ සේවය කරමින් සිටි කාලයේදී විය.

මම කිතුනුවකු ලෙසින් එඬේරමුල්ල මීසම නියෝජනය කරමින් විවිධ ගිහි සංවිධාන තුළ කටයුතු කරමි. ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය, සා. විසෙන්ති ද පාවුලා සංගමය, කිතුනු විවාහ හමුව, ඒවායින් සමහරකි. මෙම සංගම් වල ජාතික මට්ටමේ ක්‍රියාකාරිකයකු වීමෙන් අනතුරුව යම් යම් අවස්ථා වල දී නිකුලස් මාකස් හිමිපාණන් ඇසුරු කිරීමට බොහෝ අවස්ථා වල දී කරුනු කාරණා සැලසිණි. 1990-2000 කාල වලදි අපේ රටේ කිතුනු විවාහ හමුව ඉතා උසස් මට්ටමක පැවතිණි. එවකට එහි අධ්‍යක්ෂ පියතුමන් හැටියට කටයුතු කෙළේ අයිවන් පෙරේරා පියතුමාය. නිකුලස් මාකස් හිමිපාණෝ මෙම විවාහ හමුව ව්‍යාපාරය ඉතා ඉහලින් ඇගයීමට පත් කළ කෙනකු විය. පවුල තුළින් කියැවෙන උත්තරීතර යුග දිවිය තුළින් පණ ගැන්වුණු කිතුනු සභාවේ පෝෂණය පිළිබඳව එතුමාගේ වචනය එදා එම ව්‍යාපාරයට මහත් රුකුලක් විය. මිනිසකු හැටියට ජීවතුන් අතර සිටිය දී තම ශුද්ධවර භාවය තම මුහුණින් ලෝකයට කියාපාන්නට ඇත්නම් දෙවිඳුන් අභියස එය කෙතරම් වාසනාවක් ද? යම් යම් අවස්ථා වල දී එතුමා අභියස මා සිටිය දී ඇත්ත වශයෙන්ම මා දුටුවේ සැබෑ ශුද්ධවරයෙකි. එතුමා කිතුනුවා හඳුනාගැනීමේ කදිම ප්‍රඥා මහිමයකට හිමිකම් කියන්නෙක් විය. මා එසේ කියන්නේ මාගේ පුද්ගලික අත්දැකීම් මතකයට නගමිනි. මා කොළඹ නගරයේ යම් යම් උවමනා වලට ගමන් කරමින් සිටිය දී තම මෝටර් රථයෙන් උන්වහන්සේත් ගමන් කරන අයුරු මම දැක ඇත්තෙමි. මා දුටු විගස හස්ත සංඥාවකින් ආචාර කිරීමට උන්වහන්සේ කිසි විටක අමතක කළේ නැත.

අගරදගුරු පදවියේ නායකත්වය දරමින් උන්වහන්සේ තමන් සතු කාර්යභාරය කුමක් දැයි හොඳහැටි තේරුම් ගනිමින් තම බැටළු රැළ දෙවියන් වහන්සේගේ වචනය කරා ගෙන යාමට සැම විටම මහෝපකාරි පසුබිමක් සැලසුම් කළේය.

මනුෂ්‍ය මට්ටමින් ගත් කල තමා සතු බලය හා නිලය ස්ව කැමැත්තෙන් අතහැර යාමට කැමැති වන කෙනෙකු අපට හමුවන්නේ කලාතුරකිනි. මෙම යුගයේ එවැන්නකු මට හමු වූ පළමු අවස්ථාව ලෙස මා සලකන්නේ නිකුලස් හිමියන් ය.

උන්වහන්සේ 2002 වර්ෂයේ දී විශ්‍රාම ගියේ තම අගරදගුරු පදවිය ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ට තිළිණ කරමිනි. මෙම විශ්‍රාම ගැනීම ශ්‍රී ලාංකික කිතුනු ජනතාවට විශේෂයෙන් කොළඹ පදවියේ කිතුනුවන් හට ඉමහත් සංතාපයක් ඇති කරවන කරුණක් ද විය. උන්වහන්සේගේ විශ්‍රාම ගැනීමේ දෙව් පුද මෙහෙය පවත්වනු ලැබුවේ කොටහේන ශා. ආනා ආසන දෙව් මැඳුරේදීය. මෙහිදී එඬේරමුල්ල මීසම නියෝජනය කරමින් එම අවස්ථාවට සහභාගි වීමට මට ද අවස්ථාව ලැබිණි. සෑම මීසමක්ම නියෝජනය කරමින් අති මහත් සැදැහැවත් පිරිසක් මෙම දෙව්පුද මෙහෙයට සහභාගි වූහ. එදා උන්වහන්සේ තම සැදැහැවත් ජනයා අමතා කළ දේශනය බොහෝ කලක් යන තුරු අප හදවත් තුළින් යන්නක් නොවිය. උන්වහන්සේගේ විශ්‍රාම ගැනීම පිළිබඳව එක්තරා කිතුනු දේශපාලකයකුගේ අදහස වූයේ මෙම විශ්‍රාම ගැනීම උන්වහන්සේ කළ ඉතා මෝඩ ක්‍රියාවක් බවය. ඇත්තවශයෙන්ම දේශපාලනික මුහුණුවරින් සිතන විට බලය හා නිලය අත්හැර යාම මෝඩ ක්‍රියාවක් යැයි සිතිය හැකිය. නමුත් ආත්මික වශයෙන් ගත් කල නියමිත අවස්ථාවේ දී තම නිලය ස්ව කැමැත්තෙන් පරිත්‍යාග කිරීමට සිත් තුළ ඇති වන්නේ දෙවිඳුන් තුළ රැ දෙන්නන් හට බව දේශපාලනික වශයෙන් තේරුම් කර දීමට අපට පුළුවන්කමක් නැත. එය ඔවුන්ගේ මතයයි. උන්වහන්සේ අද විශ්‍රාම සුවයෙන් පසුවේ. උන්වහන්සේ විශ්‍රාම ගියත් කොහේ හෝ තැනක ඇසු දුටු විට මේ අපේ ශුද්ධවරයා නේදැයි ක්ෂණිකව මනසට පසක් වන්නේ අතීත සැමරුම් යළි යළිත් මතකයට කැඳවමිනි. උන්වහන්සේ 83 වන විට පා තබන මේ අසිරිමත් දිනේදි අපි කුමක් පතමුද? තව තවත් දෙවිඳුන් තුළ රැඳෙමින් උන්වහන්සේට අවශ්‍ය ශාරීරික හා මානසික සුවය නොඅඩුව ලැබෙන්නට කියා අපි ප්‍රාර්ථනා කරමු! අපි යාච්ඤා කරමු.

නිකුලස් මාකස් හිමිපාණනි ඔබ වහන්සේට සුබ උපන් දිනයක් වේවා!

**යූ. හර්බට් පෙරේරා**
එඬේරමුල්ල

# පූජකවරයේ 50 වසර පිරි ගරු පීටර් ප්‍රනාන්දු පියතුමා



**මෙලොව තම ජීවිත ගමනේ, පූජකවරය නමැති පහන සිළුවෙන් තම ජීවිතය නමැති පහණ දල්වාගෙන ඒ පහනින් පුරා පනස් වසරක් පුරාවටම ලොවක් ආලෝක කළ ගරු පීටර් ප්‍රනාන්දු පියතුමන්ගේ පූජකවරයේ 50 වන ජුබිලි සංවත්සරය 2014.12.21 වන දිනට යෙදී තිබුණි.**

1937 උඳුවප් මස 19 වන දින ජී. ග්‍රාසියානු සහ ලූසියා ප්‍රනාන්දු යන දැහැමි දෙමාපියන්ට දාව මෙතුමා මෙලොව එළිය දිටීය. දේව කැඳවීමට අවනත වෙමින් දේව රාජ්‍ය සඳහා මිනිසුන් දිනන්නට තරම් දැඩි ආශාවකින් පෙළුනු මෙතුමා 1951 දී කුලියාපිටිය මීසම් සේවක ගරු රොබට් පියතුමන්ගේ මඟපෙන්වීම මත අතිඋතුම් පූජකවරය පතා මාරවිල සාන්ත පාවුළු දෙව්සත්හලට පියමනින්නේ එය යථාර්ථයක් බවට පත් කරගැනීමේ අරමුණ මුදුන් පත් කරගැනීමේ අභිලාශයෙනි.

කනිටු දෙව්සත්හල් අධ්‍යාපනයෙන් පසුව 1958 දී තම ජීවිතයේ නැවුම් අඩිතාලමකට පය තබමින් අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුළු වූ පීටර් පියතුමා දර්ශනවාදය සහ දේවධර්මය පිළිබඳව වන නිපුනත්වයක් ලබා ගන්නේ ඇදැහිල්ල තුළ තව තවත් ශක්තිමත් වෙමිනි. ගංගාවක් එක් කොනක සිට ආරම්භය සනිටුහන් කරමින් ගල් පරවල හැපී එමෙන්ම නොයෙකුත් බාධක මැද ඉදිරියට ඇදෙමින් අවසානයේ මුහුද සිපගන්නා සේම ගරු පීටර් ප්‍රනාන්දු පියතුමා තම ජීවිත ගමන තුළ කුමන බාධකයක් පැමිණියද එයට සාර්ථකව මුහුණ දෙමින් පූජකවරය නමැති මිල කළ නොහැකි ඒ අද්විතීය ජීවිත ගමන වැළඳ ගන්නේ 1964.12.21 වන දින එවකට සලාපුර රදගුරු තැන්පත් ස්වර්ග ස්ථ වී වදාළ අතිඋතුම් එඩ්මන් පීරිස් රදගුරු හිමිපාණන්ගේ සුරතිනි.

මනා දැනුමකින් හෙබි එසේම දේව සේවය හමුවේ නොපැකිළව හා නොපසුබටව ඉදිරියට යන ගමනේ, උන්වහන්සේගේ කුළුදුල් සේවය ලැබීමට තරම් මාරවිල සහ නයිනමඩම මීසම් වාසනාව ලැබීය. එලෙසම මීසම් පාලක පියතුමකු ලෙස 1971-1977 දක්වා කුරුණෑගල පදවියේ කටුපොත මීසමේත්, 1977-1981 දක්වා හලාවත අඹකඳවිල මීසම් පාලනාධිපති වශයෙනුත් ඒ අතර තුර කොළඹ කොටහේන ආසන දෙව් මැඳුර හා සම්බන්ධ සාන්ත ලූසියා 'රේඩියෝ ලැබ්' හී කාර්මික අධ්‍යාපනය හැදෑරීමත් සිදුකරන ලදී. ඉන්පසුව නයිනමඩම සා. අන්තෝනි දෙව්මැඳුරේ මීසම් පාලක පියතුමා වශයෙන් වසර දෙකක පමණ කාලයක් සේවය කිරීමෙන් අනතුරුව හලාවත විතානික කාර්මික පාසලේ නිර්මාතෘ හා එහි පළමු අධ්‍යක්ෂ පියතුමන් ලෙස පත්වීම් ලැබ විශේෂයෙන් අධ්‍යාපනය අතර මඟ නවතා දමා තිබූ තරුණ ජීවිත වලට සරිලන කාර්මීක අධ්‍යාපනයක් ලබා දී ඔවුන්ව දක්ෂ කාර්මීකයන් ලෙස සමාජගත කිරීම මෙතුමා අතින් සිදුවූ ඒ අමිල සේවයට එක් උදාහරණයකි. මේ අනුව මෝටර් කාර්මීක විද්‍යාව, විදුලි කාර්මීක විද්‍යාව හා ඉලෙක්ට්‍රෝනික විද්‍යාව යන විෂයයන් ත්‍රිත්වය අරඹන ලදුව මේ සියලුම විෂයන් හදාරන තරුණයන් සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වූ අතර ඒ හැරුණු කොට පෞරුෂය වර්ධනය සඳහා නායකත්ව පුහුණුවද ලබාදෙන ලදී. 1989 වසරේදී පීටර් පියතුමා කුරුණෑගල පදවියේ නිකවැරටිය මීසමේ සේවය සඳහා ගියද 1991 දී වැඩිදුර අධ්‍යාපනය සඳහා එංගලන්තයේ වෙස්මිනිස්ටර් විද්‍යාලයට ඇතුළු විය. එහි වැඩිදුර අධ්‍යාපනයෙන් පසුව වසරක කාලයක් ඇමරිකා එක්සත් ජනපදයේ තම ධර්මදූත කාර්යයන් හී නියැලුන අතර ඉන්පසුව 1993 වසරේදී කුරුණෑගල පැල්ලන්දෙණිය මීසමේ මීසම් සේවක පියතුමා ලෙස පත්වීම ලැබ එහි සේවය සඳහා ගිය අතර එයට අමතරව කුරුණෑගල සෙඩෙක් ආයතනයේ අධ්‍යක්ෂ පියතුමා ලෙසද කටයුතු කළේය.

1994 වසරේදී නැවත තම අධ්‍යාපනය සඳහා එංගලන්තය බලා පිටත් වූ මෙතුමා 1995 නැවතත් දිවයිනට පැමිණ හලාවත පදවිය හා නැවත සම්බන්ධ වී හලාවත විතානික කාර්මික ආයතනයේ අධ්‍යක්ෂ ධූරය හෙබවීය. 1995 - 1998 දක්වා එහි අදියුරු පියතුමා වශයෙන් උදාර සේවයක් තුළ මෙතුමාගේ සේවය ඇගයීමට හුදු වචන ප්‍රමාණවත් නොවේ. ආයතනයේ සුබ සිද්ධිය සඳහා එතුමා කළ කැපකිරීම අදද එහි කාර්ය මණ්ඩලය ආවරණය කරනුයේ අභිංසක ආඩම්බරයකින් හා මහත් වූ සෙනෙහසිනි. ටෙක් විතානික ආයතනයේ අධ්‍යක්ෂ ධූරයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපදයේ දහම් සේවය සඳහා යන මෙතුමා එතැන් සිට අද දක්වා ටෙක් විතානික ආයතනයේ උන්නතිය සඳහා මූල්‍යමය ආධාර සපයමින් ආයතනයේ දියුණුවට කටයුතු කිරීමෙන් ගම්‍ය වන්නේ එතුමා තුළ ඇති අධ්‍යාත්මයේ තියුනු බව හා කැපවුණු සේවයේ ගැඹුරු බවයි.

පුරා වසර 50 ක් දේව සේවය තුළ නොසැලී සිටිමින් දුක, කඳුළ සහ සතුට, ප්‍රීතිය එක ලෙස විඳ දරා ගනිමින් ස්වාමීන් වහන්සේ තුළ මුළු විශ්වාසයම තබා උන්වහන්සේගේ හද දිනූ ඒ සුන්දර හදවතක් ඇති කාරුණික, චාම් චරිතයට පණ පෙවු ගරු පීටර් ප්‍රනාන්දු පියතුමනි, පූජක දිවියේ 50 විය සමරන ඔබවහන්සේට අපගේ සෙනෙහබර ශුභාසිංශනය මෙසේ පුදකරමු.

**ගරු රනිල් ඉන්දික පියතුමා**
සා. අන්තෝනි උසස් අධ්‍යාපන ආයතනය
හලාවත

# ගුරු සේවයෙන් විශ්‍රාම ගනී



කොද/ සියලු සාන්තුවරයින්ගේ බාලිකා විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිනිය වශයෙන් සේවය කරමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල පිරිසකට යහමඟ පෙන්වූ කැළණියේ පදිංචි, ඇන් පණ්ඩිතරත්න ගුරු මාතාව අවු. 36 ක ගුරු සේවයෙන් පසු ඉකුත්දා විශ්‍රාම ලැබුවාය.

ඇය ගැන ගුරු මඬුල්ලෙන්

“විටෙකදි මවක් විය
විටෙකදි සොයුරියක් විය
විටෙකදි මිතුරියකි ළබැදි
තනතුරින් නි. විදුහල්පතිනියයි ඔබ......
අභරණ කොට නොගත්
තනතුරු කෙසේ තිබුණත්
සැලකුවේ ඉහළින්ම
මිනිසත් බවය කවදත්.....

ඇය ගැන සිසු සිසුවියන්

“පළමුවර මා පරාජය වී, ලොවම එපාවී
සියල්ල කලකිරි සිටින විට
ඔබගේ දයාබර එකම වදනින්
මගේ ආත්මය සුවපත් වූවා

‘සඳ මඬල ඔබමයි
අඳුරු අහසට එළිය දුන්....
මල් උයන ඔබමයි
අපේ සිත් තුළ සුවඳ විහිදු
තරු රැන ඔබමයි
සෙනෙහසේ අරුත කියා දුන්
මිණි පහන ඔබමයි
අපේ සිත් තුළ සදා නොමැකෙන.....’

**මානෙල් මුදලිගේ**

ශ්‍රී ලංකාවේ ..... 1 පිටුවෙන්

ගුවන් යානයේ දී වැඩිදුරටත් කතා කළ සසුන් පියා ශ්‍රී ලංකාවේ අන්තර් ආගමික සමගිය රටේ තිරසාර සාමය, එකමුතුකම හා සංහිඳියාව ගොඩනැංවීමේ එකම මාවත බවත් එහි මූලධර්මවාදී කොටස් සිටින නමුත් ජනතාවගෙන් බහුතරය ඔවුන් සමඟ නොවන බවත්, එහි දැඩි මතධාරිහු සිටින නමුත් බහුතර ජනතාව ඔවුන් සමඟ නොසිටින බවත් ය. වැඩසටහනට අයත්ව නොතිබූ එහෙත් අමතරව එක් කළ බෞද්ධ විහාරස්ථානයකට මා ගියේ මේ අන්තර් ආගමික සුහදතාවය හා සමයාන්තර සංවාදය වඩ වඩාත් ශක්තිමත් කිරීමට ය. එහිදී බෞද්ධ භික්ෂුන් වහන්සේ ප්‍රමුඛ ඒ ආගමිකයනට මා සුබ පැතූ අතර එතුමන් මා වෙනුවෙන්ම ශුද්ධ ධාතු ප්‍රදර්ශනයක් ද පැවැත්වූවා. විහාරාධිපති ස්වාමීන් වහන්සේ මා පිළිගැනීමට ගුවන් තොටුපළට පැමිණි අතර මා එතුමන්ට සුබ පැතීමට විහාරස්ථානයනට ගියේ යැයි පැවසීය.



මීගමුව පුංචි රෝමය නමින් විරුදාවලිය ලත් කතෝලිකයන් බහුලව වෙසෙන ප්‍රධාන නගරයයි. අති උතුම් ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේ බෝලවලාන සංස්කෘතික මධ්‍යස්ථානයට පැමිණි අවස්ථාවේ මීගමුව පුරපති ඇන්ටනී ජයවීර මහතා උන්වහන්සේව සිපාචාර කරමින් (දකුණ) දේව ආශිර්වාද ලබා ගන්නා අයුරු.

සැදැහැවත් ජනතාවද පාප් වහන්සේගේ හස්ත ස්පර්ශය ලබා ගනී. අති අතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් උන්වහන්සේ පසුපසින් සිටිති. **(මීගමුවේ රේමන් අපොන්සු)**

ප්‍රදීප දසත තොරතුරු

## පුවත් විත්ති



ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 25 ඉරිදා

# 2015 ජනවාරි 30 දින ජනගත කෙරෙන වර්බුම් ටෙලිවිෂන් කතෝලික මාධ්‍ය නාලිකාව

**වර්බුම් ටීවී නාලිකාව ජනවාරි 30 සවස 4.30 සිට සිය විකාශන කටයුතු ආරම්භ කරයි. ඊට අදාළ කලඑළි උත්සවය, නාලිකාවේ විකාශනයට සමගාමීව කොළඹ අගරදගුරු මැදුරු නව ශ්‍රවණාගාරයේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ රදගුරු හිමිපාණන් සහ ආරාධිතයන්ගේ සහභාගිත්වයෙන් සිදු කැරේ.**

මේ නාලිකාවේ අධිපතිත්වය දරන මිලන් ද සිල්වා මහතා මේ වන විට ලෝකයේ අධි තාක්ෂණික මෙවලමෙන් යුත් සියලු පහසුකම් වලින් සමන්විත මැදිරි සංකීර්ණයක් නිර්මාණය කර ඇති අතර, රූපවාහිනී නාලිකාවට අවශ්‍ය අනෙකුත් සියලු අවැසියාවන් ද පුහුණු සේවක මඬුල්ලක් ද සිය කාර්යය සඳහා උපයෝගි කරගෙන ඇත.

මෙයට වසර 35 පමණ පෙර දී අංකුර නාට්‍යකරුවකු වූ ඔහු, මේ වන විට මැද පෙරදිග කලාපයේ ප්‍රකට කිතුනු ව්‍යාපාරිකයෙක් ලෙස නමක් දිනාගෙන සිටියි. සැම විටම දේව වචනය කෙරෙහි සියලු බර තබා කටයුතු කරන දැඩි බැතිමත් කතෝලිකයකු වන මිලන්, "වර්බුම් ටීවී" නාලිකාව වෙනුවෙන් ලක්ෂ හයසිය පනහක වියදමක් දරා ඇත. නාලිකාව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ඔහුට දිනකට වැයවන මුදල රුපියල් ලක්ෂ 2.5 පමණ වන බව ගණන් බලා ඇත. එය ව්‍යාපාරිකයකුට වුව විශාල අභියෝගයකි.

දේශීය කිතුනු වැඩසටහන් වලට අමතරව, වතිකාන සීටීවී ආයතනය සමඟ ගිවිසුම් ගතව වතිකාන පුවත් ද, ඉන්දියාවේ ෂාලොම් ටීවී, ඩිවයින් ටීවී මෙන්ම ඉතාලියේ රෝම්රිපෝට් ආයතන සමඟ එක්ව ලෝක කිතුනු පුවත් ද විකාශනය කිරීමට කටයුතු සලසා ඇත.

ජනවාරි 30 සිට දිනපතා පැය විසිහතර පුරා වැඩසටහන් විසුරුවා හැරීමට වර්බුම් ටීවී සූදානම්ව සිටින අතර එය උදෑසන 5.30 ජපමාලය උච්චාරණය කිරීමෙන් ආරම්භ වීමට නියමිතය. මුලදී දේශීයව විසුරුවා හරින වැඩසටහන් පැය 6 ක් ද, අන් කාලයේ දී EWTN කතෝලික රූපවාහිනී සේවයේ වැඩසටහන් ද විසුරුවා හැරීමට ඔවුන් සැලසුම් කර ඇත. එය ඩයලොග් ටීවී සහ පියෝ ටීවී ඔස්සේ විකාශනය කෙරෙයි. එසේම verbumtv.com වෙබ් අඩවිය මගින් අන්තර්ජාලයෙන් නැරඹිය හැකිය.



මහජන සාමය, ආපදා කළමනාකරණ හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග මහතා කොළඹ 07 විද්‍යා මාවතේ පිහිටි ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ දී නොබෝදා සිය රාජකාරි කටයුතු ආරම්භ කළේ ය. එහිදී අමාත්‍යවරයා කතෝලික පියතුමන්ගේ ආශිර්වාදය ලබා ගත් අවස්ථාව සේයාරුවේ දැක්වේ. **(නිමල් පෙරේරා)**

## සා. ජෝශප් වාස් මුනි මංගල්‍යය මීගමුවේ දී ප්‍රථම වතාවට සැමරේ

මීගමුවේ ග්‍රීන් පාර්ක් හිදී මීට වසර ගණනාවකට ප්‍රථම ස්ථාපනය කරන ලද සා. ජෝශප් වාස් මුනි පිළිරුව සහිත මණ්ඩපයේ වාර්ෂික මංගල්‍යය අති උත්කර්ෂවත්ව මීගමුව උතුරු කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මීගමුව මහාවීදිය දේවස්ථානයේ පාලක ගරු ක්ලෙමන්ට් රොසයිරෝ පියතුමාගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සිදු කරන ලදි. මෙය සංවිධානය කරනු ලැබුවේ ග්‍රීන් පාර්ක් ත්‍රිරෝද රථ රියදුරු සංගමය විසිනි. **(ඩුෂාන් රොද්‍රිගෝ)**

## මංගල ආසිරි !



කොළඹ 15, මෝදර ශු. ස්නාවක ජුවාම් මුනි දේවස්ථානයේ ජනක මංජු ශ්‍රී රාජපක්ෂ මහතා මට්ටක්කුලිය සා. මරියා දේවස්ථානයේ ලක්ෂානි සඳරුවණි කොස්තා මෙනෙවිය සමඟ මට්ටක්කුලිය සා. මරියා දේවස්ථානයේ දී පසුගිය දා යුග දිවියට පිවිසියේය.
ස්වර්ගස්ථ වූ අබා කොස්තා පියතුමාගේ ඥාති දියණියක වන ලක්ෂානි දේවස්ථානයේ ක්‍රියාකාරී සාමාජිකාවකි.
මංජු ශ්‍රී රාජපක්ෂ මහතා මෝදර මීසමේ දහම් පාසල් ගුරුවරයකු වශයෙන් ද තරුණ සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙසද සේවය කර ඇත. ඔහු දක්ෂ රංගන ශිල්පියකු මෙන්ම ඥානාර්ථ ප්‍රදීපයේ හා ළමා ප්‍රදීපයේ සුහද වාර්තාකරුවෙකි. ඔවුන් දෙපළට ප්‍රදීප සුපැතුම්! **(මෝදර රනිල් රාජපක්ෂ)**



සීදුව නිර්දෝෂ දේව මාතා දෙව්මැඳුරේ දහම් සේවිකාවක් හා දෙව්මැඳුරේ හා මීසමේ උන්නතියටත් විශේෂයෙන් දහම් පාසල් දරුවන්ගේ අභිවෘද්ධියටත් කටයුතු කරන මුදිතා රුද්‍රිගු මෙනෙවිය පමුණුගම රොමේෂ් මහතා සමඟ අතිනත ගත්තාය. ඔවුන් දෙපළට ප්‍රදීපයේ සුබපැතුම්! **(බෙන්ජමින් කිරිහෙට්ටි)**



බුළුපිටිය මීසමේ කාර්මෙල් මාතා පෙර පාසලේ අවු. 10 පමණ කාලයක සිට පෙර පාසල් ගුරුවරියක ලෙස ද එම දේවස්ථානයේ දහම් ගුරුවරියක ලෙසද සේවය කළ ශානලීන් සෙබස්තියන් මෙනවිය පසුගියදා යුගදිවි ගමන් ඇරඹුවාය. ඇයගේ අත ගත්තේ මහනුවර සා. අන්තෝනි දෙව්මැඳුරු ගායනා කණ්ඩායමේ සාමාජිකයකු මෙන්ම එම දහම් පාසලේ දහම් ගුරුවරයකු ලෙස සේවය කරන රොඩ්නි ප්‍රනාන්දු මහතා ය. ශානලීන් සහ රොඩ්නිට ප්‍රදීප සුබපැතුම්! **(මැටිල්ඩා නානායක්කාර)**

## ශ්‍රී ලංකා කුර්සියෝ පෙරමුණ වාර්ෂික කුර්සියෝ සම්මන්ත්‍රණය - 2015

කුර්සියෝ පෙරමුණේ 48 වන වාර්ෂික සම්මන්ත්‍රණය 2015 පෙබරවාරි මස 01 වන දින පෙරවරු 8.00 ට බම්බලපිටිය සා. පීතර විදුහලේ දී පැවැත්වීමට නියමිතව ඇත. කුර්සියෝ සාමාජිකයින් සැම කෙනෙකුටම මෙම සම්මන්ත්‍රණයට සහභාගි වීමට යාච්ඤාශීලිව ආරාධනා කරන අතර, මෙයට සහභාගි වීමට අවශ්‍ය වන ප්‍රවේශ පත්‍රිකා ඔබගේ උල්ට්‍රියාවේ සම්බන්ධීකරණ වැඩකටයුතු කරන සොහොයුරියගෙන් / සොහොයුරාගෙන් හෝ හයවන පාවුලු මධ්‍යස්ථානයේ තිබෙන කුර්සියෝ කාර්යාලයෙන් ලබා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

සම්මන්ත්‍රණයේ තේමාව "දයාවේ ධර්මදූතවරු වන්නට කැඳවීමක්" (ජුවාම් 15:12) මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය හැකි වන්නේ තුන්දින කුර්සියෝවට සම්පූර්ණයෙන් සහභාගි වූ අයට පමණක් බව කරුණාවෙන් සලකන්න.

## දේව කැඳවීම සොයා බැලීමේ ඥානකාන්තිය

සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ තාපස පූජක ජීවිතය තුළින් සුභාරංචියේ සතුට ලොවට ප්‍රකාශ කරන්නට සමිඳාණෝ ඔබව කැඳවන සේක.

අපො.ස. සා පෙළ හෝ උ. පෙළ විභාගයෙන් සමත් පසුව විවේක සුවෙන් සිටින තරුණයින් සඳහා විශේෂිතයි. වැඩි විස්තර සඳහා විමසන්න.

දේව කැඳවීම් අධ්‍යක්ෂ පියතුමා, මොන්ටෙෆානෝ ආරාමය, මහනුවර, 081 2223684, 0777902980, 0716898411
www.osbsrilanka.org

## කතෝලික පෞද්ගලික පාසල්වල ස්ථිර ගුරු සේවයට බඳවා ගැනීම සහ කතෝලික අධ්‍යාපනය හා ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව 2015

අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාසල්වල සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ගුරු භවතුන් ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා සහ 2015 වසරේ කතෝලික අධ්‍යාපන සහ ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවට තෝරා ගැනීමේ තරග විභාගය සඳහා කතෝලික පෞද්ගලික පාසල්වල කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු ගුරුභවතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා අදාල අයදුම්පත් සියළුම කතෝලික පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්ට ලබා දී ඇති අතර, එම අයදුම්පත සම්පූර්ණ කර, විදුහල්පති අත්සන ද සහිතව 2015 පෙබරවාරි මස 20 දිනට පෙර රු. 400.00 ක මුදලක් කොමර්ෂල් බැංකුවේ බොරැල්ල ශාඛාවේ අංක 1190020913 දරන ගිණුමට බැර කර අදාළ වවුචරය අයදුම්පතට අමුණා එවිය යුතුයි.

**අගරදගුරු පදවි අධ්‍යාපන අධ්‍යක්ෂ සහ**
**කතෝලික පාඨශාලා සාමාන්‍යාධිකාරී පියතුමා,**
**කොළඹ අගරදගුරු පදවිය**

## සගසුව දිනයි



හලාවත රදගුරු පදවියේ කහටවිල ශුද්ධවූ විනිප්‍රිඩා මුනිවරියගේ දෙව්මැඳුරේ මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස් අප්පුහාමි, කුරුණෑගල පදවි මන්ඩකොන්ඩාන මීසම් සේවක ලෙස කටයුතු කළ හා දැනට ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් ප්‍රාන්තයේ ලෙබ්රෙස්තාල්හි නිමල මරිය මවුන්ගේ දෙව්මැඳුරේ සේවය කරන ගරු රොජර් ක්‍රිස්ටෝපර් අප්පුහාමි පියතුමන්ගේ ආදරණීය මෑණියන් වූ නාලවලාන ශු. මිඛායෙල් මුනි දෙව්මැඳුරේ අන්නවි ධුරය දැරූ සග සැපත් කේ. ඩී. මිගෙල් අප්පුහාමි මහතාගේ ප්‍රිය භාර්යාව වූ ගෝනාවිල විලගෙදර පදිංචිව සිටි මදුරාවලගේ දෝන එව්ජිනාහාමි මහත්මිය පසුගියදා සග සුව දිනීය. ඇයගේ ආත්මයට සදා මොක්සුව පතමු.



කඳානේ පදිංචිව සිටි නිමල්කා පෙරේරා මහත්මියගේ ආදරණීය සැමියා වූ වැලන්ටයින් අත්තිඩිය මහතා පසුගියදා සග සැපත් විය.

ඒ මහතා කළුතර මීසම් සේවක ගරු සුරාන් අත්තිඩිය, කැපුන්ගොඩ දුන්ගල්පිටිය බොස්කෝ ආයතනයෝ චලන අත්තිඩිය පියතුමන්ගේ ආදරණීය පියාණන් වූ අතර අපෝස්තලික කාර්මෙල් පැවිදි නිකායේ ප්‍රාදේශාධිපතිනි මේරි සුනීතා පැවිදි සොයුරියගේ ද හපුගොඩ මාරි ස්ටෙලා අත්තිඩිය මහත්මියගේ සහ නැසීගිය ක්වින්ටින් අත්තිඩිය මහතාගේ ආදරණීය සොයුරා ද විය.

අවමගුල් මෙහෙය කඳාන සා. සෙබස්තියන් සිද්ධස්ථානයේදී ගරු පියවරුන්, පැවිදි සොයුරු සොයුරියන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි. වැලන්ටයින් අත්තිඩිය මහතාගේ ආත්මයට සදා මොක්සුව පතමු. **(කිංස්ලි කරුණාරත්න)**